77 වන කාණ්ඩය
9 වන කලාපය

සිකුරාදා
1968 මාර්තු 8

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

රාජපාක්ෂිකභාවය පිළිබඳ සහතිකය [තී. 1361]

නිවේදනය [තී. 1362]

බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පනත් කෙටුම්පත [තී. 1365] :
වාර්තාව පිළිගන්වන ලදී.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1365]

නියෝජ්‍ය කථානායක හා කාරක සභා සභාපති ඡන්දයෙන් තෝරා පත්කිරීම [තී. 1422]

නින්දගම් ඉඩම් පනත් කෙටුම්පත [තී. 1423] :
දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදී.

කල් තැබීමේ විවාදය [තී. 1526]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 77
இல. 9

வெள்ளிக்கிழமை
8 மார்ச் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

உறுதிப் பிரமாணம் [ப. 1361]

அறிவிப்பு [ப. 1362]

பௌத்த சிராவக்க தர்ம பிட மசோதா [1365] :
அறிக்கை சமர்ப்பிக்கப்பட்டது

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1365]

உப சபாநாயகரும் குழு உப அக்கிராசனரும் தெரிவு [ப. 1422]

நிந்தகமக் காணிகள் மசோதா [ப. 1423] :
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை [ப. 1526]

---

Volume 77
No. 9

Friday
8 March 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

AFFIRMATION [Col. 1361]

ANNOUNCEMENT [Col. 1362]

BUDDHA SRAVAKA DHARMAPITHAYA BILL [Col. 1365] :
Report presented

ORAL ANSWERS TO QUESTIONS [Col. 1365]

ELECTION OF DEPUTY SPEAKER AND CHAIRMAN OF COMMITTEE [Col. 1422]

NINDAGAMA LANDS BILL [Col. 1423] :
Second Reading—Debate adjourned

ADJOURNMENT MOTION [Col. 1526]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජපාක්ෂික භාවය පිළිබඳ සහතිකය

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

## *House of Representatives*

1968 මාර්තු 8 වන සිකුරාදා

வெள்ளிக்கிழமை, 8 மாச் 1968

*Friday, 8th March 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## රාජපාක්ෂික භාවය පිළිබඳ සහතිකය: මොහමඩ් ඉසදීන් මොහමඩ් මයා.

உறுதிப் பிரமாணம்: ஜனாப் இஸ்ஸதீன் முகம்மது

AFFIRMATION : MR. MOHAMED IZADEEN MOHAMED

මොහමඩ් ඉසදීන් මොහමඩ් මහතා (පත් කරන ලද මන්ත්‍රී) නීතියෙන් පනවා ඇති අන්දමට සහතිකය කර අත්සන් තැබුවේය; ඊට පසු මන්ත්‍රීන්ගේ නාම පුස්තකයේ අත්සන් කෙළේය.

ஜனாப் முகம்மது இஸ்ஸதீன் முகம்மது (நியமன அங்கத்தவர்) சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப் பிரமாணம் செய்து சபாபீடத்திலிருந்த புத்தகத்திற் கைச்சாத்திட்டார்.

*Mr. Mohamed Izadeen Mohamed (Appointed Member) made and subscribed the Affirmation required by Law; and signed the Book at the Table.*



නිවේදනය

## සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශය

மூதவையிலிருந்து வந்த செய்தி

MESSAGE FROM THE SENATE

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලැබුණු සන්දේශයක් දැන් ලේකම් විසින් කියවනවා ඇති.

පහත දැක්වෙන සන්දේශය ලේකම් විසින් කියවන ලදී.

செயலதிகாரி பின்வரும் செய்தியை வாசித்தார்.

*The Clerk read the following Message:*

මතු පළවන කෙටුම්පත් පනත් වලට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සංශෝධන නොමැතිව එකඟවී ඇත:

Animals (Amendment)

Buddhist Temporalities (Amendment)."

## නිවේදනය

அறிவிப்பு

ANNOUNCEMENT

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I have to acquaint the House that the Clerk has received two letters, one from Sir Razik Fareed, O.B.E., and the other from the Secretary to the Governor-General, which he will now read to the House.

පහත දැක්වෙන ලිපි ලේකම් විසින් කියවන ලදී.

செயலதிகாரி பின்வரும் செய்தியை வாசித்தார்.

*The Clerk read the following letters:*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිවේදනය

## ශ්‍රීමත් රසික් පරීඩ් ඕ. බී. ඊ., විසින් ඉල්ලා අස්වීම

ஸ்ரீமான் ருசிக் பரீது, ஓ.பி.ஈ., அவர்களின் ராஜிநாமா

**RESIGNATION OF SIR RAZK FAREED, O.B.E.**

"27, Fareed Place,
Colombo 4,
25th February, 1968.

The Clerk,
House of Representatives,
Colombo.

I hereby inform you that I resign my seat in the House of Representatives with effect from the 28th February, 1968.

Sgd. Razik Fareed."

II

## එම්. ඉසඩීන් මොහමඩ් මහතාගේ පත්වීම

ஜனாப் எம். இஸ்ஸெதீன் முகம்மது அவர்களது நியமனம்

**APPOINTMENT OF MR. M. IZADEEN MOHAMED**

"අග්‍රාණ්ඩුකාර කාර්යාලය

රජ වාසල, කොළඹ, ශ්‍රී ලංකාව,
1968 මාර්තු 2.

මහත්මයාණනි,

**නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පත්කරනු ලබන මන්ත්‍රී**

අග්‍රාණ්ඩුකාරතුමා, 1946 යේ හා 1947 තේ, ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 11 වැනි වගන්තියෙන් තමන් කෙරෙහි පැවරී ඇති බලතල අනුව, කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ, අංක 100/11 "ශාලිමාර්" හි, මොහමඩ් ඉසදීන් මොහමඩ් මහතා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු වශයෙන් 1968 මාර්තු 2 වැනි දින සිට පත් කළ බව, 1968 පෙබරවාරි 29 වැනි දින අංක සී. 272/65 දරන මගේ ලිපියට අමතරව, ඔබට දැනුම් දෙන ලෙස උතුමාණන් වහන්සේ විසින් මට අණ කරන ලදී.

2. ඉසදීන් මොහම්ඩ් මහතා වෙත ඒ අනුව අමන්ත්‍රිත පත්වීම් ලිපියේ පිටපතක් මෙහි බහා ඇත.

මෙයට කීකරු සේවක,

අත්සන් කළේ, ඒ. බී. ඇල්කඩුවේ,
ආග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

## PAPERS PRESENTED

Supplementary Estimate No. 7 of 1967-68.—[*The Hon. Jayewickreme.*]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

1967-68 අංක 8 දරණ පරිපූරක ඇස්තමේන්තුව.—[ගරු ආචාර්ය දහනායක.]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

1966 සඳහා ලංකා තේ ප්‍රචාරක මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාව. [ගරු හියු ප්‍රනාන්දු]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

(i) (171 වන අධිකාරය වන) ආහාර පාලන පනතේ 4 (1) වන වගන්තිය යටතේ පනවන ලද අංක 265 දරණ ආහාර පාලන නියෝගය ;

(ii) (171 වන අධිකාරය වන) ආහාර පාලන පනතේ 6 වන වගන්තිය යටතේ පනවන ලද නියෝගයක්.—[කෘෂිකර්ම හා ආහාර ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා.]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

ද්විත්ව අයබදු ගැනීම වැළැක්වීමද, ආදායම පිළිබඳ වූ අයබදු නොගෙවා මගහැරීම වැළැක්වීමද සඳහා ලංකාණ්ඩුවත් ජපන් රටේ ආණ්ඩුවත් අතර ඇති කර ගත්තා ගිවිසුම.—[ගරු වන්නිනායක.]

203 වැනි අධිකාරය වන මෝටර් වාහන පනතේ 143 1 සහ 237 වැනි වගන්ති යටතේ පනවන ලද නියෝගයක්.—[ගරු හුරුල්ලේ.]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## වාර්තා පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்

## REPORTS PRESENTED

### බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පනත් කෙටුම්පත

பௌத்த சிராவக தர்மபீட மசோதா

### THE BUDDHA SRAVAKA DHARMAPITHAYA BILL

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமினி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

"Buddha Sravaka Dharmapithaya Bill" නමැති කෙටුම්පත් පනත පිළිබඳ "බී" ස්ථාවර කාරක සභාවේ වාර්තාව වැඩ කටයුතු පිළිබඳ කාර්ය සටහන් සමග එම කාරක සභාවේ සභාපති වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

REPORT

The Committee have considered the Buddha Sravaka Dharmapithaya Bill and have agreed to it as amended in the attached reprint.

කෙටුම්පත් පනත "බී" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි, 1968 මාර්තු 9 වන සෙනසුරාදා සලකා බලනු ලැබේ.

நிலையற் குழு "பீ" யால் அறிக்கை செய்யப்பட்டவாறு மசோதா 1968 மார்ச் 9 ஆம் தேதி சனிக்கிழமை ஆலோசிக்கப்படும்.

*Bill, as reported by Standing Committee "B" to be considered upon Saturday, 9th March* 1968.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### ආධාර පාසල් ගුරුවරුන්ට රජයේ පත්වීම්

உதவி பெறும் பாடசாலை ஆசிரியர்களுக்கு அரசாங்க நியமனங்கள்

### GOVERNMENT APPOINTMENTS FOR ASSISTED SCHOOL TEACHERS

2. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ආධාර ලබන පාසල් විශේෂ විධි විධාන පනත නිසා රජයේ පාසැල්වල සේවයට පත් වූ ගුරුවරුන් බොහෝ දෙනෙකුට රජයේ පත්වීම් ලැබී නැති බව එතුමා දන්නවාද? (ආ) එබඳු ගුරුවරුන්ට 1968.1.1 දිනට පෙර පත්වීම් ලබාදීම සඳහා විධි විධාන යෙදීමට එතුමා තම නිළධාරීන්ට නියෝග කරනවාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) உதவிபெறும் பாடசாலைகள் விசேட ஏற்பாட்டு அதிகாரச் சட்டத்தின் பேரில் அரசாங்கப் பாடசாலைகளில் சேவைக்குச் சேர்ந்த அநேக ஆசிரியர்கள் அரசாங்க நியமனங்களைப் பெற்றுக்கொள்ளாமல் இருக்கிறார்கள் என்பதை அவர் அறிவாரா? (ஆ) அத்தகைய ஆசிரியர்கள் 1.1.1968 க்கு முன் அந்நியமனங்களைப் பெற்றுக்கொள்ளத்தக்க வகையில் நடவடிக்கை எடுக்குமாறு அவர் தமது உத்தியோகத்தர்களைப் பணிப்பாரா? (இ) இல்லையெனின் ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that many teachers who entered service in government schools on account of the Assisted Schools Special Provisions Act have not received government appointments? (*b*) Will he direct his officers to take steps to obtain appointments for such teachers before 1.1.1968? (*c*) If not, why?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

(අ) නැත. (ආ) රජයට පවරා ගනු ලැබූ ආධාර ලබන පාසල්වල සේවය කළ, රජය යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ඇති සියලුම ගුරුවරුන්ට රජය යටතේ පත්වීම් ලැබී ඇත. (ඉ) පැන නොනගී.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 3.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும், பாதுகாப்பு வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

Certain data have to be collected for the purpose of answering this Question and I want time for it.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**ඩී. සී. ද එස්. වීරරත්න මහතා, තංගල්ලේ හිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී**

*திரு. டீ. ஸி. டி. எஸ். வீரரத்ன, சுகாதார மருத்துவ அதிகாரி, தங்காலை*

MR. D. C. DE S. WEERARATNE, RETIRED M. O. H., TANGALLE

5. තුඩාවේ මයා.

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) තංගල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා (එම්.ඕ.එච්.) වශයෙන් සේවය කළ ඩී. සී. ද ඈස්. වීරරත්න මහතා 1960.4.1 වැනි දින සේවයෙන් ඉල්ලා අස්වූ බවත් එම අවස්ථාවේදී, 1960 මාර්තු මාසයේ වැටුප නොගෙවා නැවත් වූ බවත් එතුමා දන්නවාද ? (ආ) අවුරුදු 7ක් ගෙවී යන තුරුත් මෙම වැටුප් මුදල නොගෙවන ලද්දේ මන්දැයි එතුමා ප්‍රකාශ කරනවාද? (ඉ) වහාම මෙම වැටුප් මුදල ගෙවීමට එතුමා ක්‍රියා කරනවාද ? (ඊ) නො එසේ නම්, ඒ මන්ද ?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா : (அ) தங்காலை சுகாதார மருத்துவ அதிகாரியாகச் சேவை செய்த திரு. டீ. ஸி. த எஸ். வீரரத்ன அவர்கள் 1.4.1960 இல் சேவையிலிருந்து விலகியதையும், அச்சந்தர்ப்பத்தில் 1960 மார்ச் மாதச் சம்பளத்தைக் கொடுக்காமல் நிறுத்தியதையும் அவர் அறிவாரா ? (ஆ) ஏழு ஆண்டுகள் கழிந்தும் இச்சம்பளத்தைக் கொடுக்காததேன் என்று அவர் கூறுவாரா ? (இ) இச்சம்பளத்தை உடனடியாகக் கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா ? (ஈ) அன்றேல், ஏன் ?*

asked the Minister of Health : (*a*) Is he aware that Mr. D. C. de S. Weeraratne, who was the Medical Officer of Health, Tangalle, resigned from service on 1.4.1960 and that thereupon his salary for March 1960 was withheld ? (*b*) Will he state why this salary has not been paid in spite of the fact that nearly seven years have elapsed ? (*c*) Will he take steps to pay this salary without delay ? (*d*) If not, why ?

**විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

(අ) එසේය. (ආ) රු. 2,245/14 ක් වටිනා කිරි ආහාර, ඖෂධ වර්ග සහ වෙනත් දේ අඩුවීම සම්බන්ධයෙන් තංගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයයේ ලිපිකරුට විරුද්ධව තිබූ චෝදනා විභාගයේ කටයුතු නිමාවට පත් කරන ලද්දේ 1967 දී ය. මේ චෝදනා විභාගයේ දී, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ නොසැලකිල්ලද එළිදරවු විය. (ඉ) අඩු වී ඇති බඩුවල වටිනාකමින් කොටසක් වෛද්‍ය වීරරත්න මහතාගෙන් අයකරගත යුතුද යන්න සෝදිසියට භාජන වී තිබේ. මේ සෝදිසිය නිමාවට පත්වූ පසු වැටුප් ගෙවීම පිළිබඳ කටයුතු නිමවනු ඇත. මෙය ඉතා ඉක්මණින් කරනු ඇත. (ඊ) පැන නොනඟී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. මේ සම්බන්ධයෙන් දැනට අවුරුදු හතක් අටක් පමණ ගත වී තිබෙන නිසා මේ කටයුත්ත ඉක්මණින් අවසානයකට පත් කිරීමට කටයුතු කරන වාද කියා දැන ගන්නට කැමතියි.

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

1967 දී වාතීාව ලැබී තිබෙන නිසා ඉක්මනින්ම අවසාන කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 6.

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. பி. வெலகெதர—தேசிய மய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*
(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට මාසයක් කල් වුවමනා කරනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## රජයේ ආයතනවල දෙමළ භාෂාව භාවිතය

*அரசாங்க தாபனங்களில் தமிழ் உபயோகம்*

## USE OF TAMIL IN GOVERNMENT INSTITUTIONS

9. **කා. පො. ඉරත්තිනම් මයා.** (කිලිනොච්චි)
*(திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி)*
(Mr. K. P. Ratnam—Kilinochchi)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උතුරු හා නැගෙනහිර පළාත්වල රජයේ කාර්යාල, බැංකු හා සංයුක්ත මණ්ඩලවල පරිපාලන කටයුතු මුළුමනින්ම දෙමළ භාෂාවෙනුත් නොකෙරෙන බවත් මෙය දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත යටතේ 1966 දී සම්පාදිත රෙගුලාසිවලට පටහැනි බවත් එතුමා දන්නවාද? (ආ) දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත යටතේ 1966 දී සම්පාදිත රෙගුලාසි ක්‍රියාත්මක නොකෙරෙන්නා වූ රජයේ කාර්යාල, බැංකු හා සංයුක්ත මණ්ඩලවල වග කිවයුතු නිලධාරීන්ට විරුද්ධව එතුමා විනයානුකූලව ක්‍රියා කරනවාද? නොඑසේ නම් මන්ද? (ඉ) මෙකී ආයතනවල මුළු පරිපාලන කාර්යයන්ම දෙමළ භාෂාවෙන්ද කිරීම සහතික වනු පිණිස අවශ්‍ය පියවර මාසයක් තුළ දී එතුමා ගන්නවාද? නො එසේ නම් මන්ද? (ඊ) උතුරු හා නැගෙනහිර පළාත්වල රජයේ කාර්යාල, බැංකු හා සංයුක්ත මණ්ඩලවල හැම තරාතිරමකම නිලධාරීන් අතුරෙන් (i) කී දෙනෙකුට දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට නොහැකිද? (ii) කී දෙනෙකුට 8 වැනි පන්තියේ දෙමළ භාෂා ඥානයක් නැත්තේද? (iii) කී දෙනෙකුට දෙමළ භාෂාවෙන් ස්වකීය රාජකාරි කිරීමට නොහැකිද? (උ) උතුරු හා නැගෙනහිර පළාත්වල රජයේ කාර්යාල, බැංකු හා සංයුක්ත මණ්ඩලවල දෙමළෙන්ද වැඩ කිරීමට අපොහොසත් නිලධාරීන් දැන් දරන තනතුරුවලට දෙමළෙන් වැඩ කළ හැකි අය පත් කිරීමට එතුමා වහාම ක්‍රියා කරනවාද? නො එසේ නම් මන්ද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) வடக்கு, கிழக்கு மாகாணங்களில் உள்ள அரசாங்க அலுவலகங்களிலும், வங்கிகள், கூட்டுத் தாபனங்கள் முதலியவற்றிலும் தமிழிலும் முழு நிருவாகமும் நடைபெறவில்லை என்பதையும், இந்நிலைமை தமிழ்மொழி (விசேட ஏற்பாடுகள்) பிரமாணங்கள் 1966 க்கு மாறானது என்பதையும் அவர் அறிவாரா? (ஆ) வடக்கு, கிழக்கு மாகாணங்களில் தமிழ்மொழி (விசேட ஏற்பாடுகள்) பிரமாணங்கள் 1966 ஐ நடைமுறைப்படுத்தாத அரசாங்க அலுவலகங்கள், வங்கிகள், கூட்டுத்தாபனங்கள் முதலியவற்றின் பொறுப்புத்தியோகத்தர்கள் மீது அவர் ஒழுங்கு நடவடிக்கை எடுப்பாரா? அன்றேல் ஏன்? (இ) இந்நிலையங்கள் யாவும் தமிழிலும் முழு நிருவாகத்தையும் நடத்த ஒரு [illegible] அவர் வேண்டிய நடவடிக்கை எடுட்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කො. පො ඉරත්තිනම් මයා.]

பாரா? அன்றேல் ஏன்? (ஈ) வடக்கு, கிழக்கு மாகாணங்களில் உள்ள அரசாங்க அலுவலகங்கள், வங்கிகள், கூட்டுத்தாபனங்கள் என்பவற்றில் உள்ள எல்லாத் தரத்தையும் சேர்ந்த உத்தியோகத்தர்களிலே (i) தமிழ் எழுத வாசிக்கத் தெரியாதவர்கள், (ii) தமிழிலே எட்டாம் வகுப்பு அறிவு இல்லாதவர்கள். (iii) தமிழிலே தங்கள் உத்தியோகக் கடமைகளை ஆற்ற முடியாதவர்கள் தனித்தனி எத்தனைபேர்? (உ) வடக்கு, கிழக்கு மாகாணங்களிலே உள்ள அரசாங்க அலுவலகங்கள், வங்கிகள், கூட்டுத்தாபனங்கள் முதலியவற்றிலே கடமையாற்றுபவர்களிலே தமிழிலும் கடமையாற்ற முடியாதவர்களின் பதவிகளுக்குத் தமிழிலே கடமையாற்றத்தக்கவர்களை நியமிக்க உடனே நடவடிக்கை எடுப்பாரா? அன்றேல் ஏன்?

asked the Minister of Finance: (*a*) Is he aware that the entire administrative work of the government offices, banks and corporations in the Northern and Eastern Provinces is not being done in Tamil also and that this is contrary to the regulations of 1966 under the Tamil Language (Special Provisions) Act? (*b*) Will he take disciplinary action against those responsible officers of the government offices, banks and corporations where the regulations of 1966 under the Tamil Language (Special Provisions) Act are not being implemented; and if not, why? (*c*) Will he take necessary action within a month to ensure that these institutions carry out the entire administrative work in Tamil also; and if not, why? (*d*) Of the officers of all designations in government offices, banks and corporations in the Northern and Eastern Provinces, how many (i) cannot read and write Tamil; (ii) do not possess an 8th standard knowledge in Tamil; and (iii) cannot perform their duties in Tamil? (*e*) Will he take immediate action to appoint those capable of working in Tamil to posts now held by those unable to work in Tamil also, in government offices, banks and corporations in the Northern and Eastern Provinces; and if not, why?

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(*a*) All government and public business in government offices, banks and corporations in the Northern and Eastern Provinces is being done as far as possible in Tamil also. Time is needed to train and deploy officers bilingually proficient to carry out all such work in Tamil without prejudice to the operation of the Official Language Act. (*b*) and (*c*) Do not arise in view of answer to (*a*) above. (*d*) This information is not available. Some time will be needed to gather it. (*e*) Action is being taken to appoint officers competent in both languages.

## ප්‍රවාහන ඇමති ගරු ඊ. එල්. බී. හුරුල්ලෙ: ගමන් ගාස්තු

போக்குவரத்து அமைச்சர் கௌரவ ஈ. எல். பி. ஹுருல்ல : பிரயாணம்

## THE HON. E. L. B. HURULLE, MINISTER OF COMMUNICATIONS: TRAVELLING

11. **කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)

(திரு. கே. பி. ரத்னயக்க—அனுராதபுரம்)

(Mr. K. B. Ratnayake—Anuradhapura)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මුදල් ඇමතිතුමා විසින් කරන ලද ප්‍රකාශය අනුව (67.10.21 හැන්සාඩ් වාර්තාව 1213 පිට) ප්‍රවාහන ඇමති ගරු ඊ. ඇල්. බී. හුරුල්ලෙ මහතා ඔහු විසින් කරන ලද ගමන් බිමන් සඳහා පහත සඳහන් ගමන් ගාස්තු අයකරගෙන ඇති බැව් එතුමා දන්නවාද? (i) රු. 12,414 ශත 29 යි. 1965 මැයි මාසයේ සිට 1967 ජූනි. දක්වා. (ii) රු. 571 ශත 25 යි. 1967 අප්‍රේල්. (iii) රු. 232 ශත 50 යි. 1967 මැයි (iv) රු. 315 ශත 60 යි. 1967 ජූනි (ආ) ඉහත සඳහන් පිළිතුරු අනුව, ගරු ඊ. ඇල්. බී. හුරුල්ලේ මහතා 1967 අප්‍රේල්, මැයි සහ ජූනි මාස වෙනුවෙන් ගමන් ගාස්තු අයකර ගෙන ඇති නමුදු, මෙම කාලසීමාව තුළදී ඔහු විසින් ගමන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බිමන් සඳහා පාවිච්චි කොට ඇත්තේ තම තමාගේ පුද්ගලික මෝටර් රථය නොව රජයේ රථවාහන පමණක් බව එතුමා දන්නවාද? (ඉ) එසේ නම්, මෙම කාලය සඳහා දීමනා ගෙවා ඇත්තේ මන්ද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா : (அ) அவர் கொடுத்திருக்கும் அறிக்கைப்படி (21.10.67 ஹன்சாட் பத்தி 1213) போக்குவரத்து அமைச்சர் கௌரவ ஈ. எல். பீ. ஹுருல்ல தாம் செய்த பயணங்களுக்குப் பின்வரும் படி பெற்றுள்ளார் என்பதை அறிவாரா? :—(i) ரூபா 12,414.29 1965 மே முதல் 1967 யூன் வரை. (ii) ரூபா 571.25 1967 ஏப்பிரில் மாதத்திற்கு. (iii) ரூபா 232.50 1967 மே மாதத்திற்கு. (iv) ரூபா 315.60 1967 யூன் மாதத்திற்கு? (ஆ) இந்த விடையின்படி கௌரவ ஈ. எல். பீ. ஹுருல்ல 1967 ஏப்பிரில், மே, யூன் மாதங்களுக்கு தம் சொந்த வாகனத்தி லல்லாது அரசாங்க வாகனங்களிலேயே பயணஞ் செய்தார் எனினும் பயணச் செலவுகள் பெற்றுள்ளாரென்பதை அவர் அறிவாரா? (இ) அங்ஙனமாயின், இக்காலத்திற்கென ஏன் படிகள் கொடுக்கப்பட்டன?*

asked the Minister of Finance: (*a*) Is he aware that according to the statement furnished by him (vide Hansard of 21.10.67, Col. 1213) the Hon. E. L. B. Hurulle, Minister of Communications, has drawn the following allowances for travelling done by him: (i) Rs. 12,414,29 from May, 1965 to June, 1967; (ii) Rs. 571.25 in April, 1967; (iii) Rs. 232.50 in May, 1967; (*b*) Is he aware that according to this reply the Hon. E. L. B. Hurulle has drawn travelling expenses for the months April, May and June 1967, even though during this period travelling has been done by him only in government vehicles and not in his private car? (c) If so, why were allowances paid for this period.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

(අ) එසේය. (ආ) 1967 වර්ෂයේ අප්‍රේල්, මැයි, ජූනි යන මාසවලදී පෞද්ගලික මෝටර් කාරයෙන් මෙන්ම රජයේ වාහනයෙන්ද ගමන් කර ඇති අතර, පෞද්ගලික වාහනයෙන් ගිය ගමන් පිළිබඳව දිය යුතු විස්තර ප්‍රමාදයකින් අතහැරී ගොස් ඇත. මේ කාල පරිච්ඡේදය සම්බන්ධ නිවැරදි විස්තර මෙසේය :—

(i) රාජකාරි ගමන් සඳහා පාවිච්චි කළ රජයේ වාහනයේ හෝ වාහනවල ලියාපදිංචි අංකය ... 4 ශ්‍රී 9033
(ii) අයිති පෞද්ගලික වාහනයේ හෝ වාහනවල ලියාපදිංචි අංකය ... ... 1 ශ්‍රී 8198
2 ශ්‍රී 8964 (මේ වාහනය දැන් විකුණා ඇත)

(iii) රජයේ වාහනයෙන් මාස්පතා ගමන් කළ සැතපුම් ගණන :

| වර්ෂය | | මාසය | | සැතපුම් ගණන |
|---|---|---|---|---|
| 1967 | ... | අප්‍රියෙල් | ... | — |
| 1967 | ... | මැයි | ... | 396 |
| 1967 | ... | ජූනි | ... | 1,165 |

(iv) පෞද්ගලික වාහනයෙන් මාස්පතා ගමන් කළ සැතපුම් ගණන :

| | | | | |
|---|---|---|---|---|
| 1967 | ... | අප්‍රියෙල් | ... | 901 |
| 1967 | ... | මැයි | ... | 320 |
| 1967 | ... | ජූනි | ... | 300 |

(v) ගමන් වියදම් වශයෙන් මාස්පතා ලබාගත් මුදල :

| | | | |
|---|---|---|---|
| 1967 | ... | අප්‍රියෙල් | ... රු. 571.55 |
| 1967 | ... | මැයි | ... රු. 232.50 |
| 1967 | ... | ජූනි | ... රු. 315.60 |

(ඉ) ඉහත "ආ" යටතේදී ඇති පිළිතුරු අනුව මේ ප්‍රශ්නය පැන නොනගී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවි හමුදාව

காணிப் பட்டாளம்

LAND ARMY

12. රත්නායක මයා.

(திரு. ரத்னுயக்க)

(Mr. Ratnayake)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: මෙතෙක් පිහිටුවා ඇති ගොවි හමුදා කඳවුරු ගණන, ඒවා පිහිටුවා ඇති ස්ථාන සහ ඒවා ආරම්භ කළ දිනයන් එතුමා සඳහන් කරනවාද? (ආ) එක් එක් කඳවුරේ සිටින, (i) භට සින් සංඛ්‍යාව, (ii) නිලධාරි සංඛ්‍යාව කොපමණද? (ඉ) එක් එක් කඳවුර නඩත්තු කිරීමට රජයට මසකට කොප මණ වියදම් වේද? (ඊ) වැඩ ආරම්භ කළ දිනයේ සිට මාස්පතා එක් එක් කණ්ඩායම කරන ලද වැඩ මොනවාද? ප්‍රමාණය කොතෙක්ද? (උ) ගොවි හමුදාව වෙනුවෙන් මෙතෙක් වියදම් කර ඇති මුළු ගණන කොපමණද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினு: (அ) இதுவரையில் அமைக்கப் பட்டுள்ள காணிப்பட்டாள முகாங்கள் எத்தனை என்பதையும், அவை எங்கெங்கு அமைக் கப்பட்டுள்ளன என்பதையும், அவை எப் பொழுது ஆரம்பிக்கப்பட்டன என்பதையும் அவர் தெரிவிப்பாரா? (ஆ) ஒவ்வொரு முகாமிலு முள்ளவர்களின் எண்ணிக்கை என்ன: (i) சிப்பாய்கள் எத்தனை பேர்; (ii) அலுவலர்கள் எத்தனை பேர். (இ) ஒவ்வொரு முகாமையும் நடத்துவதற்கு அரசாங்கத்திற்கு மாதம் எவ்வளவு செலவு ஏற்படுகிறது? (ஈ) ஆரம்பித்தது முதல் இன்றுவரை ஒவ்வோர் அணியும் மாதந்தோறும் செய்துள்ள வேலை யின் தன்மையும் அளவும் யாவை? (உ) இது வரை காணிப்பட்டாளத்தில் செலவாகிய மொத்தத் தொகையென்ன?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Will he state the number of Land Army Camps set up so far, where they are located and the date of commencement? (*b*) What is the strength of each camp—(i) Number of men; (ii) Number of officers. (*c*) How much does it cost the Government per month to maintain each camp? (*d*) What is the nature and quantity of work done by each unit monthly from the commencement to date? (*e*) What is the total amount spent on the Land Army so far.

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. சி. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி)

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

As it is a long Answer, may I have your permission to table it?

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Yes. The Answer is tabled.

රත්නායක මයා.

(திரு. ரத்னுயக்க)

(Mr. Ratnayake)

පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවාද, මහවිලච්චිය ජනපදයේ ඇති කළ——

ගරු ඩඩ්ලි සේනානායක

(கௌரவ டட்ளி சேனுநாயக்க)

(The Hon. Dudley Senanayake)

Can a supplementary question be asked without the Member knowing the terms of the Answer? පිළිතුර නැතිව අතුරු ප්‍රශ්න අහන්නේ කොහොමද?

රත්නායක මයා.

(திரு. ரத்னுயக்க)

(Mr. Ratnayake)

එහෙම නම් පිළිතුර කියවන්න. මම ඒකෙන් ප්‍රශ්න අහන්නම්.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

A supplementary question should arise out of the Answer and not be based on something outside.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රත්නායක මයා.**
(*திரு. ரத்ஞயக்க*)
(Mr. Ratnayake)

මා කාටවත් දොස් නඟන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මා අහන්නට බලාපොරොත්තු වන්නේ මේ ගොවි හමුදාව සම්බන්ධව මගේ කොට්ඨාශයේ පැන නැඟී ඇති සිද්ධියක් පිළිබඳවයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
(*கௌரவ டட்ளி சேனநாயக்க*)
(The Hon. Dudley Senanayake)

But it has to be a supplementary question.

වාචික පිළිතුරු

**රත්නායක මයා.**
(*திரு. ரத்ஞயக்க*)
(Mr. Ratnayake)

මිනිස්සු ගහගෙන, වෙඩි තබාගෙන ඉස්පිරිතාලයේ ඉන්නවා.

**සෙනෙවිරත්න මයා.**
(*திரு. செனெவிரத்ன*)
(Mr. Seneviratne)

The hon. Member can ask it at Adjournment time.—[*Interruption.*]

**කථානායකතුමා**
(*சபாநாயகர் அவர்கள்*)
(Mr. Speaker)

The hon. Member can raise it at Adjournment time. I shall give him an opportunity.

**සභාමේසය මත තබන ලද පිළිතුර මෙසේ යි:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு:*

*The Answer tabled is as follows:*

(අ)

**1968 ජනවාරි මස 12 වැනි දිනට පිහිටුවා ඇති ගොවි හමුද කඳවුරු ගණන, ඒවා පිහිටුවා ඇති ස්ථාන සහ ඒවා ආරම්භ කළ දිනයන්**

| | කඳවුරේ නම | ආරම්භ කළ දිනය | දිස්ත්‍රික්කය | ඡන්ද කොට්ඨාශය | ලිපිනය |
|---|---|---|---|---|---|
| 1. | අත්තරගල්ල | 30. 3.67 | කුරුණෑගල | යාපහුව | ගොවි හමුද කඳවුර, අත්තරගල්ල, අඹන්පොල |
| 2. | සවරංගල | 20. 4.67 | කුරුණෑගල | නිකවැරටිය | ගොවි හමුද කඳවුර, සවරංගල, මහගිරිල්ල |
| 3. | තඹබෝව | 18. 5.67 | පුත්තලම | නිකවැරටිය | ගොවි හමුද කඳවුර, තඹබෝව |
| 4. | දේවගිරිය | 19. 5.67 | මාතලේ | ලග්ගල | ගොවි හමුද කඳවුර දේවගිරිය, විල්ගමුව |
| 5. | රාජාංගනය | 8. 6.67 | අනුරාධපුරය | අනුරාධපුරය | ගොවි හමුද කඳවුර, සෝලේවැව, වරාවැව, ගල්ගමුව, හරහා |
| 6. | ලුනුවැව | 9. 7.67 | අනුරාධපුරය | කලාවැව | ගොවි හමුද කඳවුර, ලුනුවැව, තඹුත්තේගම |
| 7. | මහකිවුල්කඩ | 13. 7.67 | අනුරාධපුරය | හොරොව්පතාන | ගොවි හමුද කඳවුර, මහකිවුල්කඩ, හොරොව්පතාන |
| 8. | කපුගොල්ලෑව | 23. 7.67 | අනුරාධපුරය | හොරොව්පතාන | ගොවි හමුද කඳවුර, කපුගොල්ලෑව, හොරොව්පතාන |
| 9. | මොරවැව | 20. 9.67 | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | ගොවි හමුද කඳවුර, මොරවැව, පන්කුලම |
| 10. | මහවිලච්චිය | 25. 9.67 | අනුරාධපුරය | අනුරාධපුරය | ගොවි හමුද කඳවුර, මහවිලච්චිය ජේමඩුව |
| 11. | ඇල්හේන | 30. 9.67 | බදුල්ල | මහියංගනය | ගොවි හමුද කඳවුර, ඇල්හේන, ඇකිරියන් කුඹුර |
| 12. | වාන්ඇල | 27.10.67 | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | ගොවි හමුද කඳවුර, වාන්ඇල, කන්තලේ |
| 13. | පදවිය | 22.11.67 | අනුරාධපුරය | මැදවච්චිය | ගොවි හමුද කඳවුර, පදවිය, බෝගහවැව, මැදවච්චිය හරහා. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| කඳවුරේ නම | කඳවුරේ සිටින සේවක මහතුන් ගණන | කඳවුරේ සිටින නිලධාරීන්ගේ ගණන |
|---|---|---|
| 1. අත්තරගල්ල ... ... ... | 312 ... | 17 |
| 2. සවරංගල ... ... ... | 112 ... | 10 |
| 3. තබ්බෝව ... ... ... | 291 ... | 13 |
| 4. දේවගිරිය ... ... ... | 248 ... | 8 |
| 5. රාජාංගනය ... ... ... | 329 ... | 9 |
| 6. ලූනුවැව ... ... ... | 303 ... | 12 |
| 7. මහකිවුල්කඩ ... ... ... | 129 ... | 6 |
| 8. කපුගොල්ලෑව ... ... ... | 144 ... | 5 |
| 9. මොරවැව ... ... ... | 301 ... | 8 |
| 10. මහවිලච්චිය ... ... ... | 121 ... | 5 |
| 11. ඇල්හේන ... ... ... | 100 ... | 3 |
| 12. වාන් ඇල ... ... ... | 241 ... | 4 |
| 13. පදවිය ... ... ... | 179 ... | 7 |

(ඉ) ගොවි හමුදා කඳවුරු ප්‍රමාණයන් වශයෙන් කොටස් දෙකක් තිබේ. ඒවා නම්, නිලධාරි සහ සේවකයින් 345 දෙනෙකු ගෙන් සමන්විත වූ විශාල කඳවුරත්, නිලධාරීන් සහ සේවකයින් 160 දෙනෙකු ගෙන් සමන්විත කුඩා කඳවුරත් ය.

එම එක් එක් කඳවුරු නඩත්තු කිරීමට මසකට වියදම් වන මුදල වෙනස් වේ. සාමාන්‍යයෙන් විශාල කඳවුරකට මසකට රු. 36,000 ක් පමණද, කුඩා කඳවුරකට මසකට රු. 15,300 ක් පමණද වියදම් වේ. මෙම මුදලට පඩි, ආහාර වියදම් හා ප්‍රවාහණ ගාස්තු ඇතුළත් ය.

(ඊ) 1967—අප්‍රේල්

| කඳවුරේ නම | වැඩ විස්තරය | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| 1. අත්තරගල්ල ... | මී ඔය ව්‍යාපාරය වැඩි දියුණු කිරීම ... | පස් වැඩ | කියුබ් | 2,660.0 |
| | | කැලෑ එළි කිරීම | දම්. | 13.0 |
| | | බොරළු කැපීම | කියුබ් | 268.0 |
| | | බැම්ම සුද්ධ කිරීම | වර්ග | 950.0 |
| | | පිඩැලි ඇල්ලීම | වර්ග | 178.0 |

1967—මැයි

| කඳවුරේ නම | වැඩ විස්තරය | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| 1. අත්තරගල්ල ... | මී ඔය ව්‍යාපාරය වැඩිදියුනු කිරීම ... | පස් වැඩ | කියුබ් | 2,241.0 |
| | | මඩ ඉවත් කිරීම | කියුබ් | 342.0 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 252.0 |
| | | ගල් කැඩීම | කියුබ් | 156.0 |
| 2. සවරංගල ... | සවරංගල වැව ප්‍රතිසංස්කරණය කිරීම ... | පස්වැඩ | කියුබ් | 1,656.0 |
| 3. තබ්බෝව ... | තබ්බෝව දකුණුඇල ඉවුර පුළුල්කිරීම ... | කැලෑ එළිකිරීම | අක්කර | 12.85 |
| 4. දේවගිරිය ... | මිනිපේ යෝධ ඇල පුළුල් කිරීමේ ව්‍යාපාරය ... | පස් වැඩ | කියුබ් | 253.0 |

1967—ජූනි

| කඳවුරේ නම | වැඩ විස්තර | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| 1. අත්තරගල්ල ... | මිඔය ව්‍යාපාරය වැඩිදියුණු කිරීම ... | පස් වැඩ | කියුබ් | 1,705.0 |
| | | මඩ ඉවත් කිරීම | කියුබ් | 777.0 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 419.0 |
| | | කොන්ක්‍රීට් | කියුබ් | 12.0 |
| | | පාරට බොරළු දැමීම | කියුබ් | 27.0 |
| | | වාන ඇල්ලීම | | 390.0 |
| | | කැලෑ එළිකිරීම | වර්ග | 2.5 |
| | වලක් සහිත කුණු ඇළක් කැපීම ... | | | 1.0 |
| 2. සවරංගල ... | සවරංගල වැව ප්‍රතිසංස්කරණය කිරීම ... | පස් වැඩ | කියුබ් | 1,116.0 |
| 3. තබ්බෝව ... | තබ්බෝව දකුණු ඇළ ඉවුර පුළුල්කිරීම ... | කැලෑ එළිකිරීම | අක්කර | 13.0 |
| | | පස් වැඩ | කියුබ් | 700.0 |
| 4. දේවගිරිය ... | මිනිපේ යෝධඇළ පුළුල්කිරීමේ ව්‍යාපාරය | පස්වැඩ | කියුබ් | 1061,0 |
| 5. රාජාංගනය ... | යායවල් 3, 4, 5, සහ 6 යේ කෙත් ඇලවල් සහ අතුරු ඇළවල් කැපීම | පස් වැඩ | කියුබ් | 900.0 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාර්ෂික පිළිතුරු

**1967—ජූලි**

| කඳවුරේ නම | වැඩ විස්තර | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| 1. අත්තරගල්ල ... | මී ඔය ව්‍යාපාරය වැඩිදියුණු කිරීම ... | පස් වැඩ | කියුබ් | 1,831.0 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 417.0 |
| | | කොන්ක්‍රීට් | කියුබ් | 15.67 |
| | අඩි 10ක් වට ප්‍රමාණය ඇති අඩි 25ක් ගැඹුර ඇති ළිඳක් කැපීම | | | 1 |
| 2. සවරංගල ... | සවරංගල වැව ප්‍රතිසංස්කරණය කිරීම ... | පස් වැඩ | කියුබ් | 1,500.0 |
| | වටලීවලින් සහ පොල්අතුවලින් ගරාජයක් තැනීම (අඩි 75 × 25) | | | 1 |
| | වඩුමඩුවක් තැනීම (16′ × 11′) ... | | | 1 |
| 3. තබ්බෝව ... | තබ්බෝව දකුණු ඇල ඉවුර පුළුල් කිරීම ... | කැලෑ එළිකිරීම | අක්කර | 13.15 |
| | | පස් වැඩ | කියුබ් | 1,407.0 |
| | අඩි 10ක වටප්‍රමාණය ඇති අඩි 30ක් ගැඹුර ඇති ළිඳක් තැනීම | | | 1 |
| 4. දේවගිරිය ... | මිනිපේ යෝධ ඇල පුළුල් කිරීමේ ව්‍යාපාරය | පස් වැඩ | කියුබ් | 648.0 |
| | වාඩියේ පොල්අතු බැඳීම ... | | | 4 |
| | කෑම කන කාමර ... ... | | | 1 |
| | ගබඩා සහ අධිකාරි නිවාසය | | | |
| | අවන්හලේ බිම අළුත්වැඩියා කිරීම | | | |
| | වැසිකිලිවල සිමෙන්ති දැමීම හැර වෙනත් අළුත්වැඩියා කිරීම් | | | 16.0 |
| 5. රාජාංගනය ... | යායවල් 3, 4, 5 සහ 6යේ කෙත් ඇලවල් සහ අතුරු ඇලවල් කැපීම | ජූලි මාසයේ පස් වැඩ සහ කැලෑ එළි කිරීමේ මැණුම් අවසාන නැත. | | |
| | අඩි 100ක් දිග සහ අඩි 20ක් පළල සේවක නිවාස ඉදිකිරීම | | | 1.0 |
| | අඩි 30ක් දිග අඩි 12ක් පළල මඩුවක්, වඩුවන් සහ කම්මල්කරුවන් සඳහා ඉදිකිරීම | | | 1.0 |
| 6. ලුනුවැව ... | ලුනුවැව අළුත්වැඩියා කිරීම ... | | කියුබ් | 800.0 |
| | අඩි 6ක් දිග අඩි 6ක් පළල මඩුවක් වතුර උණුකිරීම සඳහා ඉදිකිරීම | | | 1.0 |
| | කුස්සියේ ඇති වතුර ටැංකිය ලහට පැමිණීමට අඩි 4ක පාරක් තැනීම | | | 1.0 |
| 7. මහකිවුල්කඩ ... | මහකිවුල්කඩ වැව ප්‍රතිසංස්කරණය කිරීම | කැලෑ එළිකිරීම | අක්කර | 2.0 |
| | නිල නිවාසයත්, කායාලයත් වෙන් කිරීම සඳහා බිත්තියක් ගොඩනැංවීම ... | පස් වැඩ | කියුබ් | 150.0 |
| | | | | 1.0 |
| | කුස්සියේ වතුර ටැංකිය සහ ළිඳට සිමෙන්ති දැමීම | | | |
| | කඳවුර වටේ කටුකම්බි ගැසීම ... | | අඩි | 700.0 |
| | උදලුවලට මිටි ගැසීම ... ... | | | 150.0 |
| | යවුල්වලට මිටි ගැසීම ... ... | | | 75.0 |
| 8. කපුගොල්ලෑව ... | කපුගොල්ලෑව වැව ප්‍රතිසංස්කරණය කිරීම... | කැලෑ එළිකිරීම | අක්කර | 4.0 |
| | | පස් වැඩ | කියුබ් | 250.0 |
| | කුස්සිය වතුර ටැංකිය වටේ වතුර එකතුවීමට සිමෙන්තියෙන් බැම්මක් බැඳ කාණුවක් කැපීම | | | |
| | කඳවුරේ අක්කර 3ක ප්‍රමාණය කටුකම්බි වලින් වටකර, අක්කර 3ක ප්‍රමාණයේ එලවළු වත්ත කඳවුරට යා කිරීම | | | |
| | උදලුවලට සහ යවුල්වලට මිටි ගැසීම | | | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**1967—අගෝස්තු**

| | කඳවුරේ නම | වැඩ විස්තරය | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|
| 1. | අත්තරගල්ල ... | මී ඔය ව්‍යාපාරය වැඩිදියුණු කිරීම ... | පස් වැඩ | කියුබ් | 1,860.0 |
| | | | ගල් කැඩීම | කියුබ් | 240.0 |
| | | | කොන්ක්‍රිට් | කියුබ් | 26.0 |
| | | කුස්සියේ ඇති අඩි 8 දිග අඩි 4 පළල වතුර ටැංකිය වටේ ගඩොල් අල්ලා ඒ මත සිමෙන්ති ආලේප කිරීම. | | | |
| | | කඳවුර වටේ අක්කර 6 ක් පමණ ප්‍රමාණය ලී වැටක් සාද කටුකම්බි වලින් වට කිරීම. | | | |
| | | තෙල් ගබඩාවට සහ බඩු ගබඩාවට ලී රාක්ක තැනීම. | | | |
| | | කම්මලට සහ වඩුවැඩට මඩුවක් තැනීම | | | |
| 2. | සවරංගල ... | සවරංගල වැව ප්‍රතිසංස්කරණය කිරීම ... | පස් වැඩ | කියුබ් | 1,500.0 |
| | | | නිර්මාණ | | 1.0 |
| | | කඳවුර භාර නිලධාරි නිවාසයක්, කාර්යාලයක් වෙන් කිරීම සඳහා වෙන් කිරීමේ බිත්තියක් තැනීම. | | | |
| | | කැන්ටීම වටේ භාග බිත්තියක් මැටියෙන් තැනීම. | | | |
| | | කුස්සියට තාවකාලික දර මඩුවක් යා කිරීම. | | | |
| | | යවුල්වලට සහ උදලුවලට මිටි ගැසීම. | | | |
| 3. | තබ්බෝව ... | තබ්බෝව දකුණු ඇල ඉවුර දිගු කිරීම. ... | පස් වැඩ | කියුබ් | 610.0 |
| | | | කලෑ එළිකිරීම | අක්කර | 10.0 |
| | | අඩි 30 ක් දිග අඩි 12 ක් පළල වඩු මඩුවක් සහ කම්මලක් ඉදි කිරීම | | | 1.0 |
| | | මඩුවක් තැනීම ... | | | 1.0 |
| | | අඩි 15 × 25 ප්‍රමාණයේ තාවකාලික මඩුවක් වැඩපලේ ඉදිකිරීම | | | 1.0 |
| 4. | දේවගිරිය ... | මණිපේ යෝධ ඇල පුළුල් කිරීමේ ව්‍යාපාරය | පස් වැඩ | කියුබ් | 776.0 |
| | | ගබඩාවට රවුම් ලී වලින් රාක්ක තැනීම ... | | | 2.0 |
| | | අඩි 20—18 ප්‍රමාණයේ මඩුවක් රවුන් ලී වලින් තනා ඇලුමිනියම් තහඩුවලින් සෙවිලි කිරීම | | | 1.0 |
| | | දැනට තිබෙන කුස්සියට අමතර වශයෙන් පොල් අතු වලින් සෙවිලි කරන ලද මඩුවක් තැනීම | | | 1.0 |
| 5. | රාජාංගනය ... | යායවල් 3, 4, 5 සහ 6 යේ කෙත් ඇලවල් සහ අතුරු ඇලවල් කැපීම | පස් වැඩ | කියුබ් | 2,000.0 |
| | | | කැලෑ එළිකිරීම | මැණ අවසන් කර නැත | |
| | | කඳවුරට පැමිණීමට පාරක් එළි කිරීම | | | |
| | | යවුල්වලට සහ උදලුවලට මිටි ගැසීම | | | |
| | | ගිමන් හලට පිංපොං මේසයක් තැනීම | | | |
| 6. | ලුනුවැව ... | ලුනුවැව වැව ප්‍රතිසංස්කරණය කිරීම ... | පස් වැඩ | කියුබ් | 2,525.0 |
| | | | සුද්දකිරීම | කියුබ් | 450.0 |
| | | කඳවුරු භාර නිලධාරීට වැසිකිළියක් තැනීම | | | 1.0 |
| | | ගබඩාවට රාක්ක සෑදීම ... ... | | | 4.0 |
| | | පොල් සහ දර දැමීමට කුසිස්ය සහ ගබඩාව පුළුල් කිරීම | | | |
| 7. | මහකිවුල්කඩ ... | මහකිවුල්කඩ වැව අළුත්වැඩියා කිරීම ... | පස්වැඩ | කියුබ් | 150.0 |
| | | | කැලෑ එළිකිරීම | අක්කර | 1.0 |
| 8. | කපුගොල්ලෑව ... | කපුගොල්ලෑව වැව වැඩි දියුණු කිරීම ... | පස්වැඩ | කියුබ් | 200.0 |
| | | දූනුවත්තේගම වැව ප්‍රතිසංස්කරණය කිරීම | කැලෑ එළිකිරීම | අක්කර | 2.0 |
| | | | පස්වැඩ | කියුබ් | 30.0 |

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**1967—සැප්තැම්බර්**

| කඳවුරේ නම | වැඩ විස්තර | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| 1. අත්තරගල්ල ... | මී ඔය හැරවීම් ව්‍යාපාරය වැඩි දියුණු කිරීම | පාරවල් එළිකිරීම | දම්. | 143.0 |
| | | පස්වැඩ | කියුබ් | 1,152.0 |
| | | ගල්කැඩීම | කියුබ් | 88.0 |
| | | කොන්ක්‍රීට් | කියුබ් | 42.0 |
| | | වාන්ඇල්ලීම | | 400.0 |
| | | බොරළු දැමීම | කියුබ් | 240.0 |
| | අමතර ගබඩා ඉදිකිරීම ... ... | | | 1.0 |
| | දර දැමීමට තාවකාලික මඩුවක් තැනීම ... | | | 1.0 |
| 2. සවරංගල ... | සවරංගල වැව අළුත් වැඩියා කිරීම ... | පස්වැඩ | කියුබ් | 1,000.0 |
| 3. තබ්බෝව ... | තබ්බෝව දකුණු ඇළ ඉවුර දීර්ඝ කිරීම ... | තබ්බෝව | | |
| | | පස්වැඩ | කියුබ් | 620.0 |
| | | ගල්කැඩීම | කියුබ් | 238.61 |
| | | නිර්මාණ | | 6.0 |
| | | පහරිය | | |
| | | කැලෑ එළිකිරීම | අක්කර | 6.0 |
| | | පස්වැඩ | කියුබ් | 201.0 |
| 4. දෙවගිරිය ... | මිනිපේ යෝධ ඇල පුළුල් කිරීමේ ව්‍යාපාරය | පස්වැඩ | කියුබ් | 980.0 |
| 5. රාජාංගනය ... | යායවල් 3, 4, 5 සහ 6යේ කෙත් ඇල්වල් සහ අතුරු ඇලවල් තැනීම | කැලෑ එළිකිරීම | අක්කර | 7.0 |
| | | පස්වැඩ | කියුබ් | 670.0 |
| 6. ලුනුවැව ... | ලුනුවැව අළුත් වැඩියා කිරීම ... | පස්වැඩ | කියුබ් | 1,290.0 |
| | ගංවතුරෙන් කැඩීගිය කඳවුරට පැමිණෙන පාර සේවකයින් 10 දෙනෙක් දින 10 දී අළුත් වැඩියා කිරීම. | | | |
| | කඳවුර වටේ අක්කර 8 ක ප්‍රමාණයක් කටුකම්බිවලින් වට කිරීම | | | |
| 7. මහකිවුල්කඩ ... | මහකිවුල්කඩ වැව ප්‍රතිසංස්කරණය කිරීම... | සටහන බලන්න | | |
| 8. කපුගොල්ලෑව ... | කපුගොල්ලෑව වැව ප්‍රතිසංස්කරණය කිරීම | සටහන බලන්න | | |
| | ලුනුවත්තේගම වැව ප්‍රතිසංස්කරණය කිරීම | සටහන බලන්න | | |
| 9. මොරවැව ... | මොරවැව යටතේ ඇති ඇලවල් කැපීම ... | පස්වැඩ | කියුබ් | 432.0 |
| | කඳවුරට එන පාරට බොරළු දැමීම ... | ගල්කැඩීම | කියුබ් | 60.0 |
| | දම්වැල් 1½ ක් පමණ. වටලිවලින් කඳවුරු සීමාව ආවරණය කිරීම | | | |
| | කඳවුරට ඇතුල්වන ස්ථානයේ ඇති මුර කරුවන්ගේ නිවාසය අඩි 4 × 4 × 8 ලෑලි වලින් තැනීම | | | 1.0 |

සටහන :—කපුගොල්ලෑව සහ මහකිවුල්කඩ ගොවිහමුද කඳවුරුවල සැප්තැම්බර් මස කළ වැඩ ප්‍රමාණය ඔක්තෝබර් මස ඇස්තමේන්තුවේ සඳහන්ව ඇත.

**1967—ඔක්තෝබර්**

| කඳවුරේ නම | වැඩ විස්තර | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| 1. අත්තරගල්ල ... | මී ඔය හැරවීමේ ව්‍යාපාරය වැඩි දියුණු කිරීම | පස්වැඩ | කියුබ් | 1,200.0 |
| | | කොන්ක්‍රීට් | කියුබ් | 31.22 |
| | | පිඩලි ඇල්ලීම | කියුබ් | 300.0 |
| | | වාන් ඇල්ලීම | — | 800.0 |
| | | නැවැත්වීමේ ලෑලි | ව. අඩි | 90.0 |
| | අඩි 120 දිග අඩි 20 ක් පළල නිවාසයක් ඉදි කිරීම (පොල් අතු) | | | 1.0 |
| | (අඩි 40 × 20′) ප්‍රමාණයේ නිවාසයක් මොට්ට පෙත්තැවේ ඉදිකිරීම | | | 1.0 |
| | තාවකාලික කුස්සියක් ඉදිකිරීම ... | | | 1.0 |
| | වැසිකිළියක් ඉදිකිරීම ... | | | 1.0 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| කඳවුරේ නම | | වැඩ විස්තරය | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|
| 2. | සවරංගල | සවරංගල වැව ප්‍රතිසංස්කරණය කිරීම | කැලෑ එළිකිරීම | අක්කර | 8.0 |
| | | | පස්වැඩ | කියුබ් | 660.0 |
| | | | පිඩලි ඇල්ලීම | වර්ග | 100.0 |
| 3. | තබ්බෝව | තබ්බෝව දකුණු ඇල ඉවුර දිගුකිරීම | නිර්මාණ | | 5.0 |
| | | | ගල්කැඩීම | කියුබ් | 94.0 |
| | | | පස්වැඩ | කියුබ් | 587.9 |
| | | | කැලෑ එළිකිරීම | අක්කර | 2.1 |
| 4. | දේවගිරිය | මිනිපේ යෝධ ඇල පුළුල් කිරීමේ ව්‍යාපාරය | පස්වැඩ | කියුබ් | 1,247.89 |
| 5. | රාජාංගනය | යායවල් 3, 4, 5 සහ 6 යේ කෙත් ඇලවල් සහ අතුරු ඇලවල් තැනීම | පස්වැඩ | කියුබ් | 450.0 |
| | | | කැලෑ එළිකිරීම | අක්කර | 5.25 |
| 6. | ලුනු වැව | ලුනුවැව ප්‍රතිසංස්කරණය කිරීම | පස්වැඩ | කියුබ් | 792.0 |
| 7. | මහකිවුල්කඩ | මහකිවුල්කඩ වැව වැඩිදියුණු කිරීම | පස්වැඩ | කියුබ් | 450.0 |
| | | | පිඩලි ඇල්ලීම | වර්ග | 75.0 |
| 8. | කපුගොල්ලෑව | කපුගොල්ලෑව වැව ප්‍රතිසංස්කරණය කිරීම | පස්වැඩ | කියුබ් | 750.0 |
| | | | පිඩලි ඇල්ලීම | වර්ග | 100.0 |
| | | දුනුවත්තේගම වැව ප්‍රතිසංස්කරණය කිරීම | පස්වැඩ | කියුබ් | 520.0 |
| | | | පිඩලි ඇල්ලීම | වර්ග | 150.0 |
| 9. | මහවිලච්චිය | මහවිලච්චිය වැව් බැම්ම ඉස්සීම | පස්වැඩ | කියුබ් | 1,200.0 |
| | | කඳවුරු වටා කටුකම්බි ගැසීම | | අක්කර | 3.0 |
| | | මුර පෙට්ටිය පොල්අතු වලින් සාදා ඇලුමිනියම් තහඩුවලින් සෙවිලි කිරීම | | | 1.0 |
| | | දර දැමීම සඳහා පොල්අතු වලින් තාවකාලික මඩුවක් තැනීම | | | 1.0 |
| 10. | මොරවැව | මොරවැව යටතේ ඇලවල් කැපීම | මෙය නොවැම්බර් ඇස්තමේන්තුවට ඇතුළත් වේ. | | |
| 11. | ඇල්හේන | ඇල්හේන වැව වැඩිදියුණු කිරීම | පස්වැඩ | කියුබ් | 800.0 |
| | | | කැලෑ එළිකිරීම | අක්කර | 2.63 |
| | | | නිර්මාණ | | 2.0 |

**1967—නොවැම්බර්**

| කඳවුරේ නම | | වැඩ විස්තරය | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|
| 1. | අත්තරගල්ල | මී ඔය හැරවීමේ ව්‍යාපාරය වැඩි දියුණු කිරීම | පස්වැඩ | කියුබ් | 656.0 |
| | | | පිඩැලි ඇල්ලීම | වර්ග | 533.5 |
| | | | කොන්ක්‍රීට් | කියුබ් | 20.10 |
| | | ගංවතුරෙන් හානියට පත් ග්‍රාමීය වැව් අළුත් වැඩියා කිරීම | වාන ඇල්ලීම | | 290.0 |
| | | | පස් වැඩ | කියුබ් | 400.0 |
| 2. | සවරංගල | සවරංගල වැව ප්‍රතිසංස්කරණය කිරීම | පස් වැඩ | කියුබ් | 465.0 |
| | | | පිඩැලි ඇල්ලීම | වර්ග | 191.0 |
| | | ගංවතුරින් විනාශ වූ ඔහ වැව අළුත් වැඩියා කිරීම | පස්වැඩ | කියුබ් | 255.0 |
| 3. | තබ්බෝව | තබ්බෝව දකුණු ඇල ඉවුර දිගු කිරීම | කැලෑ එළි කිරීම | වර්ග | 1.50 |
| | | | පස්වැඩ | කියුබ් | 381.17 |
| | | | නිර්මාණය | | 4.0 |
| | | හලාවත ගං වතුර ආපදා සේවය | සේවක දින | | 2,400.0 |
| 4. | දේවගිරිය | මිණිපේ යෝධ ඇල පුළුල් කිරීමේ ව්‍යාපාරය | පස්වැඩ | කියුබ් | 1,484.59 |
| | | | කැලෑ එළිකිරීම | අක්කර | 0.5 |
| | | | පිඩැලි ඇල්ලීම | වර්ග | 192.5 |
| | | හසලක වාරිමාර්ග ඉංජිනේරු තැනට සේවකයින් 20 ක් දින 12 කට සපයා ඇත | පාලම් 1 සේවක | දින | 240.0 |
| 5. | රාජාංගනය | යායවල් 3, 4, 5 සහ 6 යේ කෙත් ඇලවල් සහ අතුරු ඇලවල් තැනීම | පස්වැඩ | කියුබ් | 1,380.0 |
| | | | පිඩලි ඇල්ලීම | වර්ග | 188.0 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු | වාචික පිළිතුරු

| කඳවුරේ නම | වැඩ විස්තර | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| 6. ලුනුවැව ... | ලුනුවැව ප්‍රතිසංස්කරණය කිරීම ... | පස්වැඩ | කියුබ් | 732.0 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 291.0 |
| 7. මහකිවුල්කඩ ... | මහකිවුල්කඩ වැව ප්‍රතිසංස්කරණය කිරීම... | පස්වැඩ | කියුබ් | 200.0 |
| 8. කපුගොල්ලෑව ... | කපුගොල්ලෑ වැව අළුත්වැඩියා කිරීම ... | පස්වැඩ | කියුබ් | 300.0 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 20.0 |
| | දුනුවත්තේගම වැව අළුත්වැඩියා කිරීම ... | රැලපනාව | කියුබ් | 10.0 |
| | | පස්වැඩ | කියුබ් | 150.0 |
| 9. මොරවැව ... | මොරවැව යටතේ ඇලවල් තැනීම ... | පස්වැඩ | කියුබ් | 2,130.0 |
| | | ගල් කැඩීම | කියුබ් | 104.0 |
| | | පිඩැලි ඇල්ලීම | වර්ග | 404.0 |
| | | බොරලු | කියුබ් | 100.0 |
| 10. වාන් ඇල ... | වාන්ඇල වැව් බැම්ම සහ ඇලවල් තැනීම ... | පස්වැඩ | කියුබ් | 522.99 |
| | | කුඩු ගල කැඩීම | කියුබ් | 55.00 |
| | | කැලෑ එළිකිරීම | අක්කර | 1.00 |
| | කඳවුර ඉදිරියේ ඇති පාරට රවුම් ලී වලින් වැටක් ගැසීම | | අඩි | 600.00 |
| 11. මහවිලච්චිය ... | මහවිලච්චිය වැව් බැම්ම අඩි 2 කින් ඉස්සීම... | පස්වැඩ | කියුබ් | 500.0 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 400.0 |
| | ගොවි හමුදාවේ ප්‍රයෝජනය සඳහා ලබාගත් වාරිමාර්ග නිවාස සිමෙන්ති දමා අළුත් වැඩියා කිරීම | | | |
| | වාරිමාර්ග නිවාසවල බිත්තිවල ඇති කඩ තොලු මැකීම | | | |
| | වැසිකිලි දෙකක් සිමෙන්ති දමා අළුත් වැඩියා කිරීම | | | |
| | වතුර ටැංකි දෙකක් අළුත් වැඩියා කර නැවත සිමෙන්ති දැමීම | | | |
| 12. ඇල්හේන ... | ඇල්හේන වැව ප්‍රතිසංස්කරණය කිරීම ... | පස්වැඩ | කියුබ් | 600.0 |
| | | නිර්මාණ | | 9.0 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 50.0 |
| | අඩි 20 × 12' ක් පළල මඩුවක් වඩුවන් සහ කම්මල්කරුවන් සඳහා ඉදිකිරීම | | | 1.0 |
| | පාරට බොරළු දැමීම ... ... | | සැත. | 1½ |
| | කඳවුරට ඉදිරිපිට පාර කැලෑ ලී වලින් ඉදි කිරීම | | අඩි | 300.0 |
| | උදලු, යවුල් සහ කැතිවලට මිටි ගැසීම ... | | සැත. | 9.0 |
| | ඇල්හේන ඇල මැණීම | | | |

**1967—දෙසැම්බර්**

| කඳවුරේ නම | වැඩ විස්තර | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| 1. අත්තරගල්ල ... | මී ඔය හැරවීමේ ව්‍යාපාරය වැඩිදියුණු කිරීම | පස්වැඩ | කියුබ් | 305.4 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 321.0 |
| | | කොන්ක්‍රීට් | කියුබ් | 10.94 |
| | ගංවතුරෙන් හානියට පත් ග්‍රාමීය වැව් අළුත් වැඩියා කිරීම | පස්වැඩ | කියුබ් | 600.0 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 100.0 |
| | මොට්ටපොත්තාව වැව වැඩිදියුණු කිරීම ... | පස්වැඩ | කියුබ් | 600.0 |
| 2. සවරංගල ... | සවරංගල වැව ප්‍රතිසංස්කරණය කිරීම ... | පස්වැඩ | කියුබ් | 365.0 |
| | | පිඩලි ඇල්ලීම | වර්ග | 73.0 |
| | ගංවතුරෙන් විනාශවූ මහවැව අළුත්වැඩියා කිරීම | පස්වැඩ | කියුබ් | 53.0 |
| 3. තබ්බෝව ... | තබ්බෝව දකුණු ඇල ඉවුර දිගු කිරීම ... | පස්වැඩ | කියුබ් | 1922.0 |
| | | ගල්කැඩීම | කියුබ් | 2.41 |
| | | නිර්මාණ | | 1.0 |
| | තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ වැඩ වර්ජන කාලයේදී සේවකයින් සැපයීම | සේවක | දින | 72 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

| | කඳවුරේ නම | වැඩ විස්තරය | කළ වැඩ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|
| 4. | දේවගිරිය ... | මිනිපේ යෝධ ඇල පුළුල් කිරීමේ ව්‍යාපාරය | පස්වැඩ | කියුබ් | 3937.0 |
| | | | කැලෑ එළිකිරීම | අක්කර | 2.0 |
| | | හසලක වාරි. ඉංජිනේරු තැනට සේවකයින් 38 දෙනෙක් ද්‍රව්‍ය ගෙනයාම සඳහා සපයන ලදී | බෝක්කු | | 4.0 |
| | | | ප්‍රවාහන—සේවක | දින | 38 |
| 5. | රාජාංගනය ... | යායවල් 3, 4, 5 සහ 6 යේ කෙත් ඇලවල් සහ අතුරු ඇලවල් තැනීම | පස්වැඩ | කියුබ් | 964.0 |
| | | | පිඩලි ඇල්ලීම | වර්ග | 732.0 |
| 6. | ලුනුවැව ... | ලුනුවැව ප්‍රතිසංස්කරණය කිරීම ... | පස්වැඩ | කියුබ් | 520.0 |
| | | | පේළියට පිඩලි ඇල්ලීම | වර්ග | 15.23 |
| 7. | මහකිවුල්කඩ ... | මහකිවුල්කඩ වැව වැඩිදියුණු කිරීම ... | පස්වැඩ | කියුබ් | 150.0 |
| 8. | කපුගොල්ලෑව ... | කපුගොල්ලෑව වැව වැඩිදියුණු කිරීම ... | පස්වැඩ | කියුබ් | 200.0 |
| | | | පිඩලි ඇල්ලීම | වර්ග | 30.0 |
| | | | රළපනාව | කියුබ් | 10.0 |
| | | දුනුවත්තේගම වැඩි දියුණු කිරීම ... | පස්වැඩ | කියුබ් | 150.0 |
| 9. | මොරවැව ... | මොරවැව යටතේ ඇලවල් තැනීම ... | පස්වැඩ | කියුබ් | 1092.0 |
| | | | පිඩලි ඇල්ලිම | වර්ග | 405.7 |
| | | ආයුධ මුවහත් කිරීම | | | |
| 10. | වාන්ඇල ... | වාන්ඇලේ බැම්ම සහ ඇලවල් තැනීම ... | පස්වැඩ | කියුබ් | 378.0 |
| | | අඩි 25 × 16′ ප්‍රමාණයේ මඩුවක්, වඩුවන්ට සහ කම්මල්කරුවන් සඳහා රවුම් ලීවලින් සාද පොල්අතු සෙවිලි කිරීම | | | |
| 11. | මහවිලච්චිය ... | මහවිලච්චිය වැවේ වාන අඩි 2 කින් ඉස්සීම | පස්වැඩ | කියුබ් | 190.0 |
| | | | පිඩලි ඇල්ලීම | වර්ග | 40.0 |
| 12. | ඇල්හේන ... | ඇල්හේන වැව ප්‍රතිසංස්කරණය කිරීම ... | කැලෑඑළිකිරීම | අක්කර | 5.4 |
| | | | පස්වැඩ | කියුබ් | 620.0 |
| | | | පිඩලි ඇල්ලීම | වර්ග | 71.0 |
| | | වේවැල් කූඩා සෑදීම ... ... | | | 150.0 |
| | | දර දැමීම සඳහා තාවකාලික මඩුවක් තැනීම නාම පුවරුවක් සහ සංඥා පුවරුවක් සෑදීම | | | 1 |
| 13. | පදවිය ... | පදවිය වැව යටතේ ඇති ඇලවල් සෑදීම ... | පස්වැඩ | කියුබ් | 389.75 |
| | | පාර ඉදිරිපිට වැඩ රවුන් ලීවලින් අඩි 200 වටකිරීම | | අඩි | 200 |
| | | අඩි 100 ක පාරක් එළිකිරීම ... | | අඩි | 100 |
| | | රවුම් ලීවලින් රාක්ක 3 ක් සෑදීම ... | | | 3 |
| | | රවුන් ලීවලින් සහ පොල්අතුවලින් සෙවිලි කරණ ලද මුර පෙට්ටියක් තැනීම | | | 1 |
| | | කුස්සියේ සිට කුණු දමන වල දක්වා අඩි 75ක ඇලක් කැපීම ... | | අඩි | 75 |
| | | කාර්යාලය වෙන් කිරීමට බිත්තියක් බැඳීම... | | | 1 |

(ඊ) ගොවි හමුදව ආරම්භයේ සිට 1967 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වියදම් කර තිබෙන මුදල් ප්‍රමාණය මෙසේය—

1966/67 මුදල් වර්ෂය,

එනම් 1967.9.30 දක්වා ... ... රු. 3,242,155 0

1967/68 මුදල් වර්ෂය :

එනම් 1967.10.1 සිට 1967.12.31 දක්වා ... රු. 1,555,706 0

රු. 4,797,861 0

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(*a*) NUMBER OF CAMPS OPENED UP TO 12TH JANUARY 1968 AND NAMES AND ADDRESSES AND THE DATES OF COMMENCEMENT

| | *Name of Camp* | *Date of Commencement* | *District* | *Electorate* | *Address* |
|---|---|---|---|---|---|
| 1. | Attaragalla | 30. 3.67 | Kurunegala | Yapuhuwa | Land Army Camp, Attaragalla, Abanpola |
| 2. | Sawarangala | 20. 4.67 | Kurunegala | Nikaweratiya | Land Army Camp, Sawarangala, Mahagirilla |
| 3. | Tabbowa | 18. 5.67 | Puttalam | Nikaweratiya | Land Army Camp, Tabbowa |
| 4. | Dewagiriya | 19. 5.67 | Matale | Laggala | Land Army Camp, Dewagiriya, Wilgamuwa |
| 5. | Rajangana | 8. 6.67 | Anuradhapura | Anuradhapura | Land Army Camp, Solewewa, Warawewa, Galgamuwa *via* |
| 6. | Lunuwewa | 9. 7.67 | Anuradhapura | Kalawewa | Land Army Camp, Lunuwewa, Tambutegama |
| 7. | Mahakiulkada | 13. 7.67 | Anuradhapura | Horowapatana | Land Army Camp, Mahakiulkada, Horowapatana |
| 8. | Kapugollewa | 23. 7.67 | Anuradhapura | Horowapatana | Land Army Camp, Kapugollewa, Horowapatana |
| 9. | Morawewa | 20. 9.67 | Trincomalee | Trincomalee | Land Army Camp, Morawewa, Pankulama |
| 10. | Mahawilachchiya | 25. 9.67 | Anuradhapura | Anuradhapura | Land Army Camp, Mahawilachchiya, Pemaduwa |
| 11. | Elhena | 30. 9.67 | Badulla | Mahiyangana | Land Army Camp, Elhena, Ekiriyankumbura |
| 12. | Wan-Ela | 27.10.67 | Trincomalee | Trincomalee | Land Army Camp, Wan-Ela, Kantalai |
| 13. | Padaviya | 22.11.67 | Anuradhapura | Medawachchiya | Land Army Camp, Padaviya, Bogahawewa, Medawachchiya *via* |

'"tenant", in relation to any nindagama land, means a person who was, prior to the date of the commencement of this Act, a maruwena nilakaraya or a maruwena pangu of that land within the meaning of the Service Tenures Ordinance;'."

No changes will be made in the rest of the Bill.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Hon. Minister is only informing the House that he proposes to move these amendments at the Committee stage, in order that hon. Members may keep that in mind when they participate in the Second Reading Debate.

අ. භා. 2.25

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, නින්දගම් පනත පිළිබඳ පළමුවැනි දින විවාදයේදී අප විසින් පෙන්වා දෙන ලද වැරදි රාශියකින් එකක් දෙකක් පමණක් නිවැරදි කිරීමට ගරු ඇමතිතුමා කැමැත්ත දක්වා ඇති හෙයින් නැවතත් අපට මේ විවාදය ආරම්භ කරන්නට පුළුවන් වී තිබෙනවා. නින්දගම් පිළිබඳව යම්කිසි පනතක් මේ ගරු සභාවෙන් සම්මත කරනවා නම් එම පනතින් ගරු ඇමතිතුමාත් රජයත් අදහස් කරන දේ ඉටු වෙනවාද කියන ප්‍රශ්නයට පිළිතුරක් දෙන්නට පුළුවන් වන්නේ, පනත සම්මත කරන්නට පෙර මේ රටේ තිබුණු නින්දගම් ක්‍රමයත් නින්දගම්වල තිබුණු රාජකාරි ක්‍රමය හා වැඩවසම් ක්‍රමයත් ගැන පැහැදිලි අවබෝධයක් ඇති කර ගත්තොත් පමණක්ය කියා නින්දගම් පනත පිළිබඳව විවාද කරන මේ අවසථාවේදී මතක් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, මා කලිනුත් දක්වා සිටි පරිදි පළමුවෙන්ම නින්දගම් පනතක් මේ ගරු සභාවට ඉදිරිපත් කළේ 1966 ඔක්තෝබර් මාසයේ 8 වැනිදායි. ඒ පනත එදා මේ ගරු සභාවට ඉදිරිපත් කළා පමණක් නොවෙයි, ඒ පිළිබඳව දීර්ඝ කථාවකුත් ගරු ඇමතිතුමා විසින් ගුවන් විදුලිය මගින් ජනතාව අමතා කළ බව අපට මතකයි. ගරු ඇමතිතුමා ගුවන් විදුලියෙන් ජනතාව අමතා නින්දගම් ඉඩම්වල වැඩෙහි යෙදී සිටින අයට එම නින්දගම් ඉඩම් පවරා දෙනවාය කියමින් දීර්ඝ විස්තරයක් කළා. ඒ 1966 ඔක්තෝබර් මාසයේ. මේ ගරු සභාවට කොතෙකුත් පනත් ඉදිරිපත් කරනවා. එහෙත් එසේ ඉදිරිපත් කරන කිසිම පනතක් පිළිබඳව එම පනත මේ ගරු සභාවේ සාකච්ඡා කරන්නට කලින්—ඒ පිළිබඳව මේ ගරු සභාව සම්මතයක් ගන්නට කලින්—ගුවන් විදුලිය මගින් රටට ප්‍රකාශ කර සිටින සිරිතක් ඇත්තෙත් නැහැ; තිබුණෙත් නැහැ. එහෙත් මේ පනත පිළිබඳව පමණක් ගරු ඉඩම් ඇමතිතුමා 1966 ඔක්තෝබර් මාසයේදී ගුවන් විදුලිය මගින් දීර්ඝ විස්තරයක් කළ බව අපට මතකයි. ඊට පසුව ප්‍රවෘත්ති පත්‍රවලටත්—ඉංග්‍රීසි, සිංහල, දෙමළ භේදයෙන් තොරව—ගරු ඇමතිතුමාගේ නමින්ම ලිපි ලියා ඒ පනතින් ජනතාවට විශාල සේවයක් කරන්නට යනවාය කියා ඔප්පු කරන්නට විශාල උත්සාහයක් ගත්තා. ගරු ඇමතිතුමා ඒ අන්දමට උත්සාහ ගත්තේ ඔක්තෝබර් 24 වැනි දා දක්වා පමණයි. මා හිතන විධියට එයට හේතුව බලංගොඩ අතුරු මැතිවරණය තිබුණේ ඔක්තෝබර් 24 වැනි දා වීමයි. මේ පනත පිළිබඳව එතරම් විශාල ප්‍රචාරයක් ගරු ඇමතිතුමා විසින් වේදිකාවෙනුත්, ගුවන් විදුලියෙනුත්, ප්‍රවෘත්ති පත්‍රවලිනුත් ගෙන ගිය නමුත් බලංගොඩ ආසනය දිනා ගන්නට මේ රජයට නුපුළුවන් වූ බව කියන්නට ඕනෑ. ගරු ඇමතිතුමා එවැනි ප්‍රකාශ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

යන් කර අවුරුදු 2 ක් තිස්සේ බලාගෙන සිට 1968 දී මේ ගරු සභාවට ඉදිරිපත් කර ඇති මේ පනත දෙස බලන විට අපේ පැරණි ප්‍රස්තාව පිරුළක් මට මතක් වෙනවා. ඒ ප්‍රස්තාව පිරුළ නම් "කන්දක් විළිලා මී පැටියකු ප්‍රසූත කළා වගෙයි" කියන එකයි. කන්දක් ප්‍රසූත කරන්නට තරම් විලි රුදාව ඇති වූ බවක් පෙනී ගිය නමුත් බිහිවෙලා තිබනේනේ මී පැටවකු පමණයි. ගරු ඇමතිතුමා ඇත්ත වශයෙන්ම නින්දගම්, ඒවා භුක්ති විඳින පුද්ගලයන් සතු කරන්නට අවංකවම කල්පනා කරනවා නම් එතුමා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුව තිබුණේ මෙවැන්නක් නම් නොවෙයි. ඇත්තෙන්ම මේ පනතින් එය කරන්නට බැහැ.

විවාදය ආරම්භ වූ පළමුවන දවසේ මා කළ චෝදනාව සාධාරණ බව අද ඔප්පු වෙලා තිබෙනවා. එදා ගරු ඇමතිතුමා "දරන්නා" යන වචනයට දුන් අදහස නොවෙයි අද දී තිබෙන්නේ. මෙය දෙන්නට යන්නේ නිලකාරයාටද, එහෙම නැත්නම් නින්දගම් හිමියාටදැයි එදා අප විසින් අහන්නට යෙදුණා. ඇයි එය පැහැදිලි නොකරන්නේ ? එය හරියාකාර පැහැදිලි නොකරන්නේ මන්දැයි එදා අපට අහන්නට සිද්ධ වුණා. ඒ සම්බන්ධයෙන් චෝදනා කරන්නටත් අපට සිදු වුණා. චෝදනා කළාම, "දරන්නා" කියන්නේ "නිලකාරයා" යනුවෙන් ගරු ඇමතිතුමා කීවා. අදත් අපට ප්‍රශ්නයක් අහන්නට සිදු වී තිබෙනවා. මොකටද මේ පසුබිමේ, "දරන්නා" කියන එක, "නිලකාරයා" කියන එක විස්තර කරන්නේ ? මෙය පනතේ ඇතුළත් නොකරන්නේ ඇයි ? "දරන්නා" යන්න ඉවත් කර "නිලකාරයා" යන්න කෙලින්ම එහි ඇතුළත් නොකරන්නේ ඇයි ? එය එහි සඳහන් නොකිරීමෙන් ගරු ඇමතිතුමා අදහස් කරන්නේ කුමක්ද ? එයින් මේ පනතේ යම්කිසිවක් සඟවන්නට උත්සාහ කර තිබෙනවා. හංගන්නට උත්සාහ කළ දෙය කුමක්දැයි එළියට අරගෙන තව සඩලප වේලාවකින් මම ඉදිරිපත් කරන්නම්.

ගරු ඇමතිතුමාගේ සංශෝධනයෙන් කියන්නේ "බදුකරු" කියන වචනයේ තේරුම පංගු නිලකාරයා නැත්නම් මාරු වන නිලකාරයා බවයි. ඒ ආකාරයට එය තවත් පැහැදිලි කර තිබෙනවා. එහෙත් ඒකත් සම්පූර්ණයෙන්ම වැරදියි. නින්දගම් ඉඩම්වල බදුකාරයකුත් ඉන්නවා. එහෙත් මාරුවන පංගුකාරයාය කියන්නේ වෙනම කෙනකුටයි. බදුකාරයාය කියන්නේත් වෙනම කෙනකුටයි. සංශෝධනය කරන්නට ගිහිල්ලා ඇත්තෙන්ම කර තිබෙන්නේ මොකක් ද ? මෙහිදී මට පැරණි කියමනක් මතක් වෙනවා. කවුදෝ කෙනෙක් කොහේදෝ ආචාරියකු ළඟට ගිහිල්ලා තියෙනවා මොකක්දෝ එකක කඩතොලු මකා ගන්නට. එහෙත් ආපසු ආවේ තවත් කඩතොලු වැඩි කර ගෙනලු. එහෙම කතාවක් තිබෙනවා. මෙ තැනත් එවැන්නක් තමයි සිදු වී තිබෙන්නේ. තමුන්නාන්සේත් එක කඩතොල්ලක් මකා ගන්නට ගිහිල්ලා තවත් කඩතොල්ලක් ඇති කරගෙන තිබෙනවා. ගරු ඇමතිතුමා මුහුණ පා සිටින්නේ එවැනි තත්ත්වයකටයි.

ගරු ඇමතිතුමා නින්දගම් ක්‍රමය කුමක් දැයි දන්නවාද ? නින්දගම් ක්‍රමය කුමක් දැයි ඉස්සරවෙලාම දැනගන්නට ඕනෑ. මේ රටේ තිබුණු නින්දගම් ක්‍රමය ගැන ගරු ඇමතිතුමාට පුංචි පාඩමක් දෙන්නටයි දැන් මට සිද්ධවෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] ඔව්, මගේ රක්ෂාවත් ඒකයි. ඒ රක්ෂාව අවුරුදු 15 ක් තිස්සේ කර තිබෙනවා. වුවමනාවක් තිබෙනවා නම් —කවුරු හෝ කැමති නම්—නැවතත් කරන්නට ලැස්තියි. මේ රටේ තිබුණු පැරණි නින්දගම් ක්‍රමය ගැන පැහැදිලි අවබෝධයක් නොමැති තැනැත්තකුට මෙවැනි පනතක් හදන්නට පුළුවන් කමක් නැහැ. ගරු ඇමතිතුමා එදා එතුමාගේ කථාව පටන් ගන්නා විටම එතුමා නින්දගම් ක්‍රමය පිළිබඳව අවබෝධයක් නැති කෙනකු බව ඔප්පු කර තිබෙනවා. ඒ පිළිබඳව කිසිම තේරුමක් නැති කෙනකු බව එතුමා එතුමාගේ කථාවෙන්ම ඔප්පු කර තිබෙනවා. මම දැන් එතුමාගේ කථාවෙන්ම එය පෙන්වා දෙන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නිල වාර්තාවේ 1218 වන තීරුවෙහි සඳහන් වන්නේ එතුමා 1968 පෙබරවාරි 25 වැනිදා කළ කථාවයි. මම දැන් එයින් කොටසක් කිය වන්නම් :

"ගරු කථානායකතුමනි, නින්දගම් ක්‍රමයෙහි කොටස් දෙකක් තිබෙනවා. ඉඩම් අයත් බණ්ඩාරලා එක පැත්තකින් සිටිනවා. මේ අයට "බණ්ඩාර හාමුදුරුවෝ" යනුවෙන් සාමාන්‍යයෙන් ව්‍යවහාර කරනවා. සබරගමු පළාතේ නින්දගම් අයිති අයට කියන්නේ "අප්පොලා" කියලයි. එතකොට එක පැත්තකින් බණ්ඩාරලා නැත්නම් අප්පොලා ඉන්නවා. අනෙක් පැත්තෙන් ඒ නින්දගම්වල වෙසෙමින් අර බණ්ඩාරලාට නැත්නම් අප්පොලාට සේවය කරන අය ඉන්නවා. ඉඩම් අයිතිකරුවන් යම් යම් අයට ඒවා භුක්ති විඳීමට ඉඩ දී ඔවුන්ගෙන් යම් සේවයක් ලබා ගන්නවා. 1953 දී පැවති ආණ්ඩුව නින්දගම් ආදියට වැඩි කැමැත්තක් නොදැක්වූ නිසා ඒවා පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා කොමිසමක් පත් කළා."

ගරු ඇමතිතුමා ඔය ආකාරයට එතුමාගේ කථාව එදා කරගෙන ගියා. එතුමා සඳහන් කරන දෙවර්ගය මොනවා දැයි ගරු ඇමතිතුමාගෙන් අහන්නට කැම තියි. කොහෙද ඒවා තිබෙන්නේ? අප්පොයි, බණ්ඩාරලායි කියා දෙකක් නැහැ. සබරගමුවේ අප්පෝ කියා ජාතියක් ඉන්නවා. තවත් ප්‍රදේශයක බණ්ඩාරලා කියාත් ජාතියක් ඉන්නවා. ඒ වාගේම බලපිටිය පැත්තේ හාමු මහත්වරුන්ය කියා ජාතියකුත් ඉන්නවා. එහෙත් අප කියන්නේ ඒ උදවිය ගැන නොවෙයි. අපට අහන්නට තිබෙන්නේ ඒ ගැන නොවෙයි. මොනවාද මේ නින්දගම් වර්ග දෙක? එහෙම වර්ග දෙකක් තිබෙනවා නම් ඒ ගැන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ පනතේ තිබෙන්නට ඕනෑ. වර්ග දෙකක් නොවෙයි, ඉන් වැඩි සංඛ්‍යාවක් වුවත් ඒ පළාතේ තිබෙන්නට පුළුවනි එහෙත් එහි එකම එක නින්දගම් කාරයෙක්වත් නැහැ. මේව තවත් වර්ග කරන්ටත්, කොටස් වශයෙන් කඩල පෙන්වන්ටත් පුළුවන්. එසේ කොටස් වශයෙන් කඩල පෙන්වන්ට ඇමතිතුමාට අවබෝධයක් නොතිබුණු බව ඇමතිතුමා ගේ ප්‍රකාශයෙන් හොඳ හැටි පැහැදිලියි. ගරු ඉඩම් ඇමතිතුමාට නින්දගම් පිළිබඳ අවබෝධයක් නොමැති වීම ගැන මා පුදුම වෙන්නෙත් නැහැ; කනගාටු වෙන්නෙත් නැහැ. එතුමා නින්දගම් දැකලත් නැතුව ඇති; භුක්ති විඳලත් නැතුව ඇති. සමහර විට නින්දගම් ගැන අහලත් නැතුව ඇති. මෙතැන අපට තිබෙන ලොකුම අන්තරා දයක කර්තව්‍යය, නොදන්නා දේවල් කරන්ට යාමයි. නොදන්න දේවල් කරන්ට යාමෙන් අමාරුවේ වැටෙන්නෙ තමන් පමණක් නොව රටත් අමාරුවේ වැටෙන බව මතක් කළ යුතුයි. අප කරන චෝදනාව ඒකයි. ඒ නිසා තමයි, නින්දගම් කියන්නේ මොනවාද යන්න ගැන ගරු ඇමතිතුමාට සෑහෙන තරමක වත් අවබෝධයක් ලබා දීම මගේ යුතු කමක් වශයෙන් මා කල්පනා කළේ.

ඉතා පුරාණ ලෝකයේ ඉඩම් මහජනයා සන්තකව තිබුණු බවට ඕනෑ තරම් සාක්ෂි තිබෙනව. එහෙත් රජවරුන් පහළ වීමෙන් පසුව ඒ රජවරුන් කල්පනා කළා "මහ පොළොවේ අසහාය නායකයා මමයි. මහ පොළොව සම්පූර්ණයෙන්ම අයිති මටයි" ආදි වශයෙන්. ඒ ඒ රටවල ඉඩම් ඒ ඒ රටවල රජවරුන්ට අයිති ඉඩම් හැටියට කල්පනා කළා. ඒ නිසා ඉඩම් පාලනය කිරීමට රජවරුන් විසින් යම් යම් ක්‍රම සකස් කර තිබුණා. ගරු ඉඩම් ඇමතිතුමා සඳහන් කළා, මේ පනත ගෙනෙන්ට යෙදුණේ, විහාර දේවාලගම් හා නින්දගම් ඉඩම්වල භුක්තිය පිළිබඳ කොමිෂන් සභා වාර්තාවේ 151 වෙනි ඡේදය ක්‍රියාත්මක කිරීම සඳහා බව. ඒ වාර්තාවේ 151 වෙනි වගන්තිය විතරක් කියවීමෙන් තමයි ඉඩම් ඇමතිතුමා අමාරුවේ වැටී තිබෙන්නෙ. වාර්තාව හරි හැටි කියෙව්වා නම් නින්දගම් කියන්නෙ මොනවද, නින්දගම්වල ප්‍රභවය මොකක්ද, කියන කාරණා හරි හැටි පැහැදිලි කර ගන්ට පුළුවන්කම තිබුණා. මම සඳහන් කළ කාරණය මම මේ වාර්තාවෙන් ඔප්පු කරන්නම්. 1956 සැසි වාර්තා අංක 1 දරණ විහාරගම් දේවාලගම් හා නින්දගම් ඉඩම්වල භුක්තිය පිළිබඳ කොමිෂන් සභා වාර්තාවෙ 1 වෙනි පරිච්ඡේදයේ 2 වෙනි ඡේදයේ මේ විධියට තිබෙනව :

"රජුන්ගේ පහළවීමත් සමගම, මුළු පොළොවෙහිම අසහාය ස්වාමියා රජු යයි යන සිද්ධාන්තය අනුව මෙම අයිතිය වෙනස් විය. ඉඩම් පිළිබඳ සම්පූර්ණ අයිතිය රජුට පැවරුණු අතර, එම විශේෂ බලයට යටත්ව මහජනයා විසින් ඉඩම් ලබා ගන්නා ලදි. කල් යාමේදී ඉඩම් පිළිබඳ සම්පූර්ණ අයිතිය රජුටය යන සිද්ධාන්තය සංවර්ධනය වී පිළිගත් සත්‍යයක් ලෙස තහවුරු වූ අතර, උඩරට සමාජ සංවිධානය සහමලින්ම සිදු වූයේ එම සංකල්පය පදනම් කොටගෙනය."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. එම්. හේරත් මයා.]

ගරු කථානායකතුමනි, උඩරට ඉඩම් පමණක් නොවෙයි, රජ්ජුරුවන් තමන්ට අයත් යයි සිතූ සියලුම ඉඩම් සංවර්ධනය වුණේ මෙන්න මේ ප්‍රතිපත්තිය උඩයි; මේ පදනම උඩයි; මේ අත්තිවාරම උඩයි. එසේ නැතුව ඇමතිතුමා ප්‍රකාශ කළ විධියට නොවෙයි. රටේ තිබුණු සෑම ඉඩමක්ම රජතුමාට ඕනෑ හැටියට කොටස් කර නොයෙක් අයට පවරා තිබුණා. සමහර ඉඩම් කෙළින්ම භාණ්ඩාගාරයට ආදායම් ලැබෙන ගබඩාගම් හැටියට තිබෙන්ට ඉඩ හැරියා. තවත් ඉඩම් කොටසක් රජ්ජුරුවන්ගේ නිලධාරීන් වශයෙන් සේවය කළ රදලවරුන්ට ඔවුන්ගේ වැටුප වෙනුවට පවරා දී තිබුණා. තවත් ඉඩම් කොටසක් ඒ නිලධාරීන්ටත්, රාජ්‍ය සේවාවටත් අවශ්‍ය බදු ලබා ගැනීම සඳහා යොදවා තිබුණා. විහාරවල ආවතේව සහ ආදායම් ලබා ගැනීමට තවත් ඉඩම් කොටසක් වෙන් කර තිබුණා. දේවාලවලට ආව තේව සහ ආදායම් ලබා ගැනීමට තවත් ඉඩම් කොටසක් වෙන් කර තිබුණා. රජවරුන් ඉඩම් බෙදුවෙ ඒ විධියටයි. ඉතා හොඳ ඉතිහාසයක් ඇති මේ රටේ පැරණි රජ දරුවන්, පිටුපසින් ගිහින් බෙල්ල කැපූ මිනිසුන්ට ඉඩම් බෙදා දුන්නා යයි කීමෙන් ගරු ඉඩම් ඇමතිතුමා ඒ පැරණි ක්‍රමයටත්, පැරණි රජදරුවන්ටත් පහර ගැසුවේ අහේතුකවයි. මා කියන්නේ නැහැ, දුන්නේ නැත කියා. දෙන්න ඇති. එහෙත් සම්පූර්ණ ක්‍රමය එකක් වශයෙන් අරගෙන තමුන්නාන්සේ කිව්වා, ගහල යන්ට නින්දගම් දී තිබෙන්නේ බෙල්ල කැපූ නිසාය, තවත් අයට නින්දගම් දී තිබෙන්නේ සුදු කොටියෙක් නැතිනම් සුදු මුවෙක් ගෙනැවිත් දුන් නිසාය, තවත් අයට නින්දගම් දී තිබෙන්නේ පිහියෙන් ඇනපු නිසාය, තවත් අයට නින්දගම් දී තිබෙන්නේ හොඳට යුද්ධ කරපු නිසාය යනාදී වශයෙන්. ඒ ආකාරයට නින්දගම් දෙන්නට ඇති හේතු වගයක් තමුන්නාන්සේ කියෙව්වා. මා එය තමුන්නාන්සේ කී අයුරින්ම උපුටා දක්වන්නම්.

1968 පෙබරවාරි 25 වන දින හැන්සාඩ් නිල වාර්තාවේ පළවූ තමුන්නාන්සේගේ කතාවේ එය මෙසේ සඳහන් වෙනවා:

"වැඩියෙන්ම නින්දගම් තිබෙන්නේ සබරගමුවේයි. මා මෙම ලැයිස්තුව ගත්තේ රත්නපුර කච්චේරියේ ලියාපදිංචි වී තිබෙන සන්නස් ලැයිස්තු වෙනුයි. මේ පහත සඳහන් කාරණාවලට නින්දගම් දී තිබෙනවා."

"සමහර නින්දගම්" යනුවෙන් තමුන්නාන්සේ මෙහි කියා නැහැ. තමුන්නාන්සේ එදා සිංහලෙන් කියා තිබෙන්නේ, "පහත සඳහන් කාරණාවලට නින්දගම් දී තිබෙනවා" යනුවෙනුයි. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"කොළඹ යුද්ධයේදී විශිෂ්ඨ සේවයක් කළ නිසා සවාමින් වහන්සේ නමකට නින්දගමක් දී තිබෙනවා. රජ මැදුරට පණ පිටින් සුදු මුවකු ගෙනැවිත් දුන් නිසා තව කෙනකුට නින්දගමක් දී තිබෙනවා. එක්තරා විහාරයක බුදුරජාණන් වහන්සේගේ පින්තූරයක් ඇන්ද නිසා එක් සිත්තරකුට නින්දගමක් දී තිබෙනවා. මැදුම් සඟිය යන පොතක් සිංහලෙන් ලිවීම නිසා තව කෙනකුට නින්දගමක් දී තිබෙනවා. රජතුමාගේ අඩුක්කුව හොඳට සැපයූ නිසා තව කෙනෙකුට නින්දගමක් දී තිබෙනවා. පුවක් වෙළෙඳාම දියුණු කළ නිසා තව කෙනකුට නින්දගමක් දී තිබෙනවා. අතවලයා නමැත්තා හිස ලස්සනට ගසා දමූ නිසා තව කෙනෙකුට නින්දගමක් දී තිබෙනවා."

අන්න ඒවායි, තමුන්නාන්සේ සඳහන් කළ කරුණු. එදා රජ්ජුරුවන්ගේ රාජ්‍ය පරිපාලනයේ ඉතාමත් වැදගත් සථානයක් හිමි වූයේ මේ රටේ ඉඩම්වලට බව අපට පෙනෙනවා. එදා මුදල් තිබුණේ නැහැ. එදා බදු ගත්තේ නැහැ. රජු විසින් ඉඩම් බෙදා දුන්නා. භාණ්ඩාගාරයට ආදායම එන්නේ එම ඉඩම්වලිනුයි. රජුගේ නිලධාරීන් වශයෙන් කටයුතු කරන උදවියට වැටුප් වශයෙන් දුන්නේ ඉඩම් තමයි. තවත් සේවාවන් තිබෙනවා නම් ඒවා සඳහාත් දුන්නා. එවැනි සේවාවනට මේ මේ ඉඩම්, බෞද්ධ විහාර ආදියට මේ මේ ඉඩම් යනුවෙන් ඔක්කෝම වෙන් කළා. එසේ වෙන් කර අවසානයේ සමහර විට අර අන්දමට රජු සන්තොෂ කරන ලද පුද්ගලයකුටත් නින්දගමක් දෙන්නට ඇති. මා එය නැතෙයි කියනවා නොවෙයි. එහෙත් එදා අනුගමනය කළ ප්‍රධාන කටයුත්ත සම්පූර්ණයෙන් අමතක කර තමුන්නාන්සේ එක් පැත්තක් පමණක් අර ගෙන පෙන්නුම් කරන්නට උත්සාහ කළේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුමක්ද? එදා නින්දගම් දී තිබෙන්නේ මෙවැනි ඉතා සුළු වැඩ නැතිනම් වල් වැඩ කරපු උදවියට බවයි. බොහොම පහත් කොට අප විසින් සැලකිය යුතු අදහසක් ගෙනහැර දක්වන්නට තමුන්නාන්සේ එදා උත්සාහ කළා. අප ඊට විරුද්ධයි.

මා උඩරටියකු වශයෙන් කියනවා, මම නින්දගම් හිමියකු නොවන බව. ඒවාගේම මා නින්දගම් හිමියනට පන්දම් අල්ලන නිලකාරයකුත් නොවෙයි. මා මේවා කියන්නේ ස්වාධීන උඩරටියකු හැටියටයි. නින්දගම් ක්‍රමය නිසා උඩරට හුඟ දෙනෙක් කරදර විඳින එක ඇත්තයි. එහෙත් අවුරුදු දහස් ගණනක පටන් මේ රටේ පැවති නින්දගම් ඉඩම් ක්‍රමය සම්පූර්ණයෙන්ම අපකීර්තියට පත්කොට එදා පැවති රාජ්‍ය ක්‍රමය සම්පූර්ණයෙන්ම හෙළා දැක එසේ කතා කරන්නට ගරු ඇමතිතුමාට අයිතියක් නැති බව මා පෙන්වා දෙන්නට කැමතියි. මා එම වාර්තාව හරියටම කියෙව්වේ නැහැ. කියෙව්වා නම් හරි ලස්සනට කරුණු පෙනෙනවා. එදා රජු ඉඩම් බෙදා දුන්නේ කොහොමදැයි එහි විස්තර වෙනවා. එහි පළමුවන පිටුවේ මෙසේ සඳහන් වෙනවා :

"පොළොවේ අසහාය ස්වාමියා හැටියට තමාට ඇති බලතල අනුව රජු විසින් හෝ ඔහුගේ අණුව පරිදි අනික් කිසියම් නිලධාරියකු විසින් හෝ රජ වාසල වැඩ කටයුතු පවත්වාගෙන යාම සඳහා ගම් ප්‍රදානය කිරීම—"

ඒ කියන්නේ ගබඩාගම් ගැනයි.

"......අතිරේකව රාජ්‍යතන්ත්‍ර, යුද්ධ, සාහිත්‍යයික සේවාවන් සඳහා අනුග්‍රහ වශයෙන් පෞද්ගලික අයට නින්දගම්...... "

ගරු කථානායකතුමනි, රාජ්‍ය තන්ත්‍රය ගෙන යාම සඳහා ඉඩම් තමයි දුන්නේ. අද අපි ඒ සඳහා දෙන්නේ මුදල්. එදා දුන්නේ ඉඩම්. එදා මේ ඉඩම් ඇමතිතුමා රාජ්‍ය තාන්ත්‍රිකයකු වශයෙන් හිටියා නම් උන්නැහේට හම්බවෙන්නෙත් ඉඩමක්. සල්ලි නොවෙයි හම්බ වෙන්නේ. උන්නැහේත් එතකොට නින්දගම් කාරයෙක්. අද අපට තිබෙන්නේ පාර්ලිමේන්තු ක්‍රමයක්. අදත් රජ කෙනකු සිටියා නම්, ඒ වාගේම ඒ රජතුමාගේ ඇමතිවරයකු වශයෙන් මේ ඇමතිතුමා සිටියා නම් නොඅනුමානවම උන්නැහේට හම්බ වෙන්නේ ඉඩමක්. උන්නැහේ ජීවත් වන්නට ඕනෑ ඒ ඉඩමෙනුයි. ඒක ඒ කාලයේ පැවති ක්‍රමයයි. රාජ්‍ය තන්ත්‍රය ගෙන යෑමේ කටයුතු සඳහා, යුද්ධ හමුදා කටයුතු සඳහා, රට ආරක්ෂා කිරීමේ කටයුතු සඳහා ගෙවීම් කෙළේ ඉඩම් වලිනුයි. එතකොට රාජ්‍ය තන්ත්‍ර කටයුතුවලටත් ආරක්ෂක කටයුතුවලටත් වැය කළේ ඉඩම්වලිනුයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තුවක්කුවෙන් නොවෙයිද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේට හැම වේලේම තුවක්කුවමයි, මතක් වන්නේ. මොන කාරණයක් නිසා හැම නිස්සේම තුවක්කුව මතක් වෙනවාදැයි මා දන්නේ නැහැ. මේ රටේ මිනිසුන් තුවක්කු පාවිච්චි කරන්නට පටන් ගත්තේ මෑත යුගයක බව තමුන්නාන්සේ දැන ගන්නට ඕනෑ. ඊට ඉස්සර තුවක්කු පාවිච්චි කෙළේ නැහැ. ඊට ඉස්සර දුනු ඊතල පාවිච්චි කළා; කඩු කිරිච්චි පාවිච්චි කළා. ඊටත් ඉස්සර ගල් මුල් පාවිච්චි කළා; පොලු මුගුරු පාවිච්චි කළා. තුවක්කුව පාවිච්චි කරන්නට පටන් ගත්තේ මෑත යුගයේ. හැබැයි, තුවක්කුව පාවිච්චි කෙළේත් හතුරන්ට විරුද්ධව මිස කුල දේවතාවුන්ට විරුද්ධව නොවෙයි. කුල දේවතාවුන්ට විරුද්ධව තුවක්කු පාවිච්චි වුණේ රාජ්‍ය ඇමතිතුමාගේ මෙහෙයවීම යටතේ 1966 ජනවාරි මස 8 වැනිදායි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
සූරියආරච්චිට මොකද වුණේ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මොකුත් වෙලා ඇති බවක් දැන ගන්නට නැහැ. සූරියාරච්චි මහත්මයා හොඳින් ඉන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ඉතින් මා කියාගෙන ආවේ යම් යම් සේවා සඳහා එදා ඉඩම් ලැබුණු බවයි. සාහිත්‍ය සේවාවට, සාංස්කෘතික සේවයට පවා තෑගි වශයෙන් ඉඩම් ලැබුණා. රජවරුන් නින්දගම් දීමේ හේතු මේ වාතීාවේ හොඳින් පැහැදිලි කර තිබෙනවා. එසේ පැහැදිලි කර තිබෙද්දී පිටුපසින් අවුත් අතවලයාගේ බෙල්ල හොඳින් කැපූ නිසා නින්දගමක් දුන් බව ගරු ඇමතිතුමා මෙහි අවුත් කියනවා. සමහර විට අතවලයාගේ බෙල්ල කැපූ නිසාත් දෙන්නට ඇති. ඒ කාලයේ විතරක් නොවෙයි, මේ කාලයේත් පිටුපසින් ගොස් බෙල්ල කැපීම නිසා තෑගි ලැබී තිබෙනවා. නින්දගම්වලට වඩා වටිනා තෑගි ලැබී තිබෙනවා. මින් ඉදිරියට ඒ ප්‍රතිපත්තිය මේ රටින් තුරන්වේවායි අපි ප්‍රාර්ථනා කරමු. එහෙත් තුරන්වේදැයි සැකයක්ද තිබෙනවා. හොඳයි, මේ ඉඩම් වගී දෙක පමණක් නොව, තවත් ඉඩම් වගී තිබෙනවා : විහාර ගම් තිබෙනවා ; දේවාලගම් තිබෙනවා ; කෝරළ ගම් තිබෙනවා. කෝරළ ගම් ගැන ගරු ඇමතිතුමා අසා තිබෙනවාද ? මේ රාජකාරි ක්‍රමය ඇතුළේ කෝරළ ගම් කියා කොටසකුත් තිබෙනවා. ඒවා ගැන දැන ගෙනද, ගරු ඇමතිතුමා මේ නින්දගම් පනත ගෙනාවේ ? ඉතින් දැන් ඒවායේ සේවය කරන අයට සිදු වන්නට යන්නේ මොනවාද ? මේ ඉඩම්වල පදිංචි වී සිටියවුන් පරම්පරා ගණනක් තිස්සේ වහල් වැඩ කළා. 1815 ට පෙර මේ අය කළ වැඩවල නම් තේරුමක් තියෙනවා. ඒ අය එදා වැඩ කෙළේ රජවරුන් වෙනුවෙනුයි. එහෙත් 1815 න් පසුව වැඩ කළා නම් එසේ කෙළේ ඒ කලින් තිබුණු අදහස අනුව නොවෙයි. 1815 න් පසුව වැඩ කෙළේ නින්දගම් හිමියන්ගේ වහලුන් හැටියටයි. නින්දගම් හිමියන් රජයෙන් ලැබුණු වරප්‍රසාදය තමන්ගේ පෞද්ගලික අයිතියකට හරවා ගත් බව කියන්නට සිදු වී තිබෙනවා. මා කාටවත් චෝදනා කරන්නේ නැහැ. සමහර නින්දගම් හිමියන් සාධාරණ ලෙස ඒවායේ පදිංචිකරුවන්ට සලකා ඇතත් සමහරු අසාධාරණ ලෙස සලකා තිබෙනවා. සමහර විහාර දේවාල ගම්වල වුණත් සාධාරණ අන්දමින් කටයුතු කෙරෙන අතර තවත් සමහර ඒවායේ අසාධාරණ අන්දමින් කටයුතු කෙරෙනවා. මා සාධාරණ උදවියට චෝදනා කරන්නේ නැහැ. අසාධාරණ අන්දමට කටයුතු කරගෙන ගිය අය ඉන්නවා. එහෙත් අප එකක් විශේෂයෙන් මතක තබා ගන්නට ඕනෑ. මේ ඉඩම් ඒ පුද්ගලයන්ට අයිති නැති බව අප පැහැදිළිව මතක තබා ගත යුතුයි. ඉඩම් පිළිබඳ සම්පූර්ණ අයිතිය තිබෙන්නේ රජුටයි. තමන්ගේ සේවය සඳහා පමණයි, මේ ඉඩම් දී තිබුණේ. රජ්ජුරුවන්ට වුවමනා වෙලාවක මේ ඉඩම් ආපසු ගන්නට පුළුවන්. මේ ආණ්ඩුව අද නින්දගම් පනතක් ගෙනැවිත් නිලකාරයන්ට හෝ කාට හෝ මේ ඉඩම් දෙන්නට යනවා නම් මේ ඉඩම්වල අයිතිය තිබෙන්නේ රජයට බව මතක තබා ගන්නට ඕනෑ. ඒවා රජයේ ඉඩම්. රජයේ ඉඩම් රජය දෙනවාය කියන එකයි, මේ පනතේ තේරුම විය යුත්තේ. එහෙම නම්, රජුට හිමිකම් ඇතිව තාවකාලිකව දෙන ලද සියලුම නින්දගම් මේ ආඥා පනත යටතේ අවලංගු කරන ලදී, කියා මේ පනතට වගන්තියක් ඇතුළත් කරන්නට රජයට පුළුවනි. එහෙත් එහෙම වගන්තියක් මේ පනතෙ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දෙවැනි වගන්තියේ හෝ තුන් වැනි වගන්තියේ තියෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

දෙවැනි වගන්තියෙත් නැහැ. තුන් වැනි වගන්තියෙත් නැහැ. එසේ අවලංගු කිරීමේ අවශ්‍යතාවක් තිබෙන්නේ කුමක් නිසාද යන්න මම තව ටිකකින් කියන්නම්.

මේ පනත යටතේ නින්දගම් "දරන්නාට" දෙනවාය කියා එදා කිව්වා; "නිලකාරයාට" දෙනවාය කියා අද කියනවා. නිලකාරයකු නැති නින්දගම් අක්කර දහස් ගණනක් මේ රටේ තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවද ? 1832 දී ඉංග්‍රීසි ආණ්ඩුව නීතියක් පනවා රාජකාරී ක්‍රමය අහෝසි කළාට පසු නිලකාරයන් කියන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජාතිය නැති වුණා. මොනවා හෝ පොඩ්ඩක් ඒ නින්දගම්හිමියන්ට දී අල්ලා ගෙන ඉන්න ඉතා සුළු පිරිසක් ඉන්නවා. විශාල පිරිසක් අහකට යැව්වා. කිසිවක් කරන්නෙ නැතිව කැලෑ බවට පත් වුණු අක්කර දහස් ගණනක් අද තියෙනවා. විශාල කොම්පැනිවලට තේ, රබර්, පොල් වවන්නට බදු දී තිබෙනවා, අක්කර දහස් ගණනක්. ඒ ඉඩම්වලට මොනවා කරන්නටද ලෑස්ති වී තිබෙන්නේ ? ඒවා කාටද අයිති වන්නේ? අප එදා කැගැහුවට පස්සෙ නිලකාරයා ගැන පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර තිබෙනවා. තමුන්නාන්සේ ඉදිරිපත් කළ පනතෙන් කල්පනා කෙළේ ඒක නොවෙයි. "දරන්නා" කියන වචනය යෙදීමෙන් තමුන්නාන්සේ එදා කල්පනා කෙළේ, අක්කර දහස් ගණනක ඒ ඉඩම අද දරණ තැනැත්තාට—නින්දගම් හිමියාට—එය සින්නක්කර කර දීමටයි. "දරන්නා" කියන වචනයෙන් අදහස් කරන්නේ "නිලකාරයා" ය කියා අද කියනවා. එදා හිටපු තැනින් අද ටිකක් එහාට ගිහින් තියෙනවා.

නිලකාරයකු නැති නින්දගම්වලට මේ පනත යටතේ සිදු වන්නේ කුමක් ද කියායි, අප අහන්නෙ. පනාමුරේ නින්දගම් කොයි තරම් කැලේ තියෙනවද? ඒවා අයිති වන්නේ පිළවුන්ටද, වඳුරන්ටද, එහෙම නැත්නම් කාටද ? අවංකව වැඩේ කරනවා නම් මේ රටේ නීතියේ හැටියට සියලුම නින්දගම් අයිති මේ රටේ රජයටය කියා ඒවා කෙළින්ම රජයට ගෙන, දැනට ඒවා භුක්ති විඳින සාමාන්‍ය මිනිසුන්ට ඒවා සින්නක්කර ඔප්පුවකින් පවරා දෙන්න. ඒවා රජයට ගෙන ගොවිතැන් කරන දුප්පත් මිනිසුන්ට අක්කර 10, 15 ආදී වශයෙන් බෙදා දෙන්න. අක්කර 2,000, 3,000, 5,000 ආදී වශයෙන් ලොකු මිනිසුන්ට හෝ කොම්පැනි කාරයන්ට ඒවා දෙන්න එපා. ගොවිතැන් කරන දුප්පත් මිනිසුන්ට ඒවා දෙන්න. ඒක කරන්නෙ නැහැ. එදා "දරන්නා" කියන වචනය ඇතුළත් කෙළේ නින්දගම් හිමියාට අර ඉඩම් අයිති කර දෙන්නටයි. ඉඩම් ඇමතිතුමාගේ කුරුමාණම වැරදුනා. නිලකාරයා කියන වචනය ඇත් ඉදිරිපත් කර තිබෙනවා.

මා ඊයේ පෙරේදා ගියා, උතුරු-මැද පළාතට—රජ රටට. රජරට නින්දගම්කාරයන් දැන් ඒ ඉඩම් ප්‍රසිද්ධියේ—වෙන්දේසියේ—විකුණාගෙන යනවා, පනත සම්මත වන්නට ඉස්සර වෙලා. පනත සම්මත වුනාට පසු මොනවා වේවිද කියා දන්නෙ නැති නිසා ඉක්මනටම ඒ ඉඩම් විකුණාගෙන යනවා. ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත අනුව නම්, ඇත්ත වශයෙන් නිලකාරයන් වන්නේ ඒ ඉඩම් සල්ලිවලට ගත් අය තමයි.

බණ්ඩාරගම්ද, නින්දගම්ද මා දන්නේ නැහැ, හුරුල්ලේ ඇමතිතුමා තමන්ගේ ඉඩම් නිකම් දුන්නා යැයි ඉඩම් ඇමතිතුමා එදා කීවා. ඒ ඉඩම්වල වෙනස්කම් තිබෙනවා. මම එයත් පැහැදිලි කරන්නම්. සමහර විට හුරුල්ලේ ඇමතිතුමා නිකම් දී තිබෙන්නේ මාමාගේ පංගුව නැත්නම් නැන්දාගේ පංගුව වන්නට පුළුවනි. කෝක වුනත් උන්නැහේ නිකම් දීලාලු. මා ඒ ගැන සොයා බැලුවා. අකුරණ පැත්තේ මුදලාලිලාට ඒවා විකුණා තිබෙනවා. තව දුරටත් ඒ ගැන සොයා බැලීමේදී, තත්ත්වය ඊටත් වඩා භයානක බව පෙනී ගියා. ඒවා නින්දගම් නොවෙයි, වෙනත් ජාතියක්. කෝරළගම් ගැන දන්නවාදැයි ඉඩම් ඇමතිතුමාගෙන් මා ඇහුවේ ඒ නිසයි. හුරුල්ලේ ඇමතිතුමා දී තිබෙන්නේ, ඉඩම් ඇමතිතුමාගේ හැන්සාඩ් වාර්තාගත කථාවේ සඳහන් පරිදි නින්දගම් නොවෙයි, කෝරළගම්. හුරුල්ලේ ඇමතිතුමා තමාගේ නින්දගම් ඉඩම් දැනටමත් දී ඉවර බව, ඉඩම් ඇමතිතුමා මේ ගරු සභාවේදී කීවා. එහෙත් උන්නැහේට නින්දගම් නැහැ; තිබෙන්නේ කෝරළගම්. මෙවැනි අවස්ථාවක එය පැහැදිලි කළ යුතුමයි. තත්ත්වය එසේ බැවින්, මේ විධියේ පනත් කෙටුම්පතක් අනුමත කරන්නට අපට පුළුවන්කමක් නැහැ. මේ ප්‍රශ්නය නියම විධියට විසඳෙන ආකාරයට රජය පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනවා නම්, එය සම්මත කර ගැනීම සඳහා විරුද්ධ පාර්ශ්වයේ සම්පූර්ණ සහයෝගය ලැබෙන බව මා දන්නවා.

අනෙක් කාරණය මෙයයි: හැම නින්දගමක්ම දී තිබෙන්නේ එක විධියට නොවෙයි. සමහර නින්දගම් දී තිබුණේ ඒ නින්දගම් ලබන පුද්ගලයන්ගේ ජීවිත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

කාලයෙන් නැත්නම් රාජකාරි කාලයෙන් එහි හිමිකම් අවසාන වන විධියටයි. තවත් සමහර නින්දගම් ඉදිරියේදී ඔහුගේ පරම්පරාවටත් අයිති වන ආකාරයට දී තිබුණා. ඒවාට පරම්පරාගත නින්දගම් හෙවත් පරවේණි නින්දගම් කියනවා.

ඒ පරවේණි නින්දගම්වල කොටස් 3ක් තිබුණු බව ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. එකක් බණ්ඩාර පංගුව. අනෙක මුත්තෙට්ටු පංගුව. තුන් වැන්න උයන් වත්ත. මේ පනත් කෙටුම්පත ගෙනෙන විට, ඒවා ගැන ඇමතිතුමා දැනගෙන ඉන්න ඕනෑ. උසාවි ඉදිරියේ නීති ප්‍රශ්න මතු කොට, පනත ඉවතට විසි කරන්නට ඉඩ තබන්න බෑ. ඒ බණ්ඩාර පංගුව එම පුද්ගලයාට සම්පූර්ණයෙන්ම අයිති වන විධියටයි, ඒ කාලයේ රජවරුන් බලය දී තිබුණේ. එහෙත් මේ පනතේ එය පෙන්නා දී නැහැ. මා දන්නා හැටියට නම් එය තවත් කෙනකු සන්තක කරන්නට බැහැ. එහෙත් මේ පනත් කෙටුම්පතින් එය වෙනස් කර නැහැ.

බණ්ඩාර පංගුව කියන්නේ මොකකට ද? විහාරගෙය පිහිටි ඉඩමටයි, බණ්ඩාර පංගුව කියන්නෙ. විහාරගමක නම් විහාරය පිහිටි ඉඩම, දේවාල ගමක නම් දේවාලය පිහිටි ඉඩම, බණ්ඩාර පංගුව යනුවෙන් හැඳින්වෙනවා. ඒ බණ්ඩාර පංගුව ඒ අයට සින්නක්කර වම අයිතියි. රජතුමා ඒ අයට බණ්ඩාර පංගුවේ අයිතිය පෞද්ගලිකවම පවරා තිබුණා. එය තව කෙනෙක් සන්තක කරන්නට බැහැ. එහෙත් මේ පනත් කෙටුම්පතේ ඒ ගැන පැහැදිලි කිරීමක් නැහැ. අපට වුවමනා කරන්නේ වඩාත් පැහැදිලි අන්දමින්, නියම විධියට ක්‍රියාත්මක කළ හැකි පනතකුයි. එවැනි පනත් කෙටුම්පතක් මේ ගරු සභාවට ඉදිරිපත් කළොත් පමණයි, නියම ප්‍රයෝජනය ලැබෙන්නේ. එහෙම නැත්නම් ප්‍රයෝජනයක් වන්නේ නැහැ. අප තමුන්නාන්සේලාට මතක් කරන්නේ, එයයි.

මේ වාර්තාව ඇමතිතුමා නොකියවූ නිසා, එතුමාගේ දැනගැනීමටත් එක්ක මම කියවන්නම්:

"බොහෝ විට පුද්ගලයන්ට ඉඩ කඩම් (නින්දගම්) ප්‍රදානය කරන ලද්දේ රජ්ජුරුවන්ට කරන ලද සේවය සඳහා හෝ නිලයට අයත් උපාංගයක් වශයෙන් හෝ වේ. මේ දීමනා පරම්පරාගත හෝ ජීවිත කාලයට පමණක් සීමා වූ හෝ ඒවා විය. ඩොයිලි කියන්නාක් මෙන්, 'නින්දගමක් වනාහි ඒ කාල සීමාව සඳහා, එය ලැබූ පුද්ගලයාගේ නොහොත් තාවකාලික ප්‍රධානයාගේ මුළු දේපල වන්නේ ය. ඉදින් රජ්ජුරුවන් විසින් සන්නසක් මගින් නියත වශයෙන්ම ප්‍රදානය කරන ලද්දේ නම් එය පරවේණියක් බවට පත් වේ.' කෙසේ වුව ද සියලුම ඉඩ කඩම් හුදෙක් රජ්ජුරුවන්ගේ දීමනා මාත්‍රයෙන් ලබාගත් ඒවා හෙයින්, ඔහුගේ අභිමතය අනුව කැමති විටෙක ඒවා ආපසු ගත හැකි වූ බවත්, එයින් නිදහස්ව, කිසිම පුද්ගලයකුට හෝ බල මණ්ඩලයකට ඒවා අයිති කරගෙන සිටීමට නොහැකි වූ බවත් පෙනේ."

නින්දගම් ඉඩම්, විහාර දේවාලගම් ඉඩම්වල අයිතිය පිළිබඳ තත්ත්වය ඒකයි. එහෙම නම්, ඇත්ත වශයෙන්ම රජයට අයිතිව තිබුණු ඒ ඉඩම්වලින් කොටසක් අද නිලකාරයින් සතු කිරීමට ගරු ඇමතිතුමා පනතක් ගෙනැවිත් තිබෙන මේ අවස්ථාවේදී අප එතුමාට මතක් කරන්නේ, රජ්ජුරුවන්ට අයිති ඉඩම්වලින් විශාල කොටසක් තවදුරටත් නින්දගම් හිමියන් අතේ තබා ගැනීමට ඉඩ දීම වැරදි බවයි; ඒවාගේම එම ඉඩම්වලින් විශාල කොටසක් තවදුරටත් මේ රටේ තේ, පොල්, රබර් වැවූ විදේශීය කොම්පැනිකාරයින් අතේ තබා ගැනීමට ඉඩ දීම වැරදි බවයි. ගරු ඇමතිතුමා ඇත්ත වශයෙන්ම අවංකව මේ අදහසට එකඟ වෙතොත්, රජයට අයිති එම ඉඩම්වලින් කෙළින්ම මහ ජනයාට ප්‍රයෝජන ගත හැකි වන අන්දමට ඒවා රාජසන්තක කරන බව කියැවෙන වගන්තියක් මෙම පනතට එකතු කරන්නට ඕනෑ. එසේ කරන මෙන් මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ නොකර, කොහේ හෝ කැලෑවක මුල්ලක තිබෙන ඉඩමක් මිනිහකුට දෙන්නට නම් මේ විධියේ පනත් මේ ගරු සභාවට ඉදිරිපත් කරගෙන කරදර වන්නට වුවමනාවක් ඇත්තේ නැහැ.

ගරු ඉඩම් ඇමතිතුමා මේ පනත ඉදිරිපත් කර තිබෙන්නේ නින්දගම් නිලකාරයින්ට පවරා ඒවායේ සම්පූර්ණ බලතල ඔවුන්ට දීමටයි. එහෙත්, තමුන්නාන්සේ කියන දේවල් ගැන අපට නොයෙක් විට සැක ඇති වෙනවා. තමුන්නාන්සේ මේ ගරු සභාවටත් රටටත් නොයෙක් දේ කියා තිබෙනවා. ආණ්ඩුවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බදු ඉඩම්වල පදිංචි අයට එම ඉඩම් සින්නක්කර කොට දෙනවායයි තමුන්නාන්සේ කියා තිබෙනවා. එහෙත් අද වන තුරු කොහේවත් එසේ දී නැහැ. දියබද්ද අවලංගු කරනවායයි තමුන්නාන්සේ තවත් අවස්ථාවකදී කිව්වා. තවම ඒකත් කෙරී නැහැ. ඔය විධියේ නොයෙක් දේවල් ගරු ඉඩම් ඇමතිතුමා මේ ගරු සභාවටත් රටටත් කියා තිබෙනවා. මේ රටේ කෘෂිකර්මය දියුණු කරන්නට ගරු අගමැතිතුමා කොතරම් මහන්සි ගත්තත්, කොයි තරම් විශාල වැඩ පිළිවෙළවල් ඉදිරිපත් කළත්, ආහාරයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ ව්‍යාපාරයේ ඉතා වැදගත් තැනක් ගන්නා වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපාරය මේ වගේ වැඩ පිළිවෙළක් නැති, ප්‍රතිපත්තියක් නැති, කියන දේ කරන්නේ නැති ඇමතිවරයකු යටතේ තිබෙන තුරු ඒ ව්‍යාපාරය කවදාවත් සාර්ථක කර ගන්නට බැරි බවයි අපට කියන්නට සිදු වී තිබෙන්නේ. මේ ගරු සභාවෙහිදී මෙන්ම පිටතදීත් අපට එය කියන්නට සිදු වී තිබෙනවා.

ගරු ඇමතිතුමාට නම් කිසිම බරක් නැහැ. අප මේ රට ආණ්ඩු කරන කාලයේ දීත් එතුමා ඔතැනම වාඩි වී සිටියා. ඒ කාලයේ සිටම එතුමා මේවා අහල අහලා දැන් කොපමණ දේ කිව්වත් එතුමාට කිසිම ගණනක් නැහැ. මොනවා කිව්වත් එතුමා හිනා වෙනවා. කණ්ඩායම් රැස්වීමේදී එතුමා ඔයිට හපන්. දෙස්ස කැපිල කැපිලා දැන් එතුමාට කිසිම ගණනක් නැහැ. හොඳට හිනා වෙවී වාඩි වෙලා ඉන්නවා. ඔය විධියට රට කරන්න බැහැ ගරු ඇමතිතුමනි ! යම් වැඩක් කරන විට ඒ පිළිබඳ නියම සැලැස්මක් ප්‍රතිපත්තියක් වැඩ පිළිවෙළක් ඇතිව, ඒ පිළිබඳව හොඳට හිතා බලා, ඒ සම්බන්ධයෙන් ඉස්සර පැවැති ක්‍රම තේරුම් ගෙන, ඒ ක්‍රමවලට සරිලනාකාරයට කටයුතු කරන්නට ඕනෑ. එසේ කරන්නට තමුන්නාන්සේ ලැස්ති වන්නේ නැත්නම් රටත් ඉවරයි; ජාතියත් ඉවරයි. තමුන්නාන්සේ නම් ඉවර වුණාට කමක් නැහැ. ඒක කවදා හෝ කෙරෙනවා. නමුත් රටත් ජාතියත් තිබෙනවා. රටත් ජාතියත් තිබෙන්නට ඕනෑ.

නින්දගම් ගැන මා තවත් කාරණයක් පැහැදිලි කරන්නට සතුටුයි. මේ ප්‍රවේණි නින්දගම් නැත්නම් පරම්පරාවට යන නින්දගම්වලට පමණයි සන්නස් තිබුණේ. ජීවිත කාලයට දී තිබුණු නින්දගම්වලට සන්නස් නැහැ. ඔය නින්දගම් සන්නස් ලියාපදිංචි කළ කාලයේ සමහරුන් කළ දේවල් ගැන අප අසා තිබෙනවා. ඒ කාලයේ සමහරු ඒ නියම සන්නස් හොරකම් කළා. හොරකම් කර බොරු සන්නස් ඉදිරිපත් කර තිබෙනවා. ඒ කාලයේ සිටි ඉංගිරිසි නිලධාරීන් මේ සන්නස් කියන්නේ මොනවාද, මේවා ලැබුණේ කොහොමද කියා දන්නේ නැහැ. මේ ලියකියවිලි පිළිබඳව ඔවුන්ට කිසිම දැනුමක් තිබුණේ නැහැ. සන්නස්වලින් ඉඩම් අයිතිව නොතිබුණු උදවියටත් දැන් නින්දගම් ඉඩම් තිබෙනවා. නියම සන්නස් හොරකම් කර තිබෙනවා ; සඟවා තිබෙනවා. නියම සන්නස් හොරකම් කර නැත්නම් සඟවා බොරු සන්නස්, වෙන කෙනෙකුගේ නමින් බොරු සන්නස්, ඉදිරිපත් කර තිබෙනවා. අර සන්නස් තිබුණු පරම්පරාවල අය දැන් එක ඉඩම් කෑල්ලක්වත් නැතිව දුක් විඳින අතර හොර සන්නස්වලින් දැන් සමහරුන් නින්දගම් අයිතිකරුවන් වී සිටිනවා.

එවැනි උදවිය නැද්ද කියා ප්‍රවාහණ ඇමතිතුමාගෙන් අසන්න. ඒ නින්දගම් අයිති වුණේ කොහොමද කියා එතුමාගෙන් අසන්න. ප්‍රවාහණ ඇමතිතුමාට නින්දගමක් තිබෙනවාය කියා එදා කිව්වා. ඒ සන්නස් කාගෙද යන්නත් ඒ සන්නස් සැඟවූ සැටිත් මා දන්නවා. ඒ සන්නස් සඟවා හොර සන්නස් ඉදිරිපත් කර ලියාපදිංචි කළ සැටිත් මා දන්නවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
ඒක චෝදනාවක් වශයෙන්——

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
නැහැ, ඇමතිතුමා නොවෙයි. ඇමතිතුමාගේ පරම්පරාවේ හත් දෙනෙකුට පමණ උඩ කෙනෙක්. එවැනි දේවල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ඕනෑ තරම් වුණා ඒ කාලෙ. දැන් ඒ ඇමතිතුමාට ඒ නින්දගම් විකුණන්නට පුළුවන් වුණේ ඒ පරම්පරාවේ කවුරු හරි කෙනෙක් කළ ඒ වැඩේ නිසයි. මා ඒ ගැන දන්නවා. ඒ නින්දගම් කාගෙද කියා අසන්න ඔය රජරට මන්ත්‍රීවරුන්ගෙන්. එවැනි දේවල් මධ්‍යම පළාතෙත්, ඌව පළාතෙත්, රජරටත් සිද්ධ වුණා. සෑම තැනම එවැනි දේවල් සිද්ධ වී තිබෙනවා. වන්නියෙත් සිද්ධ වෙලා ඇති. ඇයි, ඒ දවස්වල ඉංගිරිසි රාජ්‍යය ඇති වුණාම අපේ මිනිසුන් භය වුණා. සටන් කාමීව, ජාත්‍යාලයෙන් වැඩ කළ මිනිසුන් ඒ අවස්ථාවේදී සැඟ වුණා. එසේ සැඟවුණු අවස්ථාවේදී පන්දම්කාරයො ටිකක් ඉස්සරහට පැන්නා. ඒ සමහරු අවංකව තමන්ට තිබුණු රාජකාරිය කළා. සමහරු බොරුවට ආවා. බොරුවට ආපු අයට සන්නස් තිබුණේ නැහැ. ඒ අය බොරු සන්නස් ඉදිරිපත් කර ඒවා ලියා පදිංචි කරවා ගත්තා. ඒක සම්පූර්ණ ඇත්තක්. එම නිසා මේ සන්නස් ගැනත් ටිකක් පරීක්ෂාකාරී වන ලෙසයි අප කියන්නෙ. සන්නස් තිබුණු පළියට මේ ඉඩම් දෙන්නට එපා. මේ ඉඩම් සියල්ලම කෙලින්ම රජයට ගන්න. රජයට අරගෙන මේ රටේ දුප්පත් මිනිසුන්ට දෙන්න.

ඇත්ත වශයෙන් මා මේ අවස්ථාවේදී හිටපු කෘෂිකර්ම ඇමතිවරයකු වන අපේ වර්තමාන කර්මාන්ත ඇමතිතුමාට ස්තුති වන්ත වෙනවා. එතුමා එදා කුඹුරු පනත ඉදිරිපත් කළ අවස්ථාවේදී කෙලින්ම, ප්‍රතිපත්තියක් හැටියට, අර ඉඩමය, මේ ඉඩමය, කියා වෙන් නොකර සෑම කුඹුරක්ම ඒ කුඹුරු පනතට යටත් කළා. ඒ ප්‍රතිපත්තිය අනුව එතුමා යම් වැඩ පිළිවෙළක් ගෙන ගියා. අදත් දවසකට දෙතුන් වර බැගින් ඒ කුඹුරු පනතේ අගය ගුවන් විදුලියෙන් කියනවා අපට ඇසෙනවා. ඔව්, හොඳ දෙයක් කළාම, එය කවුරු කළත්, හැමදාම අපට එහි අගය කියන්නට පුළුවනි. ඒ විධියට මේ පනත් කෙටුම්පතත් ඉදිරිපත් කරන්නට අවස්ථාව තිබුණා. නමුත් ඇමතිතුමා සැලකුවේ නැහැ. ඇමතිතුමා නිකම් කසාය වට්ටෝරුවක් වැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර අපට එය භාර ගන්නටය කියනවා.

ගරු කථානායකතුමනි, නින්ද හිමියා නැත්නම් නින්ද අධිපති කියන මේ තැනැත්තා රජයේ සේවකයෙක්. ඒ රජයේ සේවකයා ඒ ඉඩම් භුක්ති විඳින්නේ නැත්නම් ඒවා පාලනය කරන්නට දෙදෙනෙකු යොදා තිබුණා. සමහරු නිලකාරයෙකු යොදා තිබුණා. සමහරු බදුකාරයකු යොදා තිබුණා. දැන් ගරු ඇමතිතුමා මේ සංශෝධනයෙන් ඒ බදුකාරයා කපා හැර තිබෙනවා. එදා මේකෙ බදුකාරයා තිබුණා. ඉංග්‍රිසි පිටපතේ තිබෙන වචනයට මේ සිංහල පිටපතේ තිබෙන වචනය වැරදි බව අප එදා පෙන්වා දුන්නා. ඉංග්‍රිසි වචනයේ තේරුම සිංහල පිටපතේ නැති බව අප පෙන්වා දුන්නා. "ටෙනන්ට් ඇට් විල්" කියා ඉංග්‍රිසියෙන් තිබුණු වචනයට සුළු බදුකරු යන වචනය යොදා තිබුණා. ඒ අදහස වැරදිය, සිංහල පිටපතේ තිබෙන මේ වචනය ඊට වැඩිය වෙනස් අදහසක් දෙන වචනයක්ය කියා අප කරුණු පෙන්වා දුන්නා. ඒ අවස්ථාවේදී තමුන්නාන්සේ අපට "අභිමත පරිදි වෙනස් කළහැකි බදුකරුවකුය" යන්න කඩදාසියක ලියා දුන්නා. ඒක අද නැහැ. අද කියනවා "මාරුවෙන පංගුකාරයා" කියා. මාරුවෙන පංගුකාරයා කියා කෙනෙක් සිටි එක ඇත්ත. එහෙත් බදුකරුගෙයි මාරුවෙන පංගුකරුගෙයි වෙනසක් තිබෙනවා. මාරුවෙන පංගුකරු පරම්පරාවටම ඒ ඉඩම පාවිච්චි කරන කෙනෙක් වෙන්න පුළුවන්. මාරුවෙන පංගුකරු රාජකාරියක් කරන කෙනෙක් වෙන්න පුළුවන්. බදුකරු ඒ එකක්වත් නොකරන කෙනෙක් වෙන්න පුළුවන්. බදුකරු කියන්නේ කවුද, පංගුකරු කියන්නේ කවුද, කියන එක මම පැහැදිලි කර පෙන්වන්නම්. ගරු ඇමතිතුමා එකක් කඩතොළු මකා ගන්නට ගොස් කඩතොළු රාශියක් හදාගෙන තිබෙනවා කියා පටන් ගැනීමේදීම මා කීවේ ඒ නිසයි. ගරු ඇමතිතුමාට මෙයින් ගැලවෙන්නට බැරි වන විට කියාවි වෙන දවසකට කල්දමනවාය කියා. අර ගොල්ලන්ට ඉඩම් ටික විකුණා ගන්න කල් දෙන්නත් එපායෙ. බදුකරු කවුද කියා මම පැහැදිලි කර දෙන්නම්. මේ කොමිෂන් සභා වාර්තාවේ 10 වැනි පිටුව බලන්න. එහි මෙන්න මෙහෙම කියා තිබෙනවා.

"මෙසේ ගම් ප්‍රදානය කරනු ලැබූ විහාර, දේවාල හා පෞද්ගලික අය, එම ගම්වල අධිපතීන් හෙවත් හිමිකරුවන් බවට පත්වූ අතර, තමන්ගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධිපතිත්වය යටතේ එසේ ඉඩ කඩම් පාලනය කළ තැනැත්තෝ, පසු කාලයකදී නිලකාරයෝ හෙවත් බදුකාරයෝ යන නමින් ප්‍රසිද්ධ වූහ."

සමහරවිට ඒ අයට නිලකාරයා කියාත් පාවිච්චි කළා; සමහරවිට බදුකාරයාකියාත් පාවිච්චි කළා. දෙදෙනාම කළේ එක වැඩේ. බදුකාරයා කියන්නේ මාරුවෙන පංගුකාරයා නොවෙයි. බදුකාරයා කියන් නෙත් නිලකාරයාටමයි. සමහර අවස්ථා වලදී නිලකාරයා කියනවා; සමහර අවසථා වලදී බදුකාරයා කියනවා. මෙය හරියට සිංහලෙන් තේරුම් කරනවා නම් නිලකාර යෝ හෙවත් බදුකාරයෝ. සමහර කාලවල දී නම් නිලකාරයා කියන්නෙත් බදුකාරයා කියන්නෙත් එක්කෙනාටම නොවෙයි. ඒ අනුව ගරු ඇමතිතුමාගේ අලුත් සංශෝධ නයෙන් එතුමා තවත් අමාරුවක වැටුණා. ඒ නිසා තව ටික වේලාවකින් ගරු ඇමති තුමා මොනවා කියාවිද දන්නේ නැහැ. ඒ නිසා මෙම වැරදි නිවැරදි කිරීමට ගරු ඇමතිතුමා කටයුතු කරනවාද නැද්ද කියන එක අපි දන්නේ නැහැ. එහෙත් එම වැරදි නිවැරදි කිරීමට එතුමා ක්‍රියා කර නවා ඇත කියා අප විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මේ නින්දගම් බුක්තිවින්දේ කෙසේද, මේවායේ අයිතිය තිබුණු අය කීදෙනෙක් හිටියාද යන්න මෙහි හොඳට පැහැදිලි කර තිබෙනවා. මම තවදුරටත් පැහැදිලි කරන්නම්. අධිපති යන්ට අයත් මුත්තෙට්ටු නැත්නම් කුඹුරු —ඔය මුත්තෙට්ටු කියන්නෙත් කුඹුරු වලටමයි—පාවිච්චි කළ ක්‍රම කීපයක් තිබුණා. එකක් නිසද මුත්තෙට්ටු. නිසද මුත්තෙට්ටු ගැන මේ වාර්තාවේ කියන්නේ මෙහෙමයි:

"තමන්ට දී ඇති ඉඩ කඩම් වෙනුවෙන් නිලකාර යන් විසින් හුදෙක් අධිපතියාගේ ප්‍රයෝජනය සඳහා වැඩවසම් ක්‍රමයට වගා කරන්නා වූ ද, දීමනාව මගින් සපයා ඇත්තා වූ ද නිසද මුත්තෙට්ටු".

ගරු කථානායකතුමනි, ඒවායේ වැඩ කළේ නිලකාරයාත් නොවෙයි. හොඳට තේරුම් ගන්න. මේවායේ වැඩ කළේ සාමාන්‍ය වැසියෝ. නින්ද හිමියාට අයිති කුඹුරේ අහවල් දවසට පැමිණ වැඩ කරන්න ඕනෑය කියා නිලකාරයා නියෝග කරනවා. පැමිණ වැඩ කරන්නේ රට වැසියා. නිලකාරයා කරන්නේ ඒ අය ලවා වැඩ කරවා එහි අස්වැන්න අධිපතියාට

ගෙනගොස් දීමයි. ඇත්ත වශයෙන්ම අවංකව කල්පනා කරනවා නම් මේ ඉඩම් අයිති විය යුත්තේ නිලකාරයාට නොවෙයි. අරයා අයිතිකාරයා; මෙයා පන්දම්කාරයා; වැඩ කළේ වෙන අය. එසේ වැඩ කළ අයට මේවා අයිති වන්නට යම්කිසි ක්‍රම යක් සලස්වන්නට පුළුවන් නම් ඒක තමයි ඉතාම උචිත ක්‍රමය. වැඩ කළ මිනි හාට, තමන්ගේ දහඩිය වගුරුවාපු මිනි හාට අයිති වන්නට මොකක් හෝ ක්‍රමයක් මෙයින් ඇති කර තිබෙනවා නම් ඒක තමයි වඩා උචිත ක්‍රමය වන්නේ. හොඳට බලන්න, 4 වැනි ඡේදයේ දහවැනි පිටුවේයි එය තිබෙන්නේ. ඔය එකක් පමණයි. තවත් එකක් තිබෙනවා.

"රාජ්‍ය සන්තක වීමෙන් ත්‍යාග වශයෙන් හෝ මිළ දී ගැනීමෙන් අධිපතියා විසින් ලබා ඇත්තා වූ ද, නොමිලයේ වැඩ කරවා ගැනීමට ඔහුට බලයක් නැත්තා වූ ද, අද මුත්තෙට්ටු අයිතිකරුවාට අස් වැන්නෙන් අඩක් දීමේ පොරොන්දුව පිට ඕනෑම කෙනෙකුට මේවා වගා කළ හැකිය, හෝ කරවිය හැකිය."

අඳකාරයාට භාගයක් දෙනවා. සාමාන්‍ය මිනිහාට අඳයක් හැටියට අඩක් තිබෙ නවා. ඉතිරි හරිය අධිපතියාට දෙනවා. ඒ විධියටයි දෙන බව පෙන්වා තිබෙන් නේ. එහෙමයි සිද්ධ වුණේ. එහෙත් ගරු ඇමතිතුමා අද කරන්නට යන්නේ කුමක්ද? ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ පනතින් නම් ඔය කියන අඳකාරයාට නැත්නම් අඳයට වැඩ කළ තැනැත්තාට ඉඩම් අයිති වන්නේ නැහැ. එහෙම නම් ඒවා අයිති වන්නේ කාටද? නිලකාරයා ටයි මේ ඉඩම් අයිති වන්නේ. වෙනත් වචනවලින් කියනවා නම් නින්දගම් අයිති කාරයාගේ පන්දම්කාරයාට නැත්නම් කංකානිටයි අයිති වන්නේ. වැඩ කළ ගොවියාට ඉඩම් අයිති වන්නේ නැහැ. කුඹුරු පනතට වෙනස් අන්දමට හිතා මතා කළ දෙයක් හැටියටයි මෙය විස්තර කරන්නට තිබෙන්නේ. මේ කාරණය පැහැදිලිවම කියන්නට ඕනෑ. 1957 දී ඉදි රිපත් කරන ලද කුඹුරු පනතින් ගොවි යාට අඳ අයිතිය හම්බ වෙනවා. ගොවියාට ඉඩමේ සින්නක්කර අයිතිය දිය යුතුව තිබෙනවා. ඉතිහාසය බලන විට මේ කාර ණය පෙනී යනවා. එහෙත් ගරු ඉඩම් ඇමතිතුමා කර තිබෙන්නේ කුමක්ද? නිලකාරයා කියා තවත් කෙනකු හදනවා. නික්ම ඉඳලා අස්වැන්නෙන් අඩක් ලබා

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ශන්නට පුළුවන් තත්ත්වයක් ඔහුට ලැබෙනවා. පන්දම්කාරයාට, නිලකාරයාට වාසියක් ලැබෙන විධියට මෙය පිළියෙල කර තිබෙනවා. කුඹුරු පනතයි, මේකයි දෙක එකට හැප්පෙනවා. මේවා ගැන මොන විධියකටවත් කල්පනා කර නොවෙයි, ගරු ඉඩම් ඇමතිතුමා මෙය සකස් කර තිබෙන්නේ. ඒකට මේක හැප්පෙනවා.

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

කුඹුරු පනතටත් විරුද්ධ වුණා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්, ඒක අප දන්නවා. දැන් වෙනත් වැඩ පිළිවෙළක් අනුව එය කඩාකප්පල් කර දමන්නට කටයුතු කරගෙන යනවා. වාර්තාව කියෙව්වා නම් මේ පනත ඉදිරිපත් කරන්නේ නැහැ, මේ වියධිට. අධිපතියාගේ නියෝග අනුව ගිහිල්ලා වැඩ කරවා දුන් තැනැත්තාට දෙකෙන් පංගුවක් ලැබෙන විධියටයි සකස් කරන්නේ. වැඩ කළ මිනිහෙක් ඉන්නවා. ඒ මිනිහාට දෙන්නේ නැහැ. පන්දම්කාරයාට, නිලකාරයාට තමයි දෙන්නේ. එදා ගෙනා දෙය වැරදි බව කියා සිටියාම අද වෙනත් විධියට සකස් කරගෙන ආවා. අද පන්දම්කාරයාට දෙන යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. වැඩ කළ මිනිහාට අයිතියක් දෙනවාද ? විවේචනය කරන්නට ඕනෑ නිසා මේවා කියනවා නොවෙයි. කරුණා කර මේ ගැන කල්පනා කර බලන්න; සොයා බලන්න. නීති උපදෙස් දෙන අය එතුමාට වැරදි උපදෙස් දෙනවා වෙන්නට පුළුවනි. ඉලෙක්ෂන් කාලයේදී කලබලයක් කළ බව සැබෑවක් වුවත් දැන් ඒවා අවසන් වී අවුරුදු දෙකක් තරම් ගත |වී තිබෙන නිසා නියම තත්ත්වය ගැන සලකා බලා ක්‍රියා කළ යුතුව තිබෙනවා.

ගරු ඇමතිතුමා කැමති නම් නිලකාරයන්සතු කළ යුතු ඉඩම් තිබෙනවා. එතුමා නිලකාරයන් සතු කළ යුත්තේ නින්දගම් නොවෙයි. (ආ) කොටස බලන්න. මම එය කියවන්නම් :

"පරවේණි පංගු හෙවත් නිලකාරයන්ගේ කොටස්. යම්කිසි සේවයක් ඉටු කිරීමට යටත්ව කොටස්කරුවන් එක් අයකු හෝ වැඩි දෙනකු විසින් බුක්ති විඳිනු ලබන ඉඩම් කොටස් හෙවත් භාග පරවේණි පංගු නමින් විස්තර කොට ඇත. සාමාන්‍යයෙන් මෙබඳු පංගුවකට කුඹුරු, වතු, නිවාස, අඩුක්කු හා හේන්ද ඇතුළත්ය."

මෙන්න මේ පරවේණි පංගු තමයි සැලකිල්ලට භාජන විය යුත්තේ. තමන් කළ සේවය වෙනුවෙන් රජතුමා ඉඩමක් හෝ නින්දගම් හෝ දී තිබෙනවා. ඒක තමයි පරවේණි පංගුව. එය නිලකාරයාට අයිති විය යුතුයි. ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. එහෙත් ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ පනතේ ඒ ගැන එක වචනයක්වත් තිබෙනවාද ? නින්දගම් අයිති කරන්නටයි හදන්නේ. ගොවියාටත් නැහැ. වැඩ කළ තැනැත්තාටත් නැහැ. පරවේණි පංගුය කියා තිබෙනවා. මේ පනතින් ඒවාට මොකක්ද සිදු වන්නේ ? ඒවා ඔවුන්ට අයිති වෙනවාද ? නැහැ. ඇයි ඒ ගැන මේ පනතේ කෙලින්ම නොකියන්නේ ?

3 වැනි වගන්තිය මම දැන් නැවත වරක් කියවන්නම්. මෙන්න එය :

"යම් නින්දගම් ඉඩමක් දරන්නකු හෝ එහි සෑම බදුකැරවකුම එහි අයිතිකරු වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ."

නින්දගම් ඉඩමක් දරන්නා යනුවෙන් පරවේණි පංගුවක් දරන්නකු නොවෙයි අදහස් කරන්නේ. බාග පරවේණි පංගුවක් දරන්නෙකුත් නොවෙයි. මේ හැම දෙයක්ම පැහැදිලි කරන්ට ඕනෑ. එහෙත් එකක්වත් පැහැදිලි නැහැ. අනික් නීති කෙසේ වෙතත්, උඩරට ඉඩම් නීතිය යටතේ විශේෂ නීති සංග්‍රහ රාශියක් තිබෙනව. අසුවල් අවුරුද්දෙ අසුවල් නීතිය, අසුවල් අවුරුද්දෙ අසුවල් නීතිය ආදී වශයෙන් සිංහල රජ කාලෙ නීති පවා මේ පනත් කෙටුම්පත්තේම සඳහන් කර තිබෙනව. එහෙම නම් තමුන්නාන්සේට කියන්ට ඕනෑ, අඩු ගණනේ ඒ නීති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සියල්ලම මෙයින් අවලංගු වෙනවාය කියා. එහෙම කියා නැහැ. ඒ නීතිවල තියෙන්නෙ එක විධියකට. මේ නීතියෙ තියෙන්නෙ වෙනත් විධියකට. පැරණි නීති සියල්ලම මෙයින් අවලංගු කරනවා යයි තමුන්නාන්සේ කියනව නම්, පැරණි ඒව සියල්ලම ඉවරයි, ඒකට කමක් නැහැ කියා අපට පිකක් සැනසෙන්නටත් පුළුවනි. ඒකත් නැහැ. මොකද තමුන්නාන් සෙ ඔළුව හොළවන්නෙ? ඒක කරනවද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
එහෙම එකක් තියනෙව.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඒ වැඩ වසම් ක්‍රමය ගැන විතරයි. ඒක විතරක් නොවෙයි, මේ පිළිබඳව තිබෙන අණපනත් ඔක්කොම අවලංගු කරල මුළු රදළ ක්‍රමයම නැති කරන්ට පුළුවන් වන පනතක් ගෙනෙන්න. කොට්සක් විතරක් නොවෙයි, සම්පූර්ණයෙන්ම නැති කරන්ට පනතක් ගෙනෙන්න. රාජාසන කථාවෙන් කිව්වෙ එහෙම නේද? රාජාසන කථාවෙන් පොරොන්දු වුනේ කොට සක් කරනවා කියල නොවෙයි. [බාධා කිරීමක්] නැහැ. මම කියවන්නම්. 1965 අප්‍රේල් මාසයේ 9 වැනිදා රාජාසන කථාවෙන් කිව්වෙ මෙන්න මෙහෙමයි:

"ඉඩම් බුක්ති විඳීමේ ක්‍රමය සංශෝධනය කිරීමට මහත් උනන්දුවක් දක්වන මාගේ ආණ්ඩුව නින්දගම් ක්‍රමය යනුවෙන් හැඳින්වෙන පැරණි වැඩවසම් ක්‍රමය අහෝසි කරනු ඇත."

අපි කියන්නෙ අහෝසි කර නැත කියායි. මේ පනතින් අහෝසි වන්නෙ නැහැ. එපමණක් නොවෙයි, තවත් මෙන්න මේ විධියටත් කිව්ව:

"විහාර දේවාල සතු ඉඩම් ගැන ක්‍රියා කිරීමට සම්බන්ධව මහා සංඝරත්නයේ අනුශාසනා සහ නිසි අධිකාරීන්ගේ උපදෙස් ලබා ගන්නවා ඇති."

ලබාගනෙ තිබෙනවද? ගරු ඇමති තුමනි, බුලර්ස් පාරේ අර ඉඩම් දීල තිබෙන්නෙත් මහා සංඝරත්නයේ අවවාද අනුශාසනා පිටද? රාජාසන කථාවේ සඳහන් කර තිබුණු දේ මේ පනතින් ඉෂ්ට නොවන බවයි අපි කියන්නෙ. එයින් කොටසක් ඉෂ්ට කරනවා යයි කිව් වට ඒ කොටසවත් මේ පනතින් ඉෂ්ට වෙන්නෙ නැහැ. මම තවත් පැහැදිලි කරන්නම්.

තව ජාතියක් තිබෙනව. නිසඳ මුත් තෙට්ටුව, අඳ මුත්තෙට්ටු, පරවෙණි පංගු විතරත් නොවෙයි, අඩුත්තු කියල තවත් ජාතියක් තිබෙනව. වාතීවෙන්ම මම කියවන්නම්. මෙන්න:

"පරවෙණි පංගු, කුඹුරු හා මුත්තෙට්ටුවට අඩුත්තු වශයෙන් ඇති ගොඩ ඉඩම්."

ඔය අඩුත්තු කියන ජාතිය ගැන තමයි ප්‍රශ්නය පැන නැගල තිබෙන්නෙ. මෙතරම් වෙලා අපි කිව්වෙ කුඹුරු ඉඩම් ගැනයි. අඳ මුත්තෙට්ටු, නිසඳ මුත්තෙට්ටු, පරවෙණි පංගු, බාග පරවෙණි පංගු ආදී සියල්ලක් ම කුඹුරු ඉඩම්. අඩුත්තු තමයි ගොඩ ඉඩම්. මේ පනතින් අඩුත්තුවලට සිදු වෙන්නෙ මොකක්ද?

**ඩී. පී. ආටිගල මයා. (රත්නපුර)**
*(திரு. டீ. பீ. ஆட்டிகல—இரத்தினபுரி)*
(Mr. D. P. Attygalle—Ratnapura)
අඩුත්තු කන්ට ඕනෑ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
අඩුත්තු කන්ට ඕනෑලු. ඔව්. අප්පොලෙ ඔවට දක්ෂ බව අප දන්නව. අඩුත්තු ඉඩම්වලින් වැඩි හරියක් නොවැවූ ඉඩම් යයි කීම ගැන රත්නපුරේ ගරු මන්ත්‍රී තුමා (ආටිගල මයා.) මා සමග එකඟ වෙනවා ඇති. ඒ ඉඩම්වල නිලකාරයො ඇත්තෙ නැහැ. ඒවායේ පංගුකාරයො ඇත්තේ නැහැ. එවැනි කැලෑ ඉඩම් රාශියක් තිබෙනව. මා කලින් සඳහන් කළේ අන්න ඒ ඉඩම් ගැනයි. එවැනි ඉඩම් කෙලින්ම රජයට ගන්න; රාජසන්තක කරන්න. රාජසන්තක කරල අක්කර දහස් ගණන් බෙදා දුන්නත් කමක් නැහැ. රජ්ජුරුවන්ට අයිති ඉඩම් රජයට ගන්න. මා කලින් සඳහන් කළ බණ්ඩාර පංගු ගැනත් තමුන්නාන්සේ පැහැදිලි ලෙස සඳහන් කරන්නට ඕනෑ. අර පරණ නීති තියෙද්දී බණ්ඩාර පංගුවක් එහෙම මෙම නින්දගම් පනතින් අන් සතු කරන්නට ගියොත් ලොකු කරදරයකට මුහුණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

පාන්නට සිදු වෙනවා ඇති. බණ්ඩාර පංගුවක් අන් සතු කරන්නට බැහැ. රජ්ජුරුවන් විසින් එහි අයිතිය සන්නසක් පිට පවරා දී තිබෙනවා. ඒ ඉඩම නින්දගමින් කොටසක් වුණු පලියට අන් සතු කරන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. තමුන්නාන්සේගේ පනතේ ඒ පිළිබඳව වචනයක්වත් සඳහන් කර නැහැ. කවුරු හරි ඇවිත් නින්දගමකට අයිතියක් කිව්වොත් බණ්ඩාර පංගුවත් සමගම දෙන්නට වෙනවා. එයින් පසු සිදු වන්නේ කුමක්ද? අර දුප්පතාට උසාවි යන්නට වෙනවා. උසාවියේදී නීතිඥයන් තර්ක කර කියාවි බණ්ඩාර පංගුව කොහොමවත් ඒ අයට අයත් නැති බව. එය අසුවල් කාලේ අසුවල් රජු විසින්, සමහරවිට කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින්, දුන්න එකක් බවත් එය නැති කරන්නට ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමාට බලයක් නැති බවත් උසාවියෙන් කියාවි. එසේ හෙයින් එය පැහැදිලි කර පෙන්වන්නට ඕනෑ. අද ලැබුණු පනතේ "නින්දගම" කියන වචනය පැහැදිලිකර තිබෙනවා. ඒ මෙසේයි:

"'නින්දගම් ඉඩම' යන්නෙන් මෙම පනත ආරම්භ වීමේ දිනයට පෙර යම් ප්‍රවේණි නිලකාරයෙකු හෝ මාරුවෙන නිලකාරයෙකු විසින් දරනු ලබන ප්‍රවේණි පංගුව හෝ මාරුවෙන පංගුව සම්බන්ධයෙන් ඒ නිලකාරයා විසින් සේවා කළ යුතු යයි ඉල්ලීමට, හෝ එවැනි සේවා කිසිවකට හිලවු වශයෙන් එවැනි යම් නිලකාරයෙකු විසින් යම් මුදලක් ගෙවිය යුතු යයි ඉල්ලීමට හෝ එය ලැබීමට අයිතිකරු හිමිකම් ඇතිව සිටි යම් ඉඩමක් අදහස් වේ;"

යම්කිසි බණ්ඩාර පගුංවක් නිලකාරයකු විසින් අද භුක්ති විඳිනවාය කියා සිතමු. අද බණ්ඩාර පංගු හිමියන් හුඟ දෙනෙක් කුරුඳුවත්තේ ගෙවල් හදාගෙන පදිංචි වෙලා ඉන්නවා. ඔවුන් බණ්ඩාර පංගුවල පදිංචි නැහැ. එහෙත් යම්කිසි නිලකාරයෙක් එය භුක්ති විඳිනවා වෙන්නට පුළුවනි. අපි එසේ භුක්ති විඳිනවාය කියා සිතමු. මෙහි සඳහන් අන්දමට ඔහුට බණ්ඩාර පංගුව දුන්නාම මොකද සිදු වන්නේ? එම බණ්ඩාර පංගුවේ අයිතිය ලබා ගන්නට උසාවිය ඉදිරියේදී නඩුවක් කියන්නට සිදු වේවි. අප මෙවැනි පනතක් සම්මත කළ තරමට නින්දගම් හිමියන් සූදනම් වෙන එකක් නැහැ, ඒ ඔක්කොම දීලා නිකම් ඉන්න. ඒ උදවියත් මහන්සි ගනීවි, ඒ උදවියගෙ ඉඩම්වලින් කොටසක් නමුත් ආපසු ලබා ගන්නට. එසේ නැති නම් තවත් මිල මුදල් තිබෙන නඩු කියන්නට දක්ෂ අයකුට විකුණාවි. එතකොට මොකද සිදු වන්නේ? මෙය මේ රටේ තිබෙන නින්දගම් ක්‍රමය අහෝසි කිරීමට තරම් සාර්ථක අංග සම්පූර්ණ පනතක් නොවේයැයි මා කියන්නේ එම නිසායි.

හොඳයි, අපි තව දුරටත් බලමු. අපි තව ටිකක් ඉදිරියට යමු. මාරුවෙන පංගු නිලකාරයා ගැනත් සඳහන් කර තිබෙනවා. මෙහි හොඳටම පැහැදිලිව පෙනෙනවා, මාරුවෙන නිලකාරයාට පරම්පරා පරවේනියක් නැති බව. එයාට පරම්පරා අයිතියක් නැහැ. අපි එක ඉඩමක් ගෙන බලමු. එහි මාරු වෙන නිලකාරයන් වශයෙන් කීප දෙනෙක් සිටින්නට පුළුවනි. නින්දගම්කාරයාට නිලකාරයන් මාරු කරන්නට පුළුවනි. 1966 ඔක්තෝබර් මස 8 වන දින මෙම පනත ගෙනාවාට පසුත් ඊට පෙරත් එවැනි අය මාරු කරන්නට ඇති. එසේ මාරු වෙන නිලකාරයන්ගෙන් කොයි එක් කෙනාටද මෙම ඉඩම අයිති කියා පැහැදිලි නොකරන්නේ මන්ද? කුඹුරු පනත ගෙනා අවස්ථාවේදී කිව්වා 1956 අසුවල් දවසේ හිටපු අඳකාරයා තමයි නියම අඳකාරයා වන්නේ යනුවෙන්. ඇයි ඒ වාගේ මේකවත් කියන්නට බැරි? අසුවල් දවසේ භුක්ති විඳපු තැනැත්තා තමයි මාරුවෙන පංගු කාරයා යනුවෙන් සඳහන් කරන්නට බැරි ඇයි? මෙම නින්දගම් අයිති වන්නේ ඔහුටයි කියා සඳහන් කරන්නට බැරි ඇයි? එහෙම කිසිවක් ඇත්තේ නැහැ. ඔහේ නිකම් ගෙනෙනවා. එක් ඉඩමක මාරුවෙන පංගුකාරයන් රාශියක් සිටින්නට පුළුවනි. අන්තිමේදී මේවා බේරීම සඳහා උසාවියට විශාල කාලයක් ගෙවන්නට සිදු වෙනවා. එතකොට රජයේ මුදල් වැඩි වශයෙන් විනාශ වෙනවා. එම නිසා මේ මාරුවෙන නිලකාරයා පිළිබඳව පැහැදිලි යමක් මෙම පනතට ඇතුළත් කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම ඇතුළු නොකළහොත් විශාල කරදරයකට වැටෙනවා. ගරු ඇමතිතුමා මණ්ඩලයක් පිහිටුවනවාලු. වෙනත් සංයුක්ත මණ්ඩලවලට සභාපතිවරුන් පත් කරන්නා සේ මේ පත් කරන්නට යන මණ්ඩලයටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොහෙන් හෝ පැරදුණු අපේක්ෂකයකු සොයා පත් කරාවි. ඊට පසුව සිදු වන්නේ මොකක්ද ? මේ මණ්ඩලයට ඉල්ලුම් පත්‍ර ගලාගෙන ඒවි. එක ඉඩමට පණහක් හැටක් ඉල්ලුම් පත්‍ර එවාවි. එවිට අලියාට කතිතරය ගැසූ තැනැත්තා කවුරුන්දැයි තෝරා ඔහුට ඉඩම දේවි. ඉඩම් බෙදනවා ඇත්තේ ඔන්න ඔහොමයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඇමතිතුමා යනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

උන්නැහේට මේ ප්‍රශ්නවලට උත්තර දෙන්නට විධියක් නැහැ. උත්තර දෙන්නට දන්නෙත් නැහැ. හොඳයි, ඉඩම් ඇමතිතුමා මෙහි නැතිවාට, රාජ්‍ය ඇමතිතුමා ඉන්නවා නොවැ. කරුණා කර ගරු රාජ්‍ය ඇමතිතුමා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පංගුකාරයා කියන්නේ කාටද? පරවේණි පංගුකාරයා කියන්නේ කාටද? මාරු වන පංගුකාරයා කියන්නේ කාටද? නින්දගම් භුක්තිය පිළිබඳ ප්‍රශ්නය සලකා බලන විට, ඒක ඇතුළේ සිටින පංගුකාරයාත් මාරු වන පංගුකාරයාත් යන මේ දෙන්නා තෝරා බේරා ගන්නේ කෙසේද? මේ පනතේ නිලකාරයා ගැන සඳහන් වෙනවා. එහෙත් නිලකාරයන් නැති ඉඩම් තිබෙනවා. පංගුකාරයන් ඉන්න ඉඩම් තිබෙනවා. රට රවටන්නට එපා, ගරු ඇමතිතුමනි. වැඩක් කරන්නට වුවමනා නම් ඒ පිළිබඳව නිසි පරිදි සොයා බලා රටට ඔබින ආකාරයට ඒ වැඩේ කරන්න. ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන ආකාරයට පනතක් ඉදිරිපත් කොට සම්මත කරවා ගන්න. එසේ නැතිව රට රවටන්නට මහන්සි ගන්නට එපා.

හොඳයි, මෙවැනි පනතක් ඉදිරිපත් කරන විට මතක තබාගත යුතු තවත් කාරණයක් තිබෙනවා. රාජකාරි ක්‍රමය පැවතුණේ කෙසේද කියාත් දැනගන්නට ඕනෑ. රාජකාරි ක්‍රමය පැවතුණු ආකාරය නොදැන නිලකාරයා, ප්‍රවේණි නිලකාරයා, පංගුකාරයා, මාරු වන පංගුකාරයා යන වචන තේරුම් ගන්නට බැහැ. ප්‍රථමයෙන් රාජකාරි ක්‍රමය කුමක්ද යනු පැහැදිලි කර ගන්නට ඕනෑ. රාජකාරි ක්‍රමය පිළිබඳව දැනගන්නේ නැතිව, ඒ පිළිබඳව ලියැවී ඇති ලිපි ලේඛන කියවන්නේ නැතිව, ඊට අදාළ පනත් ඉදිරිපත් කරනවා නම් අපවත් ඒවා ගැන විස්තර කර දීම අපේ යුතුකමයි. මේ විධියට කරුණු ඉදිරිපත් කරන්නට යෑම ගරු කථානායකතුමාට කරදරයක් විය හැකි වුවත් කරන්නට දෙයක් නැහැ. මේ ගරු සභාවේ දැනගැනීම සඳහාත් මේ රටේ දැනගැනීම සඳහාත් අප මේවා ඉදිරිපත් කරන්නට ඕනෑ.

පරවේණි නිලකාරයා ගැන කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වන්නේ මෙහෙමයි :

"අංක 10. ගමක පරවේණි නිලකාරයා වනාහී එම ඉඩම් නින්ද හිමියාට හෝ දේවාලයට හෝ විහාරයට හෝ ප්‍රදානය කිරීමට පළමු ඒවා භුක්ති විඳිමින් සිටි අය යයි සිතිය හැක."

එහෙම නම් රජ්ජුරුවන් ඒ ඉඩම් අයිති කර ගන්ටත් පෙර සිටම ඒවායේ අයිතිය තිබුණේ ප්‍රවේණි නිලකාරයාටයි. කොමිෂන් සභාව අදහස් කරන්නේ එහෙමයි.

"සේවය සැලසීමට බැඳී සිටීම ඉඩම් හා සම්බන්ධ බැඳීමක් වූ අතර සේවය සැලසීමේ ඒකකය පංගුව විය. ඒ බව ඩොයිලි මෙසේ ප්‍රකාශ කර ඇත:

'උඩරට පළාත්වල පැතිර පැවති මේ විශේෂ වැඩවසම් භුක්ති ක්‍රමයේ ආරම්භය රටේ වෙළෙඳාම නොමැතිව මිල මුදල් හිඟය තිබූ කාලයේදී සිදුව ඇති අතර එය දේශපාලන හා සාමාජික නොහොත් ගෘහ්‍ය අර්ථ පාලනයත්, සැප පහසුවත් පිළිබඳ උපාය මාර්ගයක් ලෙස පැතිර ගියේය. කොටින් කියතොත් කිව යුත්තේ නිලකාරයා විසින් අධිපතියාට කරන ලද්දා වූද, කළ යුතු වූද සේවාවලට කුළිය සෙයින් ඉඩම් දී ඇති බවයි.'"

නිකම් දුන්න ඉඩම් නොවෙයි. නිලකාරයා නින්දගම් හිමියාට යම්කිසි සේවාවක් කළා නම් ඒ සේවාවට තමයි, පරවේණි පංගුව දී තිබුණේ. එයාට වෙනම ඉඩමක් තිබුණා. ඒක එයාට සින්නක්කරව අයිති ඉඩමක්. ඒක නින්දගමට සම්බන්ධ නැහැ. එයා කළ සේවයට එයාට ඉඩමක් දී තිබුනා. එසේ තිබෙද්දී දැන් නින්දගමත් ඔහුට දෙන්නට යනවා, දහඩිය මහන්සියේ වැඩ කළ අඳකාරයා ගැන —ගොවියා ගැන— තුට්ටුවකවත් සැලකිල්ලක් දක්වන්නෙ නැතිව. ඒ ගැනයි අප විරුද්ධ වන්නේ. තව දුරටත් අපි බලමු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

"පරවේණි පංගු උරුම කර දිය හැකි ඒවා වන අතර එවැනි ඉඩම් කොටසක් කාන්තාවකට උරුම වූ කල්හි ඒ වෙනුවෙන් ඇය විසින් කළ යුතු සේවාව වෙනුවට ඊට සමාන මුදලක් ගෙවීමට ඇයට අවසර දෙන ලදී. එසේ නැතහොත් වෙන අයකු යොදවා ඒ සේවය කර දීමට ඉඩ දෙන ලදී."

ඔය කියන්නෙ පරවේණි පංගු ගැනයි, නින්දගම් ගැන නොවෙයි. පරවේණි පංගු වෙනුවෙන් කළ යුතු සේවා පරම්පරාවක් තිස්සේම දිගටම කළ යුතුව තිබුණා. එහෙත් පරවේණි පංගු වෙනුවෙන් කළ යුතු සේවාව, එහෙම නැත්නම් රාජකාරිය ඉංග්‍රීසි ආණ්ඩු කාලයේදී වෙනස් වුණා. ඒක නතර කළා. නිලකාරයා එයාට සින්නක්කර අයිතිව තිබූ ඉඩමට එහෙම නැත්නම් පරම්පරාවෙන් පරම්පරාවට අයිති වෙමින් තිබුණු ඉඩමට යම්කිසි බද්දක් ගෙව්වා නම්, නින්දගම් හිමියකුට හෝ රජුට හෝ ඔහු යම්කිසි රාජකාරි සේවාවක් ඉටු කළා නම්, රාජකාරි ක්‍රමය—වැඩවසම් ක්‍රමය—අහෝසි කිරීම නිසා ඒක නැති වුණා, එයාට ඉඩම අයිති වුණා. ඇත්ත වශයෙන්ම නිලකාරයාට අයිති විය යුතු ඉඩම අයිති වී අවසානයි. මේ නින්දගම් පනතෙන් ආණ්ඩුව අදහස් කරන්නෙ ඒ නිලකාරයන්ට නින්දගම් අයිති කර දීමද, එහෙම නැත්නම් ඒ ඉඩම්වල වැඩ කළ ගොවි ජනතාවට ඒ ඉඩම් අයිති කර දීමද? අප අහන්නෙ ඒ ප්‍රශ්නයයි. බලන්ගොඩට ගොස් ගරු ඇමතිවරුන් කිව්වෙ—ඉඩම් ඇමතිතුමා ගුවන් විදුලියෙන් කිව්වෙ, ප්‍රවෘත්ති පත්‍රවලට ලියුම් ලියමින් කිව්වෙ —නින්දගම් භුක්ති විදින ගොවීන්ට මේ ඉඩම් අයිති කර දෙනවාය කියායි. එහෙත් තමුන්නාන්සේ අද මේවා අයිති කර දෙන්නට කටයුතු කරන්නෙ නිලකාරයන්ටයි. තමුන්නාන්සෙ එදා එහෙම කිව්වෙ නැහැ. එහෙම කීවාය කිව්වොත්, තමුන්නාන්සේ අතින් ලියාපුවත්, කටින් කියාපුවත් ඔක් කොම මා මෙහි ගෙනැවිත් තිබෙනවා, පෙන්වීමට. අද ගොවීන්ට නොවෙයි— වැඩ කරන තැනැත්තන්ට නොවෙයි—මේ ඉඩම් අයිති කර දෙන්නට කටයුතු කරන්නේ. සේවයට කුළිය වශයෙන් පරවේණි පංගුවක් භුක්ති වින්ද—ගොවියාගෙන් වැඩ ගත්ත—නින්දගම්කාරයන්ටයි, පවරා දෙන්නට යන්නෙ. එතනයි, බැරෑද්ද.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
ඒක පිළිගන්නෙ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
පිළිගන්නවා නොවෙයි, පලි ගන්නවා. බලන්ගොඩට නින්දගම් තුරුම්පුව අර ගෙන ගියාම, තමා සතු නින්දගම්වල පදිංචිව සිටින උදවියට සාධාරණ අන්දමින් සැලකූ, නින්දගම් මගින් සූරා නොකන ලද, විරුද්ධ පාර්ශ්වයේ නායිකාවට— බණ්ඩාරනායක මැතිනියට—පහරක් වදීය කියා මේ අය කල්පනා කළා. එතුමිය නින්දගම් හරියට පාලනය කර තිබෙන බව—එතුමිය නින්දගම් මගින් සූරා කන්නකු නොවන බව—බලන්ගොඩ ජනතාව හරියට ඔප්පු කළා. පැල්මඩුල්ලේ ජනතාව ඔප්පු කළා, තවත් නින්දගම් හිමියකු නින්දගම්වලින් සූරා කන්නකු බව. මේ පැත්තෙන්වත් ගහන්නට පුළුවන්ද කියා මේගොල්ලො බැලුවා. තමුන්නාන්සේලාගේ අතවලයාගේ දේශපාලන බෙලි කැපීමේ එක ක්‍රමයක් තමයි, බලන්ගොඩ දීත් ක්‍රියාවේ යෙදුවේ. බලන්ගොඩදී පිටිපස්සෙන් බෙල්ල කපන්නට ගිය අතවලයාට වැරදුණු බවයි, අපට කියන්නට සිදු වී තිබෙන්නෙ.

ගරු කථානායකතුමනි, පංගුකාරයා කියන්නෙ කව්ද යන්න තේරුම් කර දෙන්නටයි, මා මෙය කියෙව්වෙ. තව ටිකක් කියවාගෙන යන විට "පංගුකාරයා" කවුදැයි තේරෙයි. "පංගුකාරයා" කියන වචනය ඇතුළත් වුණේ ඇයි? පරම්පරාවෙන් පරම්පරාවට මේවා අයිතිවෙමින් යද්දී, එක් කෙනකුට නොවෙයි කීප දෙනකුටම ඒවායේ අයිතිය පැවරෙන්නට පටන් ගත්තා. එසේ දිගින් දිගට යද්දී, "නිලකාරයාට" තිබුණු අයිතියට වුණේ මොකක්ද? ඒවා පංගුවලට බෙදුණා. ඊට පස්සේ "පරවේණි පංගුකාරයා" යනුවෙන් ව්‍යවහාර වන්නට පටන් ගත්තා. අද ව්‍යවහාර වන්නේ "පරවේණි පංගුකාරයා" යනුවෙන් මිස "පරවේණි නිලකාරයා" යනුවෙන් නොවෙයි. ඒ ඇයි?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලකාරයාගේ නිල සේවය 1815 දී ඉබේට නැති වුණා ; 1832 දී අහෝසි කළා. එහෙම නම් අද නිලකාරයෙක් නැහැ. අද ඉන්නේ පංගුකාරයා විතරයි. එහෙම නම් මේ පනත් කෙටුම්පත අනුව ඉඩම් ඇමතිතුමා ඉඩම් අත්පත් කර දෙන්නට අදහස් කරන නිල කාරයෙක් අද මේ පොළොවේ නැහැ. එහෙම නම් ඉඩම් අත්පත් කර දෙන්නට අදහස් කරන්නේ කාටද ? ඒ අනුව කල්පනා කර බලන විට, මේ පනත් කෙටුම්පත පිළිබඳව මෙම ගරු සභාවේ සාකච්ඡා කිරීමෙන් අප කරන්නේ විහිළුවක්. දැනට "පරවේණි නිලකාරයන්" නැත්නම්, ඉන්නේ "පරවේණි පංගුකාරයන්" විතරක් නම්, "නිලකාරයා" ගැන පමණක් නොව "පංගුකාරයා" ගැනත් හැඳින්වීමක් කරන්නට යුතුකමක් තිබුණා.

මෙම ඉඩම් පිළිබඳව කථා කරන විට තවත් වැදගත් කාරණයක් සඳහන් කළ යුතුව තිබෙනවා. අහෝසි වුණු නින්දගම් වර්ග දෙකකුත් තිබෙනවා. එක ජාතියක් "නිල පල". අනෙක් ජාතිය "මහ පල". මා ඒවා ගැන මතක් කරන්නේ, දැන් සමහරුන් එවැනි අහෝසි වුණු නින්දගම් පවා තමන්ගේ නින්දගම් හැටියට දක්වා යම් යම් අයුතු ප්‍රයෝජන ගන්නා නිසයි. මෙම කොමිෂන් සභා වාර්තාවේ 14 වැනි වගන්තියේ "නිල පල" කියන්නේ මොනවා දැයි විස්තර කර තිබෙනවා. මම එය කියවන්නම් :

"නිල පල, එනම් යම්කිසි නිලයක් නැති කිරීම හෝ එම නිලය දැරීමට අසමත් වීම නිසා නැවත රාජසන්තක කරන ලද—යට කී නිලය හා සම්බන්ධ ඉඩම් ;"

යම්කිසි නිලයක් සඳහා ඉඩමක් දී තිබුණා නම්, ඒ නිලය අත්හැරීමෙන්, නැත්නම් ඒ රාජකාරිය හරියාකාර නොකිරීමෙන්, ඒ ඉඩම ආපසු රාජසන්තක වෙනවා. ඒ විධියටයි, එම ඉඩම් දී තිබුණේ. සිංහල රජවරුන් විසින් දී තිබුණු සන්නස් 1866 දී විතර ලියාපදිංචි කරන අවස්ථාවේදී, කී දෙනකුට ඇත්ත වශයෙන් එම ඉඩම් අයිතිව තිබුණා දැයි මා ප්‍රශ්න කරන්නට කැමතියි. "අසුවල් රාජකාරිය ඉෂ්ට කිරීම සඳහා උඹට අසුවල් ගම දී තිබෙනවා" යයි රජතුමාගේ සන්නසෙන් කියවෙනවා. එහෙත් 1815 දී ඉංග්‍රීසින් මේ රට අල්ලා ගත් හැටියේ අර අය තම රාජකාරිය අත්හැරියා ; නැත්නම් තිකුම් හිටියා. තමන්ගේ රාජකාරිය ඉෂ්ට කිරීමට නොවෙයි, මේ රට ඉංග්‍රීසින්ට පාවා දීමට මහන්සි ගත් අයත් ඒ අතර හිටියා. එවැනි අය 1815 සිට 1866 දක්වා අවුරුදු 51 ක් අර සන්නස් පත්‍ර නැත්නම් කඩදාසි සාක්කුවේ දමාගෙන සිට, 1866 දී ලියාපදිංචි කරන අවස්ථාවේදී "මගේ ඉඩමක්" කියා නොයෙකුත් ඉඩම් තමන්ගේ ඉඩම් හැටියට ලියාපදිංචි කර ගත්තා. තත්ත්වය එක නම්, මේ නින්දගම් ඉඩම් වලින් වැඩි හරියක් අවලංගු වුණු ඒවා නොවෙයි ද ? ඒ නිසා නොවේද මේ රජයට අප කියන්නේ, "අතපත නොගා, වනන්නේ නැතිව, සියලුම නින්දගම් කෙළින්ම රාජසන්තක කර, ඒවා මේ රටේ සාමාන්‍ය ජනතාවට බෙදා දෙන්නය" කියා ? එසේ කළොත් මේ රජය සාධාරණ රජයක් යයි අපට කියන්නට පුළුවනි. නින්දගම් රජයට ගත් පසු ජීවත් වන්නට බැරිම කෙනකු සිටිනවා නම් ඔහුටත්, අනෙක් අයට දෙන හැටියට, ඉඩම් කැබැල්ලක් දෙන්න.

"මහ පල" නමින් තවත් ඉඩම් වර්ග යක් තිබුණා. ඒවාත් මම තමුන්නාන්සේට හඳුන්වා දෙන්නම් :

"මහ පල, එනම්, ඉඩම් ලැබුවකු උරුමකරුවකු නො ලබා මිය ගිය කල්හි හෝ සේවය අත්හැර දමූ කල්හි රාජ සන්තක කරන ලද ඉඩම් වේ. සමහර කාලවල—විශේෂයෙන්ම උඩරට අන්තිම රජුගේ රාජ්‍ය කාලයේ අවසාන භාගයෙහි සේවය සඳහා තුබූ මහත් පීඩාකර බව හේතු කොට ගෙන පරවේණි පංගු අත්හැර ඇම්මට සිදු වී ඇති බව කියනු ලැබේ. ඉඩම් ලබා සිටියවුන් තමන්ට සේවය නොකළ වූ විටත්, අපක්ෂපාත හා අත්කරු වූ විටත් ඔවුන්ගේ ඉඩම් කොටස් ඔවුන්ට අහිමි කිරීමේ බලය රජහුම සිරිත් පරිදි හබා ගත්හ. 'අත්‍යුත් කෘෂ්ට' නායකයා හැටියට තමාට ඇති බල තල කිසි විටකත් සහමුලින් අත් නොහළ රජුගේ අනුමතිය නැතිව පරවේණි බුන්නි කරලත් ඉවත් කිරීමට උඩරට රජුන්ගේ පාලන ක්‍රමය යටතේ අවසර නො තිබුණු අතර සේවය කිරීම ප්‍රතික්ෂේප කර ඇති බව පැහැදිලි සේ ඔප්පු කරන තුරු ඔවුන් ඉවත් කිරීමට කිසි විටකත් අවසර නුදුන් බවද පිළිගත යුතුය." (විහාර ඉඩම් කොමසාරිස්ගේ 1857—1858 වාර්තාව බලන්න.)

එහෙම නම්, දැනට තිබෙන නින්දගම් වලින් කීයක් නීත්‍යානුකූල ඒවාද යන ප්‍රශ්නය මා ගරු ඇමතිතුමාගෙන් අහනවා. සේවය පැහැර හැරීම, උරුමකරුවකු නො ලබා මිය යාම, ආදී වූ නොයෙක් හේතූන් නිසා අහිමි වුණු ඉඩම් කීයක් 1866 දී ලියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

පදිංචි වී තිබෙනවා ද? මෙවැනි පටලැවිලි සහිත ප්‍රශ්නයක් පිළිබඳ පණතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන විට එම පටලැවිලි බේරුම් කිරීමට අදාළ වගන්ති සහිතව එය ඉදිරිපත් කරන්නට ඕනෑ. එසේ නැත්නම්, "මීට ඉස්සර මේ සම්බන්ධයෙන් පනවා තිබුණු සියලුම නීති මෙයින් අවලංගු කරනු ලැබේ" යි ඇමතිතුමා කියන්නට ඕනෑ. ඒ කරුණු දෙකෙන් එකක්වත් ඉෂ්ට වෙලා නැහැ. ඇමතිතුමා මෙතැන වාඩි වී හොඳට හිනා වෙමින් සිටිනවා. රටට මොනවා වුණත් එතුමාට කමක් නැහැ. [බාධා කිරීමක්] එතුමාට "මාරුවන පංගු" තිබෙනවා. "පරවේණි පංගු" පමණයි නැත්තේ.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේට මා තවත් වැදගත් කරුණක් පෙන්වා දෙන්නට අදහස් කරනවා. මෙම ඉඩම් පැවරීම, තෑගි දීම, සිංහල රජවරුන් විසින් තහනම් කර තිබුණා. එහෙම නම් හුරුල්ලේ ඇමතිතුමා එතුමාගේ නින්දගම් විකුණන්නේ කොහොමද? සීතා මොල මූරේ සෙනෙවිරත්න කුමාරිහාමි—ගරු සෙනෙට් මන්ත්‍රීවරිය—ඇගේ නින්දගම් විකුණන්නේ කොහොමද? එසේ විකිණීම නීත්‍යනුකූල ද? රජයේ ඉඩම් විකුණන්නට වෙනත් කෙනකුට පුළුවන්ද? එසේ විකුණුවායින් පසු, මිළට ගත් අයට ඒවා නීතියෙන් අයිති කර දීම සඳහා ගරු ඉඩම් ඇමතිතුමා මේ ගරු සභාවට පණතක් ඉදිරිපත් කොට නිලකාරයාට එම ඉඩම් පැවරිය යුතු යයි කියනවා. කවුද මේ නිලකාරයා? සමහරවිට ඔහු ලොකු මුදලාලි කෙනකු වන්නට පුළුවනි; සමහරවිට ඔහු මේ රටේ කෙනකු නොවන්නට පුළුවනි; මේ රටේ පුරවැසිකමවත් නැති කෙනකු වන්නට පුළුවනි. මේ ආකාරයට මේ කටයුත්ත කරන්නට ගරු ඇමතිතුමා මාන්සි ගැනීමෙන් එතුමා මේ රට රවටන්නට උත්සාහ කරන බවට මා එතුමාට චෝදනා කරනවා.

ගරු කථානායකතුමනි, මෙපමණ වේලාවක් තුළ මා කළේ නින්දගම් ඉඩම් පිළිබඳ යම්කිසි විස්තරයක්. ඊළඟට, මේ ඉඩම් පැවරිය යුත්තේ කාටද යන කාරණය ගැන මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට සතුටුයි. නින්දගම් ඉඩම් පිළිබඳ ඉතිහාසය ගැන මා කථා කළ අවස්ථාවේදී මේ ඉඩම් පවරනවා නම් පැවරිය යුත්තේ කාටද යන්න ගැන සාමාන්‍ය සඳහනක් කළා. ඇත්ත වශයෙන් ම මේ ඉඩම් පැවරිය යුත්තේ මේ ඉඩම් භුක්ති විඳින අයටයි; මේ ඉඩම් පාරම්පරිකව භුක්ති විඳින අයටයි; රාජකාරියක් ඉෂ්ට කරන, දහඩිය මහන්සියෙන් වැඩ කරන උදවියටයි. මේ ඉඩම් පැවරිය යුත්තේ ඊයේ පෙරේදා මේවා මුදලට ගත් අයට නොවෙයි. ඊයෙ පෙරේදා මේ ඉඩම් මුදලට ගත් අයට මේ ඉඩම් පවරා දෙන්නට ගරු ඇමතිතුමා මේ පනතෙන් බලතල ඉල්ලනවා නම්, මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන් ඇමතිතුමාගේ ඒ ක්‍රියා කලාපය ගැන අප විරුද්ධ වෙනවා. මේ ඉඩම් අයිති රජයටයි. රජයට අයිති මේ ඉඩම් යම් සේවාවන් සඳහා යම් යම් අයට භුක්ති විඳින්නට පවරා දුන්නා. ඒ භුක්තිය ලැබූ මිනිසා තව කෙනෙකුට මේ ඉඩම් විකුණුවා. ඒ හොර විකුණුමට පසු ඒ විකුණුම ලැබූ තැනැත්තා මේ ඉඩම්වල නීත්‍යනුකූල අයිතිකරු කරන්නට ඇමතිතුමා දැන් පනතක් ගෙනැවිත් තිබෙනවා. එම නිසයි මේක සම්පූර්ණයෙන්ම මහජනතාවගේ ඇස්වලට වැලි ගසන්නට කරන බොරුවක්ය, මායාවක්ය, කපටි වැඩ පිළිවෙළක්ය, කියා අප කියන්නෙ.

ඊළඟට, ගරු ඇමතිතුමාට මා යෝජනාවක් කරන්නට සතුටුයි. ඇත්ත වශයෙන් ම මේ කාරණය ගැන එතුමාට මීට වැඩිය කල්පනා කරන්නට තිබුණා. අර 171 වන වගන්තිය එතුමා පිළිගන්නවාය කියා එතුමාගේ කථාවේදී සඳහන් කළා. නමුත් එය පනත් කෙටුම්පතට ඇතුළත් කර නැහැ. විහාරගම් දේවාලගම් ඉඩම් මේකට ඇතුළත් කරන්නේ නැත කියා එතුමා කිව්වා. නමුත් එතුමාගේ ඒ ප්‍රකාශය මේ පනත් කෙටුම්පතට ඇතුළු කර නැහැ. විහාරගම් දේවාලගම් ඉඩම් මේ පනතින් නිදහස් කරනවාය කියා ඇයි එතුමාට මේ පනතින් කියන්නට බැරි වුණේ? මොන හේතුවක් නිසාද එය මේ පනත් කෙටුම්පතට ඇතුළත් නොකළේ? තවම මේ කාරණය ගැන මහා සංඝයා වහන්සේගේ අවවාද අනුශාසනා ලැබුණේ නැද්ද? පසුගිය අවුරුදු තුන ඇතුළත මහා සංඝයා වහන්සේගෙන් ඒ අවවාද අනුශාසනා ලබා ගන්නට ගෙන තිබෙන ක්‍රියා මාර්ගය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුමක්ද? මේ කාරණය පිළිබඳව මහා සංඝයා වහන්සේ කී වරක් බැහැ දැක තිබෙනවාද? අඩු වශයෙන් මහා නායක ස්වාමීන් වහන්සේලාවත් බැහැ දැක තිබෙනවාද? ඔය පොඩි පොඩි අමාරුකම් එන කොට තමුන්නාන්සේලා මහා නායක ස්වාමීන් වහන්සේලා බැහැ දකිනවා නම්, මෙවැනි වැදගත් ප්‍රශ්නයක් ගැන උන් වහන්සේලා මුණගැසී සාකච්ඡා කරන්නට බැරි මක්නිසාද? ඇයි මේ කාරණය ගැන තමුන්නාන්සේ කෙලින්ම සඳහන් නො කළෙ? විහාරගම් දේවාලගම් ඉඩම් ගන්නේ නැත කියන වගන්තියක් නැත්නම්, ඒ ඉඩම් අත්හැර, කියන වචන මේ පනත් කෙටුම්පතට ඇතුළු නොකළේ මන්ද? 171 වන වගන්තියේ හැටියට විහාරගම් දේවාලගම් ඉඩම්වලට තමුන්නාන්සේ අත ගසන්නේ නැත කියා කිව්වා. එහෙම නම් 3 වන වගන්තියට අතුරු වගන්තියක්වත් ඇතුළු කර එය මේ පනත් කෙටුම්පතට ඇතුළත් නොකළේ මන්ද? එවැනි අතුරු වගන්තියක් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්නට ගරු ඇමතිතුමා ලෑස්තිද? තමුන්නාන්සේ ලෑස්ති නම් තමුන්නාන්සේගේ ඒ කියමන අප පිළි ගන්නවා. 171 වන වගන්තිය පිළිගන්න වාය කියා තමුන්නාන්සේගේ කථාවේදී ප්‍රකාශයක් කළා. නමුත් ඒ පිළිබඳව මේ පනත් කෙටුම්පතේ නම් වචනයක්වත් නැහැ.

විහාර දේවාලගම් ඉඩම් පිළිබඳව වාගේම තවත් වැදගත් කාරණයක් ගැන මා මතක් කරන්නට සතුටුයි.

ගරු කථානායකතුමනි, විහාරගම් දේවාල ගම් ඉඩම් ගැන අපි සඳහන් කරන්නේ තවත් වැදගත් කරුණක් නිසයි. නින්ද ගම් අයිති රජයටයි කියා මා කලින් සඳහන් කළා. එසේ රජයට අයිති නින්දගම් නිල කාරයින්ට හෝ වෙන යම් අයට හෝ බාර දෙන්නට යන අවස්ථාවේදී යම්කිසි ඉඩ මක් ආගමික කටයුත්තක් සඳහා යොදා ගෙන තිබෙනවා නම් එවැනි ඉඩම් මේ පනතින් වෙන් කර තබන්නට ගරු ඇමති තුමා අදහස් නොකරන්නේ ඇයි කියන කරුණ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. සමහර නින්ද ගම් ඉඩම් ආගමික කටයුතුවලට යොදා ගෙන තිබෙනවා. මේ පනතේ සඳහන් නිල කාරයකුට දිය යුතු ඉඩමක පන්සලක් හෝ විහාරයක් හෝ හදා තිබෙනවා නම් එවැනි ඉඩම් මේ පනතින් නිදහස් කර එම ඉඩම ඒ ආයතනයට නැත්නම් විහාරයට දීමට ඉඩකඩ තබා නොගන්නේ ඇයි? බෞද්ධා ගමට සිංහල රජකාලේ තිබුණු තැන දෙන වාය කියලයි තමුන්නාන්සේලා කියන්නේ. එහෙම නම් පන්සල් හදා තිබෙන සමහර නින්දගම් ඉඩම් නිලකාරයින්ට නොදී ඒ පන්සලටම දීමට වගන්තියක් ඇතුළත් කර නැත්තේ ඇයි? ඒ තරම් දුරට කල්පනා නොකර මොනවා හරි ගෙනාවා.

හොඳයි තවදුරටත් කල්පනා කර බලමු. නින්දගම් ඉඩම් බදු අරගෙන තේ, රබර්, පොල් ආදිය වවා තිබෙන විදේශීන්ට මේ ඉඩම් දෙන්නේ නැත කියා සඳහන් කර නැත්තේ ඇයි? එසේ නැත්නම් විදේශීය කොම්පැනි බුක්ති විඳින එවැනි ඉඩම් රජ යට පවරා ගන්නවාය කියන්නට බැරි ඇයි? ඒවා ගැන කිසිම පැහැදිලි කිරීමක් නැහැ. 1866 සන්නස් ලියාපදිංචි කළ අවස්ථාවේදී ලියාපදිංචි වූ සන්නස් ඇති ඉඩම්වලට පමණයි මේ පනත අදාළ වන්නේ; ඉන් පිටස්තරව නින්දගම්ය කියාගන්නා ඉඩම්වලට මේ පනත අදාල වන්නේ නැත කියා මේ පනතෙහි සඳහන් කරන්නට බැරි ඇයි? මොන හේතුවක් නිසාද එසේ නොකියන්නේ? එය සඳහන් නොකළේ මේ ගරු සභාවේ සිටින අහවලා ආරක්ෂා කරන්න, නැත් නම් අහවල් කොම්පැනිය ආරක්ෂා කරන්න, එහෙමත් නැත්නම් අහවල් ඇමතිතුමා ආරක්ෂා කරන්න කියා කරුණා කර මේ ගරු සභාවේදී කියන්න. මොකක් ද මේ "වහෙන් ඔරෝ" කියන එකේ තේරුම?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා තව කොපමණ වේලා වක් කථා කරන්න බලාපොරොත්තු වෙනවාද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තව පැය බාගයක් පමණ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order please! The sitting is suspended till 4.30 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

அதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 4.30 p.m. and then resumed.*

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, නින්දගම් පනත් කෙටුම්පත පිළිබඳව මා පැහැදිලි කරමින් සිටියේ නින්දගම් ඉඩම් නිලකාරයන්ට අයත් කර දීමට ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ පනතේ අඩංගු නොකර තිබෙන යම් යම් කරුණුයි. එහි සාරාංශයක් පමණක් දක්වා තවත් කරුණු පැහැදිලි කරන්නට බලාපොරොත්තු වෙනවා.

විහාරස්ථාන නැත්නම් ආගමික සිද්ධස්ථාන තිබෙනවා. ඒවාට අයත් ඉඩම් තිබෙනවා. ඒවා නිලකාරයන්ට හෝ එවැන්නන්ට අයිති කර දීම වෙනුවට රජයට අයිති කර ගැනීමට ගරු ඇමතිතුමා මැලිකම් දක්වා තිබෙන්නේ මන්දැයි මා නැවතත් ප්‍රශ්න කරනවා. සමහර ඉඩම් විදේශීය කොම්පැනිකාරයින්ට බදු දී තිබෙනවා. ඒවායේ ඔවුන් තේ, රබර්, පොල් ආදිය වගා කර තිබෙනවා. ඒවා කෙළින්ම රජයට අයත් කර ගැනීමට ගරු ඇමතිතුමා මේ පනතින් විධිවිධාන සලසා නැත්තේ මන්දැයි මා අහනවා. ඊට අවශ්‍ය වගන්තියක් මීට ඇතුළත් නොකරන්නේ මන්දැයි මා අහනවා. ඒ වතු නිලකාරයන්ට දීමේදී 1966 ඔක්තෝබර් 8 වැනිදා හෝ අඩු ගණනේ කල්පනාවට ගත යුතුව තිබුණා. ඒ, මේ පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කළ දවසයි. එහෙම නැත්නම් මේ ආණ්ඩුව පිහිටුවන ලද දිනය වන 1965 මාර්තු 26 වැනිදා සැලකිල්ලට නොගන්නේ මන්දැයි මා ප්‍රශ්න කරනවා. එවැනි වගන්තියක් මේ පනතට ඇතුළත් නොකරන්නේ මන්දැයි ප්‍රශ්න කරන අතර ඊට පිළිතුරක් ලබා ගන්නටත් කැමතියි.

ගරු කථානායකතුමනි, නින්දගම් පිළිබඳව තව දුරටත් කරුණු අප විසින් දැනගත යුතුව තිබෙනවා. පනත හරියාකාර තේරුම් ගැනීමට තවත් විස්තර වුවමනා කරනවා. ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත මේ වැඩේට කොහෙත්ම සෑහෙන්නේ නැති එකක් බවටයි මා චෝදනා කරන්නේ. තවත් කරුණු ටිකක් තමුන්නාන්සේගේ සැලකිල්ලට යොමු කිරීම සඳහා ඉදිරිපත් කරන්නට මා කල්පනා කරනවා. මේ පනත ගෙනැවිත් මහ ජනයා රැවටීමට ගරු ඇමතිතුමා දරණ උත්සාහය ඇත්ත වශයෙන්ම කණගාටුදායකයි.

ගරු කථානායකතුමනි, නිලකාරයන් විසින් කරනු ලැබිය යුතුයයි අපේක්ෂිත සේවාවන් කවරේදැයි නින්දගමක් දෙකක් උදාහරණ වශයෙන් ගෙන මම පෙන්වා දෙන්නම්. කොමිෂන් සභා වාර්තාවේ 37 වැනි පිටුවේ නින්දගම් කිහිපයක් ගැන සඳහන් වෙනවා. මම කොටසක් කියවන්නම්. මෙන්න එය:

"(1) කෑගලු දිස්ත්‍රික්කයේ ගල්බොඩ කෝරළේ පිහිටි ලෙව්කේ.

අංක 2 පංගුව—නිල පංගුව.

සේවාවන්-වලව්වේ මුත්තෙට්ටු වැඩත් හේනේ වැඩත් සියල්ලම කිරීම, වලව්වේ පියස්ස සෙවිලි කිරීම, ගමේ වී අටුවට වී ගෙනයාම, වලව්වෙන් ගමේ වෙන තැනකට පිදුරු ගෙන ගොස් දැමීම, ගමන්වලදී ඉඩම් හිමියාගේ මාර්ගෝපකරණ සහ දෝලා ඔසවාගෙන යාම, මසකට දවස් 8 ක් වලව්වෙන් නියම කරණු ලබන ඕනෑම වැඩක් කිරීම, අලුත් අවුරුද්දට කැවුම් පෙට්ටියක් රැගෙන වලව්වට ඒම, ගමන් බිමන් උඩරට ප්‍රදේශයටත්, මසකට දින 8කටත් සීමා වී ඇත. හේන් වැඩ ගමේ හේන්වලට සීමා වී ඇත. අවමඟුලක් සඳහා දෝලාව ඔසවා ගෙන යන අවස්ථාවලදී එක් එක් දෝලාකාරයාට ඉඩම් හිමියාගෙන් කළු රෙද්ද බැගින් ලැබේ."

සේවාවන් හැටියට සඳහන් කර තිබෙන්නේ මේවායි. ඒ අනුව, ගරු ඇමතිතුමා වෙත මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි. වලව්වේ මුත්තෙට්ටු වැඩත් කරනවා නම්, හේනේ වැඩ සියල්ලක්මත් කරනවා නම්, ඒ මදිවාට එම වලව්වේ පියස්ස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෙවිලි කරනවා නම්, ගමේ වී අටුවට වී ගෙන යනවා නම්, වලව්වෙන් නියම කරනු ලබන ඕනෑම වැඩක් එක්තරා දවස් ගණනාවක් කරනවා නම්, ඒ තරම් වැඩ කරන තැනැත්තාට තමුන්නාන්සේ මේ නින්දගම් පනතින්—කවුදෝ කියනවා ඇහුනා මෙය නින්දගම් පනතක් නොව ගෙන්දගම් පනතක්ය කියා, ඒ පනතින්—දෙන්නට යන්නේ මොනවාද? තමුන්නාන්සේ යම් යම් අයිතිවාසිකම් ලබා දෙන්නට යන්නේ වැඩ කරන්නන්ට නම් ඒ ගැන මගේ චෝදනාවක් නැහැ. එහෙත් තමුන්නාන්සේ මේ වැඩ කරන කෙනෙකුට නොවෙයි යමක් දෙන්නට යන්නේ. එහෙම නම් මේ වැඩ ගන්නට ආ නිලකාරයාටයි දෙන්නට යන්නේ. තමුන්නාන්සේ මේව අත් කරල දෙන්ට යන්නෙ නිලකාරයාටයි. එසේ නැත්නම් පනතේ පැහැදිලි වශයෙන් සඳහන් කරන්ට ඕනෑ, මේවා දෙන්ට යන්නෙ මෙන්න මේ උදවියටය කියා. ගරු ඉඩම් ඇමතිතුමා එතුමාගේ ගුවන් විදුලි කථාවේදී කෙලින්ම කිව්ව, එතුමා ප්‍රවෘත්ති පත්‍රවලට ලිව්ව ලියුම්වල කෙළින්ම සඳහන් කළා, නින්දගම් ඉඩම් බෙදා දෙන්ට අදහස් කරන්නෙ මෙන්න මේ උදවියටයි කියා. එහෙත් දැන් පනතෙ කියන්නෙ ඊට වඩා හාත්පසින්ම වෙනස් දෙයක්.

නිලකාරයාගේ රාජකාරිය මොකක්ද කියන එක මම මීට කලින් සඳහන් කළා. ඔහුගේ රාජකාරිය වැඩ නියම කිරීමත් වැඩ කළ උදවියගෙන් බදු අය කර දීමත් පමණයි. අද තත්ත්වයේ හැටියට තේ වත්තක් ගැන කථා කරනවා නම්, ඔහුගේ රාජකාරිය කොන්දොස්තර මහත්මයෙකුගේ සේවයට සමාන කරන්ට පුළුවන්. ඒ ඒ අයට වැඩ නියම කරල එතැනට ලැබෙන දේවල් එකතු කරල දෙන එකයි රාජකාරිය. නිලකාරයා තමයි ඇත්ත වශයෙන්ම පාලන යන්ත්‍රය ක්‍රියා කරවන්නෙ. දැන් මේ පනත අනුව ඉඩම දෙන්ට යන්නෙ වැඩ කරපු එක්කෙනාට නොවෙයි: දෝලාව ඉස්සූ තැනැත්තාටවත්, කුඹුර කෙටූ තැනැත්තාටවත්, හේන කෙටූ තැනැත්තාටවත් නොවෙයි; කුඹුර දෙන්ට යන්නෙ ඔවුන් පාලනය කරපු නිලකාරයාට හෙවත් කොන්දොස්තරටයි. ඒකයි අපි කියන්නෙ තමුන්නාන්සේලා කරන්නෙ රට රැවටීමක්ය කියා.

තව දුරටත් කල්පනා කර බලමු. රටේ දැනගැනීම සඳහා මේවා පෙන්වා දෙන්ට ඕනෑ. රටට කියනව, "අපි නින්දගම් දුන්න. අපි ගොවියාට දුප්පතාට සහන සැලසුව. වැඩ වසම් ක්‍රමය නැති කරල සේවයේ යෙදී සිටි උදවිය සුඛිත මුදිත කරනවා. මේ රටේ සෞභාග්‍යමත් අනාගතයක් ඇති කරනවා. දස රාජ ධර්මයෙන් ආණ්ඩු කරනවා" කියා. කරන්නෙ මෙහෙමයි. කථාව දෝලාවෙන්, ගමන පයින්.

"කෑගලු දිස්ත්‍රික්කයේ ගල්බොඩ කෝරළේ අස්මඩල.

අංක 1 පංගුව—නිල පංගුව.

සේවාවන්—අලුත් අවුරුද්දට පසු බුලත් අතක් පිළිගැන්වීම. තුන් වරක් සී සෑම, නියර බැඳීම්, කුඹුරු වැපිරීම, වැට බැඳීම, ගොයම් කැපීම, ගොයම් කමතට ගෙන ඒම, ගොයම් පෑගීමේදී සහාය වීම, වී පෑගීම, අස්මඩලේ අටුව කරා වී ගෙන යාම, වැඩ කරන කාලය තුළදී දවසකට වරක් ඉඩම් හිමියා විසින් නිලකාරයාට කෑම්-බීම් සැපයිය යුතුය. ගමන් බිමන් වලදී ඉඩම් හිමියාගේ මාර්ගෝපකරණ හා දෝලාව රැගෙන යාම, මෙම ගමන් බිමන් එක් වරකට දින 10 කට වඩා කල් ගත නොවන, අවුරුද්දකට දින 30 කට වඩා කල් ගත නොවන උඩරටට පමණක් සීමා වූ ඒවාය."

ඔන්න, කරන්න තිබෙන වැඩ. දින 30 ක් දෝලාව ඔසවාගෙන යන්ට ඕනෑ. ඒ ඔසවාගෙන යන මිනිහාට වාසියක් නැහැ. "උඹ අසුවල් දවසට දෝලාව ඔසවන්ට එන්න ඕනෑ" කියා නියෝග කරන නිලකාරයාට තමයි, ඉඩම දෙන්ට යන්නෙ. මේක හරිද? ගරු ඉඩම් ඇමතිතුමා ගෙනුත් ආණ්ඩු පක්ෂයේ පිටුපස ආසනවල සිටින මන්ත්‍රීවරුන්ගෙනුත් මම අහන්නෙ, මේ ඉඩම් හිමි කර දිය යුත්තෙ නිලකාරයාටද, එසේ නැත්නම් වැඩ කරන තැනැත්තාටද, කියායි.

බොහොම ප්‍රසිද්ධ තවත් එකක් තිබෙනව. ගරු ප්‍රවාහණ ඇමතිතුමා දැනටත් ඒවා සුදුස්සන් සතු කරල අවසානයි කියා සඳහන් කළා. ඒක ගැන වෙන්ට ඕනෑ මේ කියන්නෙ:

"අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හුරුලු පළාතේ, මහ පොතාන කෝරළේ නම්බාකඩ.

අංක 2 පංගුව—පලුගහ පංගුව.

සේවාවන්—නුවර කලාවිය හා වන්නිය යන ප්‍රදේශය ඇතුළත. අවුරුද්දකට එක් ගමනක් සඳහා වලව්වේ ළමාතැනියගේ දෝලාව ඔසවාගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]
යාමට මිනිසුන් දෙදෙනකුට නො වැඩි ගණනක් සැපයීම. දින 15 කට නො වැඩි කාලයක් තුළ මී පැණි හෝ තෙල් කදක් රැගෙන යාම සඳහා අවුරුද්දකට වරක් මිනිසකු සැපයීම.

ඉඩම් හිමියාගේ හැලි-වළං රැගෙන ගමනකදී ඔහු සමඟ පසළොස් දිනකට වැඩි නොවන කාලයක් තුළ ගමන් කිරීම සඳහා අවුරුද්දකට වරක් මිනිසකු සැපයීම. පංගුකරුවන් හැම දෙනම එක්ව අවුරුද්දකට වරක් මොරවක හේන වටා වැට බැඳීම, අලුත් අවුරුද්දටත් පරණ අවුරුද්දටත් ගම වෙනුවෙන් පෙනුම් කද බැගින් දීම, මේ පෙනුම් කදකට හාල් නැලියකුත්, කරවල හා එළවළුත්, කෙසෙල් කැනකුත්, පොල් ගෙඩි දෙක හෝ තුන කුත්, බුලත් අතකුත් ඇතුළත් විය යුතුය. නිල කාරයන් විසින් බදු ගෙවිය යුතු අතර රාජකාරි කාලය තුළ දී ඔවුන්ට කෑම-බීම සපයනු ලැබේ."

ඊයෙ-පෙරේදා ගරු ප්‍රවාහණ ඇමතිතුමා මේ ඉඩම් ටික සන්තක කෙරුවෙ ළමා නැනියගේ දෝලාව ඔසවාගෙන ගිය අයට ද? අපට එය පැහැදිලි කරන්නට ඕනෑ. ළමාතැනීගේ දෝලාව උස්සාගෙන ගිය අයටද දුන්නේ? එසේ නැතිනම් මී පැණි හෝ තෙල් කදක් රැගෙන යාමට මිනිසුන් සැපයූ එක්කෙනාටද දුන්නේ? එසේ නැතිනම් හැලි වළං අරගෙන ගමනක් යන විට පහළොස් දවසක් පිටිපස්සෙන් යන්න නියම වෙච්ච එක්කෙනාටද දුන්නේ? එසේ නැතිනම් අවුරුද්දකට වරක් මොරවක හේන වටේ වැට බැන්ද අයට ද දුන්නේ? එසේ නැතිනම් අළුත් අවුරුද්දටත් පරණ අවුරුද්දටත් පෙනුම් කද හොඳින් ගෙනා අයටද දුන්නේ? එසේත් නැතිනම් ගරු ප්‍රවාහණ ඇමතිතුමා කාටද මෙම ඉඩම් දුන්නේ? ඉඩම් ඇමතිතුමා කිව්වා හුරුල්ලේ ඇමතිතුමාගේ නින්දගම් දූනටමත් දීලා අවසානය කියා. කාටද දුන්නේ කියා මා අහනවා. ආනා මූනා සේනා මොහම්මදු මුදලාලිටද එසේ නැතිනම් වැට බැඳපු මිනිහාටද දුන්නේ කියා මා අහනවා. ඒකයි, අපේ ප්‍රශ්නය. අප දන්නවා එම ඉඩම් මිල මුදල් තිබෙන අයට විකුණා තිබෙන බව. මෙම සේවාවන් කරපු උදවිය අද ඇත්තේ නැහැ. අද ඔවුන් එළවා දමා තිබෙනවා. ඒ නිසා දැන් ළමා එතනි උස්සන්න දෝලා වුවමනා කරන්නේ නැහැ. දැන් කාර් තිබෙනවා. 4 ශ්‍රී 9033 දරණ ආණ්ඩුවේ කාර් එක තිබෙනවා. ඒකෙන් යනවා. ළමා එතනිත් යන්නේ ඒකෙන් තමයි. එම නිසා මොක වද දෝලාව? රට රැවටීම සඳහා බොරු කියන්නට එපායැයි අප කියන්නේ එම නිසායි. අසත්‍ය ප්‍රකාශ කරන්නට එපායැයි අප කියන්නේ එම නිසයි. මෙසේ අසත්‍ය ප්‍රකාශ නොකර මේ නින්දගම්වල සේවාවන් කරපු උදවිය හරියාකාර හොයා ගන්නට හැකියාව ලැබෙන අන්දමේ පනතක් ගෙනැවිත් එම පනතේ මාර්ගයෙන් ඒ උදවිය සොයාගෙන ඔවුන් අතරේ මේවා බෙදා දෙමු.

පසුගිය කාලයේදී නින්දගම් හිමියන් කළේ කුමක්ද? සුළු වරදක් දුටු පමණින් මේ නින්දගම්වල සේවාවන් කරපු උදවිය එළවා දැම්මා. සමහර නින්දගම් හිමියන් එසේ කළ අතර තවත් නින්දගම් හිමියන් ඒවා භුක්ති විඳපු අයටම තව දුරටත් භුක්ති විඳින්නට ඉඩ දුන්නා. ඒ උදවිය සාධාරණ අය හැටියට අප සලකනවා. මා මුලින් සඳහන් කළ අන්දමේ අසාධාරණ පිළිවෙළේ නින්දගම් හිමියනුත් සිටියා. කාලාන්තරයක් මුළුල්ලේ පරම්පරා ගණනක් නිස්සේ වෙල් වැඩ කරපු රාජකාරි වැඩ කරපු ගොවියාට සහ සාමාන්‍ය කම්කරුවාට පැවරී තිබුණු අයිතිය නැත්තටම නැති කර දමා අයුක්ති සහගත අන්දමට තමන්ගේ ඉඩම් මුදලාලි කෙනෙකුට විකුණාපු නැනැත්තකු බොහොම ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් කළ කෙනෙකු හැටියට මෙම සභවා ඉදිරියේදී සඳහන් කරන්නට තරම් පහත් තත්ත්වයකට ගරු ඇමතිවරයකු වැටීම ගැන අප කනගාටු වෙනවා.

නින්දගම් පිළිබඳව මෙහි තවත් සඳහන් වෙනවා. තමුන්නාන්සේ කියාපු අතවලයාගේ නින්දගම ගැන නම් මෙහි නැහැ. ඒ කියන්නේ, බෙල්ල කපාපු අතවලයාගේ නින්දගම් ගැන——

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
අතවලයාගේ නින්දගම කොයි නින්දගමද කියා දන්නවාද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කෝකද කියන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම කියන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කියන්නේ නැහැ ඒක. ඒක රහසේ තියා ගන්න. ඒක කියන්න හොඳ නැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේ කියන්න, අතවලයාගේ නින්දගම ගැන. තමුන්නාන්සේ කියනවා ඇත්තේ පුරාණ අතවලයාගේ නින්දගම ගැනයි. අපි කියන්නම් වර්තමාන අතවලයාගේ නින්දගම කුමක්ද කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මා ලඟ ඒ ඔප්පුව තිබෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේ ඒ අතවලයාගෙන් පැවත එන කෙනෙකැයි කියන්නට මා කොහොමවත් කැමති වන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
කියන වේලාවට කියන්නම් කවුදැයි කියා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
අපේ රටේ ඉතිහාසයට ඇතුළත් වෙන්නට වුවමනා හෙයින් මේ රටේ ඇති ප්‍රධාන නින්දගම් මොනවාදැයි මා දැන් සඳහන් කරන්නම්. මේවා මහජනතාව දැනගන්නට ඕනෑ. මහනුවර දිස්ත්‍රික්කයේ නින්දගම් 9ක් තිබෙනවා. අමුණු 36යි, පැල් නැහැ, කුරුණි 8යි. මාතලේ දිස්ත්‍රික්කයේ නින්දගම් 69යි. අමුණු 443යි. නුවර එළිය දිස්ත්‍රික්කයේ එක් නින්දගමක් තිබෙනවා. අමුණු 18යි. බදුල්ල දිස්ත්‍රික්කයේ නින්දගම් 90යි. අමුණු 130යි. රත්නපුර දිස්ත්‍රික්කයේ නින්දගම් 127ක් තිබෙනවා. අමුණු 7457 යි. කෑගල්ල දිස්ත්‍රික්කයේ නින්දගම් 93යි. අමුණු 237යි. කුරුණෑගල නින්දගම් 4යි ; අමුණු 292යි. අනුරාධපුරයේ නින්දගම් 118යි; අමුණු 409යි. මේ අනුව මුළු රටේම ඇති නින්දගම් ගණන 511 යි. ඒවායේ ඇති මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අමුණු 12,337 යි.

කුඹුරුවල තත්ත්වය ඔය ආකාර වුවත් ගොඩ ඉඩම් පිළිබඳ තත්ත්වය මේ වාර්තාවේවත් දක්වා නැහැ. ඒවා ගැන හරියාකාර කරුණු සොයා ගන්නට බැරි බව වාර්තාවේ සඳහන් වෙනවා. එසේ නම් එහි තේරුම 1866 පමණ සන්නස් ලියාපදිංචි කරන විට ඒවා හැරි හැටි ලියාපදිංචි කර නැති බවයි. හරි හැටි ලියාපදිංචි කළා නම් ඒවා පිළිබඳ විස්තර සොයා ගන්නට බැරි වන්නේ නැහැ. ඇත්ත වශයෙන් දැන් නින්දගම් වශයෙන් ඇති ඉඩම් සෑහෙන ප්‍රමාණයක් සන්නස්වලට අයත් ඒවා නොව රජයට අයිති ඉඩම් බව කියන්නට පුළුවනි. එක්කෝ ඒවා ගබඩාගම්විය හැකියි. නැත්නම් විහාරගම් විය හැකියි. එසේත් නැත්නම් දේවාලගම් විය හැකියි. මේවා ආණ්ඩු වෙනස් වන යුගයේදී “අපේ නින්දගම්” යනුවෙන් නාම පුවරුවක් ගසාගෙන භුක්ති විඳගෙන ආ ඉඩම් විය හැකියි. දැනට වගා නොකර. නිලකාරයකු හෝ ගොවියකු හෝ නොමැතිව තිබෙන සියලුම නින්දගම් ඉඩම් රාජ සන්තක කළ යුතු යයි අප තරයේ කියා සිටින්නේ ඒ නිසයි.

ගරු කථානායකතුමනි, මෙම කොමිසන් සභා වාර්තාවේ විස්තර රාශියක් සඳහන්ව ඇතත් ඒවා ඉදිරිපත් කරන්නට කාල වේලාවක් නැහැ. එහෙත් මෙම පනතට අතිශයින්ම වැදගත් කරුණක් දෙකක් පමණක් මා සඳහන් කරන්නට ඕනෑ. මා සඳහන් කරන්නට යන්නේ බණ්ඩාර ඉඩම් හා පරවේණි පංගු ගැනයි. ගරු ඇමතිතුමා මෙම පනතින් නිලකාරයන්ට නින්දගම් අයිති කර දෙන්නට යනවා. නිලකාරයන්ට ඉඩම් වර්ගයක් තිබුණු බව මා මිට ඉස්සර වෙලා සඳහන් කළා. ඒවා පරවේණි පංගුයි. ඒ වාගේම නින්දගම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
PUBLIC LIBRARY
JAFFNA

[ටී. බී. එම්. හේරත් මයා.]

ඉඩම් හිමියන්ට සින්නක්කරව දුන් ඉඩම් වර්ගයකුත් තිබෙනවා. ඒවා බණ්ඩාර පංගු යනුවෙන් සඳහන් වෙනවා. ඉතින් බණ්ඩාර පංගුත් පරවේණි පංගුත් අතර ඇති සම්බන්ධය පිළිබඳව මේ වාර්තාවෙන් පෙන්වා දෙන කරුණු දෙකක් තුනක් ගැන මේ ගරු සභාවේ සැලකිල්ල යොමු කරවන්නට මා කැමතියි. මා මේ කියවන්නේ මෙම කොමිසන් සභා වාර්තාවේ 62 වන පිටුවේ සඳහන් වන 119 වන ඡේද යෙනුයි :

"එක එක විහාරගම් දේවාලගම් හා නින්දගම්වල ඇති පරවේණි පංගු පෙන්වන ලේඛන ඇනත් බණ්ඩාර ඉඩම් පිළිබඳව කිසිම ලේඛනයක් නොමැති බව අපේ වාර්තාවේ 76 වන ඡේදයෙන් පෙන්වා දුන්නෙමු. පරවේණි පංගුවල මායිම ගැන විස්තර නොමැති බවත්, පංගු ඉඩම්වල වපසරිය වර්ග ප්‍රමාණයට පෙරළීමේදී සිදු විය හැකි වෙනස ගැනත් සඳහන් කොට ඇත. එක් අතකින් අයිතිකරුවා හා නිලකාරයා අතරද අනික් අතින් නිලකාරයින්ම අතරද වරින් වර ආරාවුල් පැන නැගීමට මේ දුර්වලකම හේතු වී ඇත. අවුරුදු ගණනක් පසු වීමත් සමග ජනගහණයේ ස්වාභාවික වැඩි වීම නිසා බණ්ඩාර හා පංගු ඉඩම් නැවත කොටස්වලට බෙදීමෙන් තත්ත්වය වඩාත් නරක අතට පෙරළිණ. මේ තාක් පැවති සමගිය භේද කිරීමට මෙය හේතු වී ඇත. එමෙන්ම මේ කරුණ නඩු හබවලට හා අයිතිවාසිකම් පිළිබඳ ආරාවුල්වලටත් තුඩු දී ඇතිවා පමණක් නොව සේවාවන් ඉටු කිරීමේදී අයිතිකාරයාට හා නිලකාරයාට කරදර රාශියකට මුහුණ පෑමට හේතු වී ඇත. වැඩ වසම් ක්‍රමය ගැන අප පසුවට කරන සාකච්ඡාවේදී පෙනෙන පරිදි සේවාවන් බෙදිය නොහැක. එහෙත් පරවේණි පංගු බෙදිය හැක. මේ හේතුව නිසා ඉටු කිරීමට ඇති සේවාවන්ගේ ප්‍රමාණය ඉඩම් අයිති ප්‍රමාණයට වඩා වැඩි වී ඇති බව නිලකාරයන් විසින් කියා තිබේ."

නිල පංගු සහ බණ්ඩාර පංගු පිළිබඳ පැහැදිලි ලිපි ලේඛන මේ රටේ නැති බව මෙයින් පෙනී යනවා. නින්දගම් 511 ක් ලියාපදිංචි කර තිබෙන බව නම් ඇත්තයි. එහෙත් නින්දගම්වලටම අයත් බණ්ඩාර පංගු පරවේණි පංගු පිළිබඳව විස්තර ඇතුළත් ලියකියවිලි නැති බව මේ කොමිසන් සභා වාර්තාවේ සඳහන් කර තිබෙනවා. එහෙම ස්ථිර ලියකියවිලි නැත්නම් මොන විධියටද මේ ඇමතිතුමා ඒවා බෙදා දෙන්නෙ ? ඒවායේ අයිතිය පවරන්නෙ මොන විධියටද ? එක පැත්තකින් පරම්පරා ගණනාවක් තිස්සේ අයිතිකාරයන් වැඩිවී තිබෙනවා. එක අයිතිකාරයෙක්, ඊට පස්සෙ ඔහුගේ දරුවන්, ඊට පස්සෙ දරුවන්ගේ දරුවන් ආදි වශයෙන් අයිතිකරුවන් විශාල ගණනක් වැඩි වී තිබෙනවා. අනික් පැත්තෙන් පංගුව පිළිබඳව මායිම්, විස්තර කිසි දෙයක් නැහැ. කොයි තරම් වපසරිය තියෙනවාද යනාදි කිසි දෙයක් පිළිබඳ විස්තරයක් නැහැ. ඔය වගේ අවුල් තත්ත්වයක් තිබෙන තැනක මේ ඉඩම් අර උදවියට අයිති කර දීමට ගෙනෙන පනත නිකම් හිස් එකක්. ඒ පනතට තිබෙන්නෙ එක වගන්තියයි. "නින්දගම් දරන්නන්ටයි, බදු කාරයන්ටයි අයිති වූ ලෙස ප්‍රකාශ කරනු ලැබේ."

ගරු කථානායකතුමනි, මොන ශක්‍ර ඉන්ද්‍රයාටද මේ පනත ක්‍රියාවේ යොදවන්නට පුළුවන් ? සභාවක් පත් කරනවලු. ඒ සභාවට තියා කිසිම කෙනකුට මේක කරන්නට පුළුවන් දෙයක් නොවෙයි. ඒ නිසයි මා කියන්නේ මේක ප්‍රෝඩාවක්ය කියා. මේක ක්‍රියාවේ යොදවන්නට බැරි පනතක්. බලන්ගොඩ මහජනතාව රවටන්නට දුන් බොරු පොරොන්දුව කෙසේ හෝ ඉෂ්ට කිරීමට—අප නින්දගම් පනතක් සම්මත කළාය කියා ලෝකයට පෙන්වා ගැළවෙන්නට—කරන්නට ලැස්ති වන ප්‍රෝඩාවක් මේ. ඒ නිසයි, මා කියන්නේ මේ වගෙ පනතකින් මේ ප්‍රශ්නය විසඳන්නට බැරිය කියා. මේ විධියට මේ ප්‍රශ්නය විසඳන්නට කොහෙත්ම පුළුවන්කමක් නැහැ.

තවත් විස්තර ඕනෑ තරම් අපට ලබා ගන්නට පුළුවන්. 121 වැනි ඡේදයේ මෙමෙහෙම තිබෙනවා :

"බණ්ඩාර හා පංගු ඉඩම්වල මායිම් හරි හැටි පැහැදිලි නැති හෙයින් විහාරගම්, දේවාලගම් හා නින්දගම්වල නිලකාරයින්ගෙන් අයුතු ප්‍රයෝජන ගන්නා බව සාක්ෂිවල නැවත නැවතත් සඳහන් කොට තිබුණි. අයිතිකරුවන්ගේ හා නිලකාරයින්ගේ අයිතිවාසිකම පිළිබඳ පැහැදිලි වැටහීමක් නොමැති නිසාත් නිලකාරයන්ගේ නූගත්කම, දුප්පත්කම හා සාමාන්‍ය නොදියුණුකමත් නිසා පරවේණි පංගුවලට අයත් ඉඩම් රාශියක් නින්ද හිමියන් හා දේවාල භාරකාරයින් කොටසක් විසින් පිට අයට බණ්ඩාර ඉඩම් වශයෙන් විකුණා ඇති බව නිලකාරයින් විසින් කියා තිබේ. මීට විරුද්ධව නිලකාරයින් විසින් බණ්ඩාර ඉඩම් කොටස් සමග පංගු ඉඩම් රාශියක් විකුණා ඇති බවට අයිතිකාරයින් හා භාරකාරයින් චෝදනාකොට තිබේ. කෙසේ හෝ මෙබඳු වීකිණීම් නිසා විහාරගම්වල හා දේවාලගම්වල සෑහෙන ප්‍රමාණයක්ද නින්දගම්වල ඊට අඩු ප්‍රමාණයක්ද ඉඩම් අයිතිකාරයින්ගෙන් හා නිලකාරයින්ගෙන් ගිලිහී ඇති බව පැහැදිලිය"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒකයි, මට වුවමනා කළ වචනය. "ගිලිහී ඇති බව පැහැදිලිය." ඒ කියන්නෙ, ඒ අය දුන් දිය වෙලා. ඒ අය නැහැ. දුප්පත් හිමියට, නුගත් හිමියට කරන්නට දෙයක් නැහැ; උසාවියට නඩුවක් ඉදිරිපත් කරන්නට බැහැ. නින්දගම් කාරයා බොහොම බලවතෙක්. ඒ නිසා දුප්පත් මිනිහා, නුගත් මිනිහා පැත්තකට තල්ලු වෙනවා. එක්කො රාජාංගන දිහාවට ගිහින් වතුර නැති ඉඩම්වල ඉන්නවා ඇති. එසේ නැත්නම් මහියංගනයේ බලහත්කාරයෙන් කැලෑවක් කපාගෙන ඉන්නවා ඇති. එහෙත් ඒ මනුෂ්‍යයාට මේ පනතෙන් පිහිටක් ලැබෙන්නෙ කොයි විධියටද? ඒ මිනිහාගේ අයිතිය ලබා දෙන්නට මේ පනතේ කොයි වගන්තියෙන්ද පිහිටක් ලැබෙන්නෙ? අප අහන්නෙ ඒකයි. අහවලාට නින්දගම් තිබෙනවා, අහවලාට නින්දගම් තිබෙනවා, ඔය පැත්තෙ උදවියට තිබෙනවා, මේ පැත්තෙ උදවියට තිබෙනවා, ඒ අයට අප පහර ගහන්නට ඕනෑ, කියන එක වෙනම ප්‍රශ්නයක්. අපත් ඒකට එකඟයි. නින්දගම්වලින් වැරදි විධියට ප්‍රයෝජන ගන්න උදවියට හෝ හරි විධියට ප්‍රයෝජන ගන්න උදවියට හෝ ඒවා නොදී, ඒවා රජයේ ඉඩම් නිසා, ඒවා භුක්ති විඳින උදවියට ඒවා හිමිකර දීමේ ප්‍රතිපත්තියට අප සම්පූර්ණයෙන් එකඟයි. එහෙත් මේ පනතෙන් ඒක ඉෂ්ට වන්නෙ නැහැ. ඇමතිතුමා කියනවා, 1966 ඔක්තෝබර් මස 8 වැනිදා සිට තිලකාරයාට අයිති වෙනවාය කියා. හොඳයි, 1965 දී, එහෙම නැත්නම් 1956 දී, එහෙම නැත්නම් 1950 දී, එහෙම නැත්නම් 1900 දී, එහෙම නැත්නම් ඉංග්‍රීසි ආණ්ඩුව ඇති වූ දවසේ—1815 දී—යම් කිසි තිලකාරයකු හෝ ගොවියකු එළෙව්වාය කියා සිතමු. එහෙත් ඔහුට සාක්ෂි තිබෙනවා, ඔහුගේ භුක්තිය ඔප්පු කරන්නට. ඒ මනුෂ්‍යයාගේ අයිතිවාසිකම ආරක්ෂා කර ගන්නට ඇයි අප ඉඩක් නොදෙන්නෙ? ඒ ඉඩම භුක්ති විඳපු මිනිහා 1900 දී, එහෙම නැත්නම් 1956 දී එළෙව්වාය කියා හිතමු. අර අයිතිය ලබා ගන්නට ඒ මිනිහාට මේ පනත් කෙටුම්පත අනුව ඉඩක් නැහැ නේද? 1966 ඔක්තෝබර 8 වැනිදා දක්වා සිටි අයට පමණයි, මේ පනත් කෙටුම්පත අනුව අයිතිය ලැබෙන්නේ. ඊට කලින් අස් කළ අයට අයිතිය ලබා ගන්නට ක්‍රමයක් නැහැ. මොන විධියටද, අයිතිය ලබා ගන්නේ? ඉඩම් ඇමතිතුමාට මේවා ඇහෙන්නේ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කාරක සභා අවස්ථාවේදී යෝජනා කළොත් පිළිගන්නවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කාරක සභා අවස්ථාවේදී යෝජනාවක් ගෙනාවොත් පිළිගන්නවා! බොහොම ස්තුතියි. එහෙත් පැලැස්තර දැමීමෙන් වැඩක් නැති බවයි, අප කියන්නේ. එම නිසා අමුතුවෙන් කල්පනා කර බලන්නට ඕනෑ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒක නොවෙන්නම්, අප කරන්නේ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
රාජ්‍ය ඇමතිතුමා නම් කල්පනා කරන බව මට පෙනෙනවා. ඉඩම් ඇමතිතුමාට කල්පනාවක් තිබෙනවාදැයි මට සැකයි. කල්පනා කරන්නට නම් මනසක් තිබෙන්නට එපායැ? මනසක් නැත්නම් කොහොමද කල්පනා කරන්නේ? "දරන්නා" කියන වචනය වැරදි යැයි එදා අප කීවාම, අද තමුන්නාන්සේලා කියනවා "තිලකාරයා" කියා. එම නිසා අද තවත් අමාරුවක වැටිලා. ගොවියාට නැත්නම් වැඩ කළ අයට දෙන්නේ නැද්දැයි දැන් අප අහනවා. "එයත් කාරක සභා අවස්ථාවේදී සලකා බලනවා" යැයි කියන්නේ නැත්තේ ඇයි?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ප්‍රජාතන්ත්‍රවාදය අනුව වාදය ඔහොම තමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

වාදය එහෙම තමයි. එහෙත් මා කියන්නේ ඒ ගැන නොවෙයි. 1966 ඔක්තෝබර 8 වැනිදට කලින් අහිමි වුණු අය ගැනත් සලකා බලනවාද කියායි මා අහන්නේ. ඊට උත්තරයක් දෙන්නට ඉඩම් ඇමතිතුමාට පුළුවන් වුණේ නැහැ. කාරක සභා අවස්ථාවේදී යෝජනාවක් ගෙනාවොත් පිළිගන්නා බව රාජ්‍ය ඇමතිතුමා කීවා. එතුමා වගකිව යුතු ඇමතිවරයකු නිසා අප එතුමාගේ කීම පිළිගන්නවා. එහෙත් "අර දෝලාව උස්සාගෙන ගිය මිනිසුන්ටත් අයිතිය දෙනවා දැයි" ඇහුවාම ඉඩම් ඇමතිතුමා කථා නොකරන්නේ ඇයි? "එයත් කාරක සභා අවස්ථාවේදී සලකා බලනවා" යැයි නොකියන්නේ ඇයි? එහෙම කීවොත් ඒ තර්කය එතෙකින් නවත්වා, වෙනත් කාරණයකට බහින්නම්. අන්න, ඔළුව හොලවනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
තවත් තර්ජන තිබෙනවාද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තර්ජන? තර්ජන නැහැ.

කථානායකතුමනි, වාර්තාවේ ඊළඟ කොටස කියවන්නම්:

"තේ, රබර්, පොල් ආදී ගොවි කර්මාන්තවල දියුණු වීමත් සමඟ මේ ඉඩම්වල බෙදී යෑම සීඝ්‍රයෙන් සිදු වී ඇති. ඉඩම්වල තුබූ අවශ්‍යතාවය නිසාත් ගොඩ ඉඩම් ලාභ ලැබෙන පරිදි ප්‍රයෝජනයට ගැනීමට අයිතිකාරයින්ගේ හා තිලකාරයින්ගේ තුබූ උදාසීනත්වය නිසාත් හේන් විශාල ප්‍රමාණයක් ධනපතීන්ගේ අතට පත් විය. මොවුහු හේන්වල තේ, රබර්, පොල් වගා කොට කාලයක් තුළදී ඒවා තේ, රබර් හා පොල් වතු කළහ. ආණ්ඩුවේ ආඥා පැනවීම්, විශේෂයෙන්ම පරවේණි ඉඩම් විකිණීම නීතිගත කොට පනවන ලද 1852 කේ නො. 3 දරන ආඥා පනත සහ විහාර ඉඩම් ලියාපදිංචි කිරීම පිළිබඳ ආඥා පනතේ හා වැඩවසම් ආඥා පනතේ වගන්ති, අයිතිකාරයින්ට හා තිලකාරයින්ට හානි වන පරිදි ඉඩම් බෙදීම උනන්දු කරවීමට හේතු විය. ඒ කාලයේදී ගොඩ ඉඩම් වටිනාකමින් අඩු ඉඩම් වශයෙන් සලකා එයින් විශාල කොටසක් විකුණා තිබේ."

එසේ විකුණු ඉඩම් ගැන ඊළඟට කල්පනා කරන්නට ඕනෑ. තමුන්නාන්සේලාගේ මේ පනත් කෙටුම්පත අනුව දැන් ඒවායේ අයිතිය දෙන්නට යන්නේ කාටද? තිලකාරයන්ටද, ගොවියන්ටද, එහෙම නැත්නම් රාජකාරි කළ අයටද? දේශීය හා විදේශීය ධනපතියන් ඒ නින්දගම් ඉඩම් වැරදි ක්‍රමයට අරගෙන, එහෙම නැත්නම් එවකට පැවැති අධිරාජ්‍යවාදී ආණ්ඩුවේ යම් යම් නීතිමය වෙනස් කිරීම්වලට යටත්ව එම නින්දගම් තමන්ගේ වාසියට හරවාගෙන, එක්කෝ බදු ගෙන නැත්නම් සින්නක්කරවම අරගෙන, ඒවායේ තේ, පොල් හා රබර් වවා දැන් අවුරුදු ගණනාවක් තුළ ඒවා භුක්ති විඳිමින් ඉන්නවා. එසේ තේ, පොල් හා රබර් වවා ඇති නින්දගම් ඉඩම්වලට මේ පනත් කෙටුම්පත අනුව කෙරෙන්නට යන්නේ මොනවාද? එම ඉඩම්වලින් දැනටමත් බදු ලබන නින්දගම් හිමියන්ට තව දුරටත් ඒ බද්ද ලබා ගන්නට ඉඩ දෙනවාද? එහෙම නැත්නම් ඒ ඉඩම් රාජසන්තක කර, ඒවා රජයේ වැවිලි බවට පත් කරන්නට සූදානම්ද? අපට මේ ප්‍රශ්නවලට උත්තර වුවමනා කරනවා. මේ පනතෙ ඒ පිළිබඳව කිසිවක් සඳහන් කර නැහැ. එහෙම නම් මෙය අවශ්‍ය අංගයන්ගෙන් සම්පූර්ණ නොවුණ, අසම්පූර්ණ පනතක් බව අපට කියන්න සිදු වී තිබෙනවා. මෙබඳු පනතක් ගරු සභාවට ඉදිරිපත් කරන්නෙ නැතුව ඉල්ලා අස්කර ගන්නා ලෙස ගරු ඉඩම් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. අවශ්‍ය කාරණා ගැන නියම අන්දමට සොයා බලා ඉන් අනතුරුව ඉදිරිපත් කරනවා නම්, නීතිඥයින්ගෙන් සමන්විත කාරක සභාවක් හෝ පත් කර එමගින් ප්‍රශ්න හරියාකාර විසඳන්න පුළුවන් පනතක් සකස් කර ඉදිරිපත් කරනවා නම් පමණක් අපට සලකා බලන්න පුළුවනි. එසේ නැතුව අංග සම්පූර්ණ නොවන මෙබඳු පනතක් ඉදිරිපත් කරන්නෙ නැතුව මෙය ඉල්ලා අස්කර ගන්නා ලෙස ගරු ඉඩම් ඇමතිතුමාගෙන් නැවත වරක් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙබඳු පනතකින් ගිලිහී ගිය මිනිහාට කිසිම තැනක් ලැබෙන්නේ නැහැ. විදේශික ධනපතියන්ගෙ අයිතිවාසිකම් තව තවත් ආරක්ෂා වීම පමණයි මෙබන්ද කින් සිදු වන්නෙ. දෝලාව උසුලා ගෙන ගිය පුද්ගලයා අමාරුවේ වැටී තිබෙනවා. නමුත් කොන්දොස්තර බේරී තිබෙනවා. මෙයයි ඇති වී තිබෙන තත්ත්වය. එම නිසා මෙබඳු පනතක් ඉදිරිපත් කිරීමෙන් ගරු ඉඩම් ඇමතිතුමා හාස්‍යයට ලක් වෙන්නෙ නැතුව, මහජනතාවගේ හාස්‍යයට මෙන්ම උසාවියේදී නීතිඥයින්ගේ හාස්‍යයට ලක් වෙන්නෙ නැතුව මෙය ඉල්ලා අස්කර ගෙන අංග සම්පූර්ණ පනතක් සකස් කර ඉදිරිපත් කරන ලෙස මතක් කරනවා. ගරු කථානායකතුමනි, සමහර විට ගරු ඉඩම් ඇමතිතුමා සූදානම් නැතුව ඇති මෙවැනි කාරණාවලට ඇහුම්කන් දෙන්න. ඇහුම්කන් දීමට සූදානම් ඇතත් නැතත් කාරක සභා අවස්ථාවේ දීවත් සලකා බැලීම පිණිස අපට මේ කරුණු ඉදිරිපත් කරන්න සිද්ධ වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, කොමිෂන් සභා වාර්තාවේ දක්වා ඇත්තෙ මෙන්න මේ අන්දමටයි :

"ඒ කාලයේදී ගොඩ ඉඩම් වටිනාකමින් අඩු ඉඩම් වශයෙන් සළකා එයින් විශාල කොටසක් විකුණා තිබේ. එහෙත් කුඹුරු ඉඩම් එසේ විකුණා නැත. මේ නිසා අද ඇති තත්ත්වය නම් බණ්ඩාර හා පරවේණිවලට අයත් ගොඩ ඉඩම් විශාල ප්‍රමාණයක් විකුණා ඇති අතර සෑම විහාර, දේවාල හා නින්දගමකම පාහේ අයිතිකාරයින්වත්, ඒවායේ වාසය කරන නිලකාරයින්වත් කුඹුරු තවම අයිතිව තිබිමයි."

මා කලින් සඳහන් කළේත් මේ කාරණයයි. කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් යම් කිසි සහනයක් සැලසී ඇති නමුත් ගොඩ ඉඩම් සම්බන්ධයෙන් එබඳු සහනයක් සලසා නැහැ. ගොඩ ඉඩම් සම්බන්ධයෙනුත් හරියාකාර කල්පනා කර බලා, ප්‍රශ්නය විසඳෙන ආකාරයට විසඳීමක් කරන්න ගරු ඇමතිතුමාට ඉඩකඩ තිබුණා. නමුත් එබඳු විසඳීමක් කරන්න වැයමක් කර නැහැ.

කොමිෂන් සභා වාර්තාවෙ 122 වන ඡේදයේ මෙසේ තිබෙනවා :

"පරවේණි පංගු සැකයක් නොමැතිව පරවේණි නිලකාරයින්ගේ දේපල වන අතර බණ්ඩාර ඉඩම් නිලකාරයින් වෙනුවෙන් අයිතිකාරයින් භාරයේ තබා ගන්නා නිසා......"

මෙහි දැක්වෙන අන්දමට බංඩාර ඉඩම් අන් සතු කරන්න බලයක් නැහැ. මේ පනතෙ නින්දගම් කියන වචනයට බණ්ඩාර ඉඩම් නැතිනම් බංඩාර පංගු ඇතුළත් කර තිබෙනවා. මේ නිසා උසාවියට ගියාම ඇති වන තත්ත්වය මොකක්ද? පරණ නීතිය අනුව නින්දගම් ඇතුළෙ ඇති බංඩාර පංගු කාටවත් පවරන්න බැහැ. නමුත් තමුන්නාන්සේ ඉදිරිපත් කර ඇති මෙම පනතේ හැටියට දෙන්න පුළුවනි. මේ නිසා පනත් දෙක අතර ගැටීමක් ඇති වෙනවා. එම නිසා අප කියා සිටින්නෙ පැරණි පනත් අවලංගු කරන ලෙසයි. එහෙම නැතිනම් මෙබඳු අඩුපාඩුකම් සකස් කර පනතක් ඉදිරිපත් කරන්න. නැතිනම් මෙය විහිළුවක් බවට පත් වෙන්න පුළුවනි.

ගරු කථානායකතුමනි, බණ්ඩාර පංගු නිලකාරයින් වෙනුවෙන් අයිතිකාරයින් භාරයේ තිබුණු බව මෙම කොමිෂන් සභා වාර්තාවෙන් පැහැදිලිව පෙනී යනවා. මා ඒ කොටස තමුන්නාන්සේට දැන් පෙන්නා දෙන්නම් :

"..............බණ්ඩාර ඉඩම් නිලකාරයින් වෙනුවෙන් අයිතිකාරයින් භාරයේ තබා ගන්නා නිසා 'ඔතු' වැනි සිරිතක් වශයෙන් ගන්නා බදු ගෙවූ විට නිලකාරයින් ඒ ඉඩම් ගොවිතැන සඳහා ඉල්ලා සිටියොත් ඔවුන්ගේ ඉල්ලීම්වලට ප්‍රමුඛත්වය හිමි වේ."

මෙයින් පැහැදිලි වෙනවා, බණ්ඩාර ඉඩම් නිලකාරයින් "ඔතු" ගෙව්වොත්—ඔතු යනු පරණ ව්‍යවහාරයේ හැටියට, ආදායමින් දහයෙන් පංගුවක් බද්දක් වශයෙන් ගෙවීමයි—නිලකාරයින්ට එම ඉඩම් භුක්ති විඳින්න පුළුවනි. හොඳයි, බණ්ඩාර පංගු නිලකාරයින් භුක්ති විඳිනවායයි සිතමු. පරණ රජ දරුවන්ගේ ප්‍රතිපත්ති හැටියට නැතිනම් ඒ කාලයේ සිට පැවතෙන නීතියේ හැටියට මෙම පංගුවල සම්පූර්ණ අයිතිය, සින්නක්කර අයිතිය නින්දගම් හිමියාටයි. මෙහි වෙනසක් කරන්න බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

නමුත් "ඔතු" ගෙවන නිසා තමුන්නාන්සේලාගේ පනතෙ හැටියට නිල කාරයින්ට බණ්ඩාර පංගුවල අයිතිකාරයින් වෙන්න ඉඩ තිබෙනවා. මේ නිසා නීති එකිනෙකට ගැටෙනවා. මා නීතිඥයකු නොවූවත් සාමාන්‍ය මිනිහකුට වුණත් මේ ගැන වැටෙහෙනවා නොවෙද? නීතිඥයකු නොවුණාට මොලේ ඇති ඕනෑම කෙනෙකුට මෙහි ඇති පරස්පර විරෝධතාව වැටහෙනවා. ඒ නිසා කරුණාකර එවැනි තැන් මේ පනතේ නොවැටෙන සේ සකස් කරන්න.

ඊටත් වඩා භයානක තත්ත්වයක් මෙහි තිබෙනවා. ගරු ඇමතිතුමා මෙම පනත සම්මත කළ පමණින් නින්දගම් හිමියන් නිශ්ශබ්ද වන්නේ නැති බව ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. නින්දගම් හිමියන් මෙම කොමිසමට කියා ඇති දේ මෙන්න බලන්න. මා කියවන්නේ 63 වන පිටුවේ 123 වන ඡේදයෙන් :

"මීට විරුද්ධව විහාර හා දේවාල භාරකාරයින් සහ නින්ද හිමියන් කියා සිටියේ ඔවුන් බණ්ඩාර ඉඩම්වලට සම්පූර්ණ හා තනි අයිතිකාරයින් වෙනවා පමණක් නොව............"

සම්පූර්ණ හා තනි අයිතිකරුවන් පමණක් නොව—

"...............ඔවුන් සතුව ඇති සන්නස් නිසා පරවේණි පංගු පවා අයිති වන බවත්, නිලකාරයින්ට පරවේණි පංගු තබා ගැනීමට අයිතිය ලැබෙන්නේ සංඝයාවන්ට හෝ නින්ද හිමියන්ට සේවය කිරීමට බැඳී සිටියොත් පමණක්ය යන්නය."

ඒ උදවිය කියන්නේ බණ්ඩාර පංගුවල සම්පූර්ණ හා තනි අයිතිය පමණක් නොව, නිලකාරයන් භාරේ තිබෙන පංගුත් ඒ උදවියට අයිති බවයි. එහෙම නම් තමුන්නාන්සේ මේ පනත සම්මත කළාට පස්සේ ඒ නින්දගම් හිමියන් නිශ්ශබ්දව සිටින්නේ නැහැ. ඒ අය නීතියේ පිහිට සොයාවි. එදාට තමුන්නාන්සේට සිද්ධ වේවි නැවත නැවතත් සංශෝධන ඉදිරිපත් කිරීමට. අපේ පනත්වලට සිදු වී තිබෙන්නේ ඒක නොවේද? හරියට සකස් කරන්නේ නැහැ, නැවත නැවත සංශෝධන ඉදිරිපත් කිරීමට සිදු වෙනවා.

මා කලිනුත් සඳහන් කළා කුඹුරු පනත බොහෝම හොඳ පනතක් නමුත්, අද එයට සිදු වී තිබෙන තත්ත්වය ගැන. නඩු අහනවා, ගොවියාගේ වාසියට තීන්දුව ලැබෙනවා. අභියාචනා කරනවා, ගොවියාගේ වාසියට තීන්දු වෙනවා. එහෙත් අර බලහත්කාරයෙන් සිටින මිනිහා කුඹුරෙන් එළවා ගැනීමට නීතියක් නැහැ. නැවතත් ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කර සම්මත කරගැනීමට සිදු වී තිබෙනවා. දහස් ගණනක් ගොවීන්ට කුඹුරු අයිතිය තවමත් දී නැහැ.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**

*(கௌரவ டி. பி. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

ඒක උසාවියේ වැරද්දද පනතේ වැරද්දද කියන්න බැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

වැරද්ද කාගෙද කියා මා දන්නෙ නැහැ. වැරද්ද කාගෙ වුණත් අපි කියන්නේ වැඩේ කෙරී නැති බවයි. අපට ඕනෑ කරන්නේ වැඩේ කෙරෙන්නයි. අකුරුවල, වචනවල, කඩදාසිවල, එසේ නැත්නම් නිල ඇඳුම්වල උසස් තත්ත්වය නොවෙයි අපට ඕනෑ කරන්නේ. අපට ඕනෑ වැඩේ කෙරෙන්නයි. අද ගොවීන් දහස් ගණනක් අමාරුවේ වැටී සිටිනවා. ඒ නිසා සංශෝධන කර හෝ ඒ කඩතොලු ඉවත් කර කුඹුරු පනත සකස් කර ගත යුතුයි. ඒ විධියට මේ පනතෙන් කඩතොලු තිබ්බොත් මෙයද ක්‍රියාවේ යොදවන්න බැරි බව ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. මේකට අපි විරුද්ධ නැහැ. අපි කියන්නේ ක්‍රියාවේ යොදවන්නට පුළුවන් පරිදි සකස් කරන්නයි.

නින්දගම් ගැන තවදුරටත් කරුණු දක්වන මෙම වාර්තාව, ඉතාමත්ම පැහැදිලිව යම් යම් කරුණු කීපයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙන්වා දී තිබෙනවා. කොපමණ වේලා ගත වුණත් ගරු ඇමතිතුමාගේ දැන ගැනීම සඳහා—විශෙෂයෙන් ඇමතිතුමා මෙය නොකියවා පනත සකස් කර තිබෙන නිසා—මෙයින් වැදගත් කොටසක් මම කියවන්නම්. මම කියවන්නේ 65 වෙනි පිටුවේ 135 වන ඡේදය :

"අප වෙත ඉදිරිපත් කොට ඇති සාක්ෂිවලින් නින්දගම්වල සේවාවන් සම්පූර්ණයෙන් වාගේ අභාවයට ගොස් ඇති බව පැහැදිලිය."

ඒකයි මා විශෙෂයෙන් පෙන්වා දෙන්න හදන්නේ. නින්දගම්වල සේවාවන් සම්පූර්ණයෙන්ම අභාවයට ගිහින් තිබෙනවා නම්, එහි රාජකාර්ය කරන මිනිසුන් නැත්නම්, ඒ ඉඩම් භුක්ති විඳීම නැවතී තිබෙනවාය යි කීම සත්‍යයක් නොවේද? සේවාව නොකරන තැනැත්තන්ට ඉඩම් භුක්ති විඳීමට නින්දගම් හිමියන් ඉඩ දෙන්නේ නැහැ. ඒක ස්වාභාවිකයි. ඇයි? ඒ මිනිස්සු සාමාන්‍ය දුප්පත් මිනිස්සු; ගමේ මිනිස්සු. දැන් තමුන්නාන්සේලා නිලකාරයන්ට ඒ ඉඩම් දෙන්න යනවා. එහෙත් සේවාව කරන තැනැත්තන් පිළිබඳ තත්ත්වය මොකක්ද? සේවාව කරන තැනැත්තන් දැන් එහි නැහැ. ඒ මනුෂ්‍යයා හොයා ගැනීමට මේ පණතේ හැටියට යොදා තිබෙන ක්‍රියා මාර්ගය කුමක්ද? ඔහු සොයා ගැනීමට සමහරවිට පැරණි ඔප්පු තිරප්පු තිබෙන්නට පුළුවනි; රාජ්‍ය ලේඛනාගාරය වැනි තැන්වල යම් යම් ලියකියවිලි තිබෙන්නට පුළුවනි. ඒ මොන ක්‍රමයකින් හෝ එකී මිනිසා හොයා ගන්නට කල්පනා කර තිබෙනවාද?

"නින්ද මුත්තෙට්ටු ගොවිතැන් කිරීම වැනි එක්තරා විශේෂ ක්‍රමයක් ගන්නා, නිදහස් වීමට නොහැකිසේවාවන් හැරුණු විට සෑම පෙදෙසකම වාගේ නිලකාරයින් සියලුම සේවාවන් කිරීම බොහෝ කලක සිට නතර කොට ඇත. මේ සේවාවන් පවා කොතරම් අකාර්යක්ෂමව කෙරෙනවාද කිව හොත් අයිතිකාරයින් සිය කැමැත්තෙන් ඒ සේවාවන් අත්හැරීමට ඉඩ දී ඔවුන්ට සෑහෙන අස්වැන්නක් ලබා ගැනීම සඳහා, මුත්තෙට්ටු ගොවිතැන් කිරීම වෙන අයට දී ඇත. දෝලාවන් ගෙන යෑම, ගමෙන් පිට නින්දගම් හිමියන් යන විට ඔවුන්ට මෙහෙ කිරීම ආදී බොහෝ සේවාවන් නින්ද හිමියන්ගේ ඉල්ලීමක් නොමැතිව ඉබේම නතර වී ඇත. රටේ ගමනාගමන පහසුකම් ආදියේ සිදු වී ඇති වෙනස්කම් නිසා එබඳු සේවාවන් කිරීම අනවශ්‍ය වී ඇත. අවුරුද්දකට වරක් බුලත් හුරුල්ලක් හා "පෙනුම්" ආදිය ගෙන නින්ද හිමියන් බැහැ දැකීම ආදී ගෞරවය සඳහා කරන සේවාවන් ඉතාමත් නොසැලකිල්ලෙන් කරයි. එසේ කරන්නේද නින්ද හිමියා ඉතා නුදුරින් වාසය කරන නිසා එවැනි බැහැ දැකීමක් නොකර සිටීමට නොහැකි වූ විට පමණි. මෙවැනි පුරුදු සිරිත් වශයෙන් කරන නිසා ඒවා අවශ්‍යයෙන්ම එක් පංතියක පුද්ගලයන්ට පමණක් සීමා නොවේ. කෙසේ හෝ නිලකාරයාගේ ගමට ඈතින් නින්ද හිමියා වසන්නේ නම් මේ සේවාවන් ඉටු වෙන වාට වඩා ඉටු නොවෙයි. තමාගේ ගමෙන් හෝ ඇතැම් විට තමාගේ දිස්ත්‍රික්කයෙන් ද හෝ පිට වසන නින්ද හිමියකුට ගොස් ගෞරව දැක්වීම ඔවුන්ගෙන් බලාපොරොත්තු නො විය යුතුයැයි නිලකාරයින් චෝදනා කොට තිබේ. නිදසුනක් වශයෙන්, මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල කෝරලේ පිහිටි රඹුකොලුව නමැති නින්දගම සඳහන් කළ හැක. මුලදී සේවාවන් පවරණ විට නින්ද හිමියගේ වලව්ව තිබුණේ අද වුවද ඔවුන්ට දවස් දෙකක් පමණ ගමන් කළ යුතුව ඇති මාතලේ බව මේ ගමේ නිලකාරයෝ චෝදනා කළහ. එහෙත් අද නින්ද හිමියා නුවර පදිංචිව සිටින නිසා සේවාවන් ඉටු කිරීම පෙරටද වඩා හිසරදය ගෙන දෙන කරුණක් වී ඇත. ඉහත කාලයේදී සේවාවන් ඉටු කිරීමට තිබුණේ එක් නින්ද හිමියකුට පමණකි. ඇතැම් අවස්ථාවල නින්දගම් කොටස් අයිතිකරුවන් කීපදෙනෙකු වලව් කීපයක පදිංචි ව සිටින නිසා, එක් නින්ද හිමියකුට කරන සේවය නින්දගම් කොටස් හිමියන් සියලුදෙනාටම කරන සේවය වශයෙන් පිළිගත්තත් ඇතැම් අවස්ථාවල නින්ද කොටස් හිමියන් සියලුදෙනාම සේවාවන් ඉල්ලා සිටින නිසා කරදර සිදු වන බවට ඔවුන් තවත් චෝදනා කොට ඇත. මෙබඳු චෝදනාවක් කොට තිබුණත්, ඇත්ත වශයෙන් සමහර සේවාවන් නොකරම අත්හරින බවත් අපට දැනගන්නට තිබේ."

මේ සේවාවලින් සමහරක් ඉබේම නතර වී තිබෙනවා; තවත් සමහරක් කරන්නට බැරි නිසා නතර වී තිබෙනවා; තවත් සමහරක්, එක්කෙනකුට කළ යුතුව තිබුණු සේවය සිය ගණනකට කරන්නට සිදු වීම නිසා ඕනෑකමින්ම නතර කර තිබෙනවා. මේ තත්ත්වය නිසා මේ සේවාවන් කළ උදවිය සොයා ගැනීම අද ඉතාමත් අමාරු කාර්යයක් බවට පත් වී තිබෙනවා. ගරු ඇමතිතුමා කලින් මෙම පණතට "නින්දගම් දරන්නා" යන්න ඇතුළත් කර තිබුණේ—එතුමාගේ තේරුම් කිරීම කුමක් වුවත්—මේ තත්ත්වය නිසායි. ගරු ඇමතිතුමා මේ වාර්තා ආදිය කියවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. එම්. හේරත් මයා.]

නැතැයි කියන්නටත් බැහැ. මේ මිනිසුන් සොයා ගැනීම අමාරු නිසා එතුමා මෙම පණතේ 3 වැනි වගන්තිය වශයෙන් "යම් නින්දගම් ඉඩම් දරන්නකු හෝ එහි සෑම බදු කරුවකුම එහි අයිතිකරු වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ" යන්න ඇතුළත් කළා. ගරු ඇමතිතුමාගේ අඹ පැහැදිලි කිරීමෙහි මොනවා තිබුණත් ඇත්ත වශයෙන්ම මේ "දරන්නා" කවුද යන වග අප කල්පනා කළ යුතු යි. මා එදා මේ සම්බන්ධයෙන් ගරු ඉඩම් ඇමතිතුමාට එල්ල කළ චෝදනාවම අදත් එල්ල කරනවා. සේවය කළ අය ඔවුන්ගේ සේවාවන් අත්හැර ගොස් සිටින නිසා අද ඒ අය සොයා ගන්නට බැහැ. එම නිසා, මෙම පණතෙහි "දරන්නා" යනුවෙන් දක්වෙන්නේ නින්දගම් හිමියායි. මේ හිමියන්ට මෙම ඉඩම් රජවරුන් විසින් දී තිබුණේ නැහැ. බුත්තිය දීලා තිබුණ නමුත් අයිතිය දීලා තිබුණේ නැහැ. එම නිසා, ගරු ඉඩම් ඇමතිතුමා රජයේ මේ ඉඩම් ටික නින්දගම් හිමියන්ට සින්නක් කර කර දීමට මෙම පණත ඉදිරිපත් කර තිබෙන බවට මා එතුමාට නැවත වරක් චෝදනා කරනවා. දැනට නින්දගම් පිළිබඳ ප්‍රශ්නය කොයි තරම් අභාවයට ගිහින් තිබෙනවාද? ඇත්ත වශයෙන්ම මේක විශාල ප්‍රශ්නයක්. අනිත් එක නින්දගම් පිළිබඳව අවබෝධයක් තිබෙන අය බොහොම ටිකයි දන් ඉන්නෙ. මෙවැනි පනතක් පිළියෙළ කිරීමේදීත් ක්‍රියාත්මක කිරීමේදීත් ඒ පැරණි පනත් පිළිබඳ නීත්‍යානුකූල දැනීමක් අවශ්‍ය වෙනවා. දැනට තිබෙන තත්ත්වය පිළිබඳව නීත්‍යානුකූල දැනීමක් අවශ්‍ය වෙනවා. මේ කොමිෂන් සභා වාර්තාවේ පළල් වශයෙන් මේ තත්ත්වය ගැන කරුණු පෙන්වා දී තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ එක් එක් නින්දගමක් පිළිබඳව අප පළමු වෙන් කරුණු රැස් කර ගත යුතුයි.

උදාහරණයක් වශයෙන් හොරොව්පතානේ තිබෙන හුරුළුවැව නින්දගම ගනිමු. ඒ නින්දගමේ දැනට කොපමණ සිටිනවාද, සේවාවන් කරන අය කොපමණ සිටිනවාද? කී දෙනෙකු ඒ සේවාවන් අත්හැර ගොස් සිටිනවාද, ආදී වශයෙන් ඒ විස්තර සොයා ගන්නට ඕනෑ. සෑම නින්දගමක් පිළිබඳවම ඒ විස්තර සොයා ගත්තාට පසුව තමයි මෙවැනි පනතක් ඉදිරිපත් කළ යුතුව තිබෙන්නෙ. දැනට තිබෙන දුර්වලතාවලට නියම ප්‍රතිකර්ම යොදන පනතක් තමයි මේ ගරු සභාවට ඉදිරිපත් කළ යුතුව තිබෙන්නෙ.

ඇත්ත වශයෙන්ම මෙවැනි පනතක් සකස් කරන විට මා දන් සඳහන් කළ කරුණු ගැන හොඳින් සොයා බැලිය යුතුයි. ඒ සඳහා එක්කෝ නීතිඥයින්ගෙන් යුත් විශේෂ කාරක සභාවක් පත් කරන්නට පුළුවනි. නැත්නම් මේ ගරු සභාවෙන්ම කාරක සභාවක් පත් කරන්නට පුළුවනි. මේ සෑම කාරණයක් ගැනම අග සිට මුලට මුල සිට අගට සොයා බැලිය යුතුයි. මේ සෑම ප්‍රශ්නයක් ගැනම සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්විය යුතුයි. ඉන් පසු මේ ගරු සභාවට පනතක් ඉදිරිපත් කළ යුතුයි.

මා පෙන්වා දුන් නොයෙකුත් හේතුන් උඩ මේ පනත් කෙටුම්පත දුර්වලයි. බලාපොරොත්තු වන පරිදි මේ පනතින් නින්දගම්වල සේවය කරන අයට යහපතක් කරන්නට බැහැ. පැවරිය යුතු අයට මේ ඉඩම් පවරා දෙන්නට මේ පනතට කිසිම ශක්තියක් නැහැ. එම නිසා මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කරගෙන නියම පනත් කෙටුම්පතක්, ක්‍රියාත්මක කළ හැකි පනත් කෙටුම්පතක්, අවංකව මේ ඉඩම් ලැබිය යුත්තන්ට මේ ඉඩම් ලබා දෙන්නට ක්‍රියා මාර්ගයක් ගතහැකි පනත් කෙටුම්පතක්, ඉදිරිපත් කරන මෙන් මා ඉල්ලා සිටිනවා. එසේ නොකර රට රවටන්නට තැත් නොකරන මෙන් මා නැවතත් ඉල්ලා සිටිනවා.

දන් මේ ඉඩම් නිලකාරයන්ට නොවැ දෙන්නට යනවාය කියන්නෙ. එසේ නම් මේ නිලකාරයින් ගැනත් අප සම්පූර්ණ පරීක්ෂණයක් කර සොයා බැලිය යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ කොමිෂන් සභා වාර්තාවේ නිලකාරයින් ගේ දුෂ්කරතා ගැන මෙසේ සඳහන් කර තිබෙනවා:

"174. නිලකාරයින් දැනට මුහුණ පා සිටින දුෂ්කරතා ගැන සියුම් පරීක්ෂණයක්ද සංඝාවන් ගේ අවශ්‍යතාවයන් සෑම විටම පිරිමසාලීම සහතික වන පරිදි ඒ දුෂ්කරතාවයන්ට ප්‍රතිකර්ම සැලැස්වීම ද අවශ්‍ය වී ඇත.

175. අප වෙත සැල කර සිටි කරුණු අනුවත්, අපගේම පුද්ගලික නිරීක්ෂණ අනුවත් චෝදනා වන්ගෙන් වැඩි ගණනකටත්, නිලකාරයින් අතර පවත්නා අමනාපයටත් ප්‍රධාන කරුණු දෙකක් මූලික වී ඇති බව අපගේ නිගමනයයි.

(අ) ඉඩ කඩම් නැතිකම හා එයින් ඇති වන ආර්ථික දුර්වලතාවය.

(ආ) සමාජ බාධකයන්.

176. නූතන ප්‍රජාතන්ත්‍රවාදී අදහස් සමග මේ ක්‍රමය නොසැසඳෙන බව හා එක්තරා සේවයකට පුද්ගලයෙකු සදාකාලිකව බැඳ තැබීමෙන් වන අයුක්තිය වැනි ප්‍රතිපත්ති උඩ වැඩවසම් ක්‍රමයට ඉදිරිපත් කළ විරෝධයන් ගැන කිසිම විශේෂ සැලකිල්ලක් දක්විය නොහැක. මුල් කරුණ ගැන අපේ වාර්තාවේ 164 වෙනි ඡේදයෙහි සඳහන් කළෙමු. දෙවෙනි කරුණ සැලකීමට භාජනය කිරීමට තරම්වත් සුදුසු නොවේ......"

ඒ කොමසාරිස්වරුන්ගේ අදහසයි. නිලකාරයන්ගේ මෙවැනි දුෂ්කරතා ඇතුළු විශේෂ කරුණු රාශියක් ගැන මේ කොමිෂන් සභාව සොයා බලා තිබෙනවාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනවා. මේ වාර්තාවට ඇතුළු නොකළ තවත් කරුණු රාශියක් මේ කොමිෂන් සභාව සතුව තිබෙනවාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනවා. මෙවැනි පනතක් පිළියෙළ කර එය හරි හැටි ක්‍රියාත්මක කරන්නට නම්, ප්‍රථමයෙන් මේ නිලකාරයන්ගේ දුෂ්කරතා මොනවාද, ඒ නිලකාරයින් තමන්ගේ සේවය අත්හැර ගියේ කුමන හේතු නිසාද, එසේ ඔවුන් සේවය අත්හැර යාමෙන් පසු ඒ ඉඩකඩම්වලට කුමක් සිදු වූවාද, යන මේ කරුණු ගැනත් සම්පූර්ණයෙන් සොයා බැලිය යුතු බව මා ඇමතිතුමාට මතක් කරන්නට සතුටුයි. ඉඩකඩම් නැතිකම හා එයින් ඇති වන ආර්ථික දුෂ්කරතා පිළිබඳව විස්තර කරන මේ වාර්තාව මෙන්න මෙහෙම කියනවා:

"සාමාන්‍යයෙන් නිලකාරයින් අන්ත දුගී බවෙන් පෙළෙන බවද, විශේෂයෙන්ම නියම වශයෙන් සේවාවන් ඉටු කරන්නන් අතර අන්ත දුගී බව පමණින බවද අප වෙත ඉදිරිපත් කළ සාක්ෂිවලින් මනාව පැහැදිලිය. උ. උපග්‍රන්ථයෙහි දැක්වෙන, රත්නපුරයේ දී එක් දිනක සාක්ෂි වලින් තෝරා, උපුටාගත් කොටස් මේ අදහස සනාථ කරයි."

ඒ තරම් දුරට ඒවා ගැන විස්තර කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. කෙටියෙන් කියනවා නම්, නොයෙක් විධියේ බාධා මධ්‍යයේ ඉතිරි වී යම්කිසි නිලකාරයෙක් සිටිනවා නම් ඔහුටත් මේ පනතින් ඉඩමක් පැවරුවාට අපේ විරුද්ධත්වයක් නැහැ. එහෙත් නිලකාරයින්ට පමණක් පැවරීමට මේ පනත අනුව බලාපොරොත්තු වෙනවා නම් කටයුත්ත හරියට ඉටු වන්නේ නැහැ. සමහර නිලකාරයින් තමන්ගේ සේවය අත්හැර ගොස් ඇති බව හොඳටම පැහැදිලියි. ඒවායේ දැන් සිටින්නේ නිලකාරයෝ නොවෙයි. ගරු ඇමතිතුමාට උදාහරණයක් දක්වන්නම්. යම්කිසි කුඹුරක් තිබුණා; එය භාරව සිටි නිලකාරයා දැන් එය අත්හැර ගොස්; දැන් එම කුඹුර වැඩ කරන ගොවියා නිලකාරයෙකුත් නොවේ; පරණ රාජකාරිය කළ කෙනෙකුත් නොවේ; නමුත් කුඹුර නින්දගමක් නම් මේ පනත යටතේ දැන් කුඹුර වැඩ කරන ගොවියාට ඒ කුඹුර අයිති වෙනවාද කියන ප්‍රශ්නය ගරු ඇමතිතුමාගෙන් මා අහනවා. ඔහු නිලකාරයෙකුත් නොවෙයි; රාජකාරිය කළ පරම්පරාවක කෙනෙකුත් නොවෙයි. එහෙත් අවුරුදු පනහක් නැත්නම් හැටක්, එහෙමත් නැත්නම් සියයක් එම ඉඩම වැඩ කර තිබෙනවා. නමුත් මේ පනත යටතේ ඔහුට ඒ ඉඩම අයිති වන්නේ නැහැ. මේ පනත අනුව අයිති වන්නේ නිලකාරයින්ට පමණයි. "දරන්නා" කියන්නේ වැඩ කරන්නා නේද කියා අපි ඇසුවාම ඇමතිතුමා බය වී නිලකාරයා කියා දැම්මා. ඒ අනුව ඇත්ත වශයෙන්ම අයිති විය යුත්තා අයින් වෙනවා. මේකත් අර කුඩු කෑ කතාව වගෙයි. " කියනවා කුඩු කෑ විත්තිය" කී හැටියේ ඔක්කොම හරි. "දරන්නා" කියන්නේ කවුද කියා පැහැදිලි කරන්නය කියා අපි කෑ ගැසූ හැටියේ පනත කල් දමන්නටත් කැමති වී නීති උපදේශකයින් සමග සාකච්ඡා කර එය පැහැදිලි කළා. එහෙත් එදා පැහැදිලි කළ ආකාරයත් අද පැහැදිලි කරන ආකාරයත් දෙක වෙනස්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ ගැන කලිනුත් තමුන්නාන්සේ කිව්වා නේද? දැන් පැය 3ක් කථා කර තිබෙනවා. තව හුඟ දෙනෙක් කථා කරන්නත් සිටිනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මේක වැදගත් කරුණක්, ගරු කථානායකතුමනි. වැදගත් දෙයක් පෙන්වන්නයි මා හදන්නේ. මේ දෙකේ වෙනස මා පැහැදිලිව පෙන්වා දුන්නේ නැහැ. ඒ පැහැදිලි කිරීම පනතේ තිබෙනවා. මුද්‍රණ දෝෂයක් එතන තිබෙන්නේ. එහි මෙන්න මෙහෙමයි පැහැදිලි කර තිබෙන්නේ :

"............යන්නෙන් පරිපාලන දිස්ත්‍රික්ක පනත යටතේ යෙදුණු විට, ඒ ඉඩමේ කැබෙල්ලක් හෝ කොටසක් අවිච්ඡින්නව දරන්නෙක් ඉන් අදහස් කෙරේ ; ".

එහෙත් අද දී ඇති විස්තරයේ එහෙම නැහැ. අද දී තිබෙන්නේ සම්පූර්ණයෙන්ම වෙනස් එකක්. අද කියන්නේ මෙහෙමයි:

" යන්න යම් නින්දගම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදුණු විට මේ පනත ආරම්භවීමේ දිනයට පෙර වැඩවසම් සේවා කාල ආඥපනතෙහි අර්ථානුකූලව එම ඉඩමෙහි යම් ප්‍රවේණි පංගුවක ප්‍රවේණි නිලකාර යකු ව සිටි තැනැත්තෙක් ඉන් අදහස් වේ ; ".

ගරු කථානායකතුමනි, දැන් මේ දෙකේ වෙනස තමුන්නාන්සේට පෙන්වන්නම්. මේ අනුව "දරන්නා" වන්නේ වැඩවසම් ආඥපනතේ අර්ථානුකූලව වැඩවසම් ක්‍රමය යටතේ පංගුකාරයකුව සිටි කෙනෙක් පමණයි. එහෙම නොසිටි අය " දරන්නන් " වන්නේ නැහැ. එහෙම නොවෙයිද ? එහෙම නම්, 1815 න් පසු 1832 දී රාජකාරි වැඩවසම් ක්‍රමය තහනම් කළාට පස්සේ, එසේත් නැත්නම් රාජකාරි වැඩ කරන්නට දැක්වූ අකැමැත්ත නිසා හෝ එවැනි වැඩ කරන්නට බැරිකම නිසා හෝ දුප්පත්කම නිසා හෝ ඉඩම අත්හැර දැමීමෙන් පසු පැමිණි දෙවැනි අයිතිකාරයාට කුමක් සිදු වේදැයි කියන්න. ඔහුට මේ ඉඩම අයිති වන්නේ නැහැ. අර නින්දගම් හිමියාටමයි එය අයිති වන්නේ. අප කියා සිටින්නේ එය අසාධාරණ බවයි. අප කියන්නේ දැනට මේ නින්දගම් ඉඩම් භුක්ති විඳින නින්දගම් හිමියා හැර, එහෙමත් නැත්නම් ඒවා මිලදී අරන් භුක්ති විඳින ධනපතියන් හැර, ඒවායේ අඳකරු වශයෙන් හෝ වෙනත් සේවයක් කරමින් හෝ ඒවා භුක්ති විඳින සෑම තරාතිරමේ කෙනකුටම ඒ ඉඩම් කෙලින්ම පවරන්නට ඕනෑ බවයි. ඒකයි කෙරෙන්නට ඕනෑ. එදා " දරන්නා " යනුවෙන් සඳහන් වීම වැරැද්දක් බව අප කියා සිටියා. අද වෙනත් නමක් ඇතිව එය ගෙනැවිත් තිබෙනවා. වැඩවසම් ව්‍යවස්ථාව උඩ සේවය කරවන නිලකාරයන්ට පමණයි එය අදාළ. ඒ ගණයට වැටෙන එක මිනිහෙක්වත් ලංකාවේ නැහැ. එක මිනිහෙක්වත් ඉන්නවා නම් පෙන්වන්න. වචන යොදන්නට නම් පුළුවනි. එහෙත් මිනිසුන් සොයන්නට බැහැ. මේ පනත හිස් එකක්, වැඩක් නොකෙරෙන පනතක්. ඒ නිසා ආණ්ඩු පක්ෂයේම ඉන්න ගරු මන්ත්‍රීන් මෙයට ගෙන්දගම් පනත යන නම පාවිච්චි කරනවා. මේ පනතට ගෙන්දගම් පනත යයි කියන්නේ විරුද්ධ පාර්ශ්වයේ ඉනන් අප නොවෙයි, ආණ්ඩු පක්ෂයේම ඉන්න ගරු මන්ත්‍රීන්. ඒකයි තත්ත්වය.

ඕනෑ නම් අපට මෙය තව දුරටත් පැහැදිලි කරන්නට පුළුවනි. හුඟක් පැහැදිලි කරන්නට අවශ්‍යතාවක් නැහැ. එහෙත් දැන් අපට සිදු වී තිබෙන්නේ තේරුම් ගත් බව පෙනී යන තුරු පැහැදිලි කරන්නටයි. තේරුම් ගත් බව පෙනෙනවා නම් තව දුරටත් පැහැදිලි කරන්නට වුවමනාවක් නැහැ. තේරුම් ගත්තා නම් ගරු ඇමතිතුමා මෙය අස් කර ගන්නට එපාය. තේරුම් ගන්නේ නැත්නම් කියන්නට එපාය. මෙය කවදා හෝ තේරුම් යා යුතුව තිබෙනවා. මහජනයා කතිරය ගසා මේ ආණ්ඩුව බලයට පත් කළා. ඒ අනුව ඇමතිකම ලැබී තිබෙනවා. ඒ නිසා රටේ ජනතාව මේ ගැන දැනගන්නට ඕනෑ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා දැන් පැය තුනක් තරම් වේලාවක් කථා කර තිබෙනවා. තවත් ගරු මන්ත්‍රීන් කථා කරන්නට බලාපොරොත්තුවෙන් සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**

ගරු කථානායකතුමනි, ඒ අදහසට මා එකඟයි. ඒ නිසා තවත් කරුණු එකක් දෙකක් ගැන පමණයි මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ. කරුණු කීප යක් කෙරෙහි තමුන්නාන්සේගේ සැල කිල්ල යොමු කර මා මගේ කථාව නවත් වන්නට කල්පනා කරනවා.

විශේෂ ප්‍රශ්න ඇති වන අවස්ථාවලදී ගරු ඇමතිතුමා යොදන්නට යන ප්‍රති කර්ම මොනවාද? එක්නැලිගොඩ නින්ද ගම ගැන මෙසේ සඳහන් වෙනවා :

"මේ නින්දගමේ පරවේණි නිලකාරයන් නින්ද හිමිවරුන්ට, එනම් එක්නෙලිගොඩ පවුලට, කරන සේවාවන්, නින්දගම්වල සේවාවන් නැති කිරීමට ගත් තීරණය නිසා, නැති කළ යුතුය."

කොමිෂන් සභාවේ වාර්තාවෙන් යෝජනා කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් මේ පන තින් යම්කිසි යෝජනාවක් ඉදිරිපත් නො කරන්නේ ඇයි? මම ඒ කොටස නැවත වරක් කියවන්නම් :

"මේ නින්දගමේ පරවේණි නිලකාරයන් නින්ද හිමිවරුන්ට එනම් එක්නෙලිගොඩ පවුලට කරන සේවාවන්, නින්දගම්වල සේවාවන් නැති කිරීමට ගත් තීරණය නිසා, නැති කළ යුතුය."

නින්දගම් නැති කළ යුතුයි. නැති කරනවා නම් කාටද අයිති වන්නේ? නින්දගම් නැති කරනවා නම් ඒවා අයිති විය යුත්තේ රජයටයි. එහෙම නොවෙයිද? එහෙම නම් ඒ සම්බන්ධයෙන් වගන්ති යක් මෙයට ඇතුළත් කරන්නේ නැත්තේ ඇයි? ආඥාදායකයන් හැටියට මේ ඉඩම් අරන් හිටපු මිනිසුන් ඒවායින් එලවා දමා බලහත්කාරයෙන් බොහෝ විට විදේශීය හෝ දේශීය ධනපතියන්ට විකුණා හෝ බදු දී හෝ සෙල්ලම් කරනවා. එහෙත් ඒවා අයිති රජයටයි. ඒවා රජයේ ඉඩම්. ඇමතිතුමා මෙතැන කිසිම තේරුමක් නැති පනතක් ගෙනෙ නව. ගරු ඇමතිතුමාට අවසාන වශයෙන් මා මතක් කරන්නෙ මෙයයි. තමුන්නාන් සේගේ පනත කිසිම අර්ථයක් නැති පන තක්. නින්දගම්වල රාජකාරි කළ ගොවීන්ට හෝ නිසාද මුත්තෙට්ටුකාර යින්ට හෝ අඳ මුත්තෙට්ටුකාරයින්ට හෝ පරවේණි පංගුකාරයින්ට හෝ මාරු වෙන පංගුකාරයින්ට හෝ නිලකාරයින්ට හෝ මාරු වන නිලකාරයින්ට හෝ මේ කාට වත් සෙතක් සිද්ද නොවන පනතක් මේක. මේ පනතින් සේවාඩක් සිද්ධ වෙනව නම්, වෙන්නෙ ඊයෙ, පෙරේද මේ ඉඩම් මිලයට ගත් දේශීය හා විදේශීය ධනපතියන්ට පමණයි. ඒ වගේම මේ පනත මීට පෙර උඩරට නීතිය යටතේ සකස් වී තිබුණු අනික් පනත් හැම එක කටම වගේ හාත්පසින්ම විරුද්ධයි. මම මෙපමණ වෙලාවක පෙන්නා දුන් දුර්වල කම් අනුව මේ පනත ක්‍රියාවේ යොදවන්ට පුළුවන්කමක් නැහැ. ක්‍රියාවේ යෙදෙව් වත් කිසිම ප්‍රයෝජනයක් ගන්ට බැහැ. ඒ නිසා කරුණා කර හාස්‍යයට ලක් නොවී, මේ පනත ඉල්ලා අස් කරගෙන, නින්ද ගම් යටතේ දුක් වින්ද මේ රටේ මිනි සුන්ට අවංකව සේවයක් කරන්ට අදහස් කරනවා නම්, මේ ගරු සභාවෙන් විශේෂ කමිටුවක් පත් කර හෝ නීතිවේදීන් අත රින් විශේෂ කමිටුවක් පත් කර හෝ කරුණු සොයා බලා දැනට තිබෙන ප්‍රශ්න හරියාකාර නිරාකරණය කළ හැකි අන් දමේ අංග සම්පූර්ණ නින්දගම් පනත් කෙටුම්පතක් නැවත ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව මෙයින් සමාප්ත කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා 5.32

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)

*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ)*

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

ගරු කථානායකතුමනි, ඉතා විස්තර සහිතව සාරවත් කථාවක් කිරීම ගැන පළමුවෙන්ම වලපනේ ගරු මන්ත්‍රීතුමාට (ටී. බී. එම්. හේරත් මයා.) මා මගේ ප්‍රශංසාව හිමි කරන්ට කැමතියි. මේ පනත් කෙටුම්පත ගැන විපරම් කර බැලූ වාම අපට පෙනී යන්නේ මෙය වැඩි කල්පනාවක් නැතුව සකස් කර තිබෙන බවයි. සමහරවිට ඇමති මණ්ඩලයේ එහෙම අදහසක් නොතිබෙන්ට පුළුවනි. එහෙත් එක්තරා කාලසීමාවක් තුළ මේක ඉදිරිපත් කරන්ට පළමුවෙන් ප්‍රතිඥා දී තිබුණු නිසා මේ විධියට ඕනෑවට එපාවට සකස් වූ පනතක් බවට මෙය පත්ව තිබීම ගැන අප කනගාටු වෙන්ට ඕනෑ

මේ විවේචන අප ඉදිරිපත් කරන්නේ මෙය ජාතික ප්‍රශ්නයක් බවට පත්ව තිබෙන නිසාත්, මෙය ජාතික ප්‍රශ්නයක් වශයෙන් අප පිළිගන්න නිසාත් බව මතක් කරන්ට කැමතියි. දේශපාලන වාසියක් ලබා ගැනීමට ආණ්ඩුවට විරුද්ධව කරන ප්‍රචාරයක් හැටියට අපේ විවේචන නොසලකන ලෙස මා ඉල්ලා සිටිනවා.

කොමිෂන් සභාවක් පත් කරල, තිස් පස් වතාවක් පමණ ඒ කොමිෂන් සභාව රැස්වෙලා හය සියයකගෙන් පමණ සාක්ෂි විමසා බැලීමෙන් පසුව නිකුත් කරන ලද වාර්තාවේ සඳහන් ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහායි නින්දගම් පනත ඉදිරිපත් කර තිබෙන්නෙ.

මෙය ඉදිරිපත් කරන විට ගරු ඉඩම් ඇමතිතුමා විසින් කියන්ට යෙදුන, මෙය ඉදිරිපත් කරන්නෙ රාජාසන කථාවෙන් දුන්න ප්‍රතිඥාවක් ඉටු කරන්ටය කියා. වලපනේ ගරු මන්ත්‍රීතුමා ඒ පිළිබඳව තරමක් කරුණු පැහැදිලි කළා. මේ ඉදිරිපත් කර තිබෙන ආඥා පනතෙන් රාජාසන කථාව මගින් දුන්න ප්‍රතිඥාවත් ඉටු කරන්ට බැරි බව මා මතක් කරනවා. රාජාසන කථාවෙන් දී තිබෙන ප්‍රතිඥාව මෙහෙමයි:

"ඉඩම් බුක්ති විඳීමේ ක්‍රමය සංශෝධනය කිරීමට මහත් උනන්දුවක් දක්වන මාගේ ආණ්ඩුව නින්දගම් යනුවෙන් හඳුන්වන පැරණි වැඩ වසම් ක්‍රමය අහෝසි කරනු ඇත."

මේ ප්‍රතිඥාව කෙතෙක් දුරට ඉටු වෙනවද කියන එක අපි සොයා බලන්න ඕනෑ. ඒ කෙසේ වෙතත් ඒ කොටස විතරක් ක්‍රියාත්මක කිරීමට සෑහෙන ප්‍රයත්නයක් මේ නින්දගම් පනත් කෙටුම්පතින් දරා තිබෙනව. එහෙත් එය සියයට අනූවක් අසාර්ථකයි. 1965 අප්‍රේල් මස පවත්වන ලද රාජාසන කථාවෙහි මෙසේ ප්‍රතිඥා දී තිබෙනවා:

"...... විහාර දේවාල සතු ඉඩම් ගැන ක්‍රියා කිරීම සම්බන්ධව මහා සංඝරත්නයේ අනුශාසනා සහ නිසි අධිකාරීන්ගේ උපදෙස් ලබා ගන්නාව ඇත."

මේ අවුරුද්දේ පෙබරවාරි මස 25 වන දින ඉඩම් ඇමතිතුමා ඒ බව සඳහන් කළා. එය එදින හැන්සාඩ් වාර්තාවේ 1218 වන තීරුවේ සඳහන් වෙනවා. දැන් එම රාජාසන කථාව අවුරුදු 3කින් පරණ වී තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. අවුරුදු 3කට පසුව මේ ක්‍රියාත්මක කරන්නට යන එම ප්‍රතිඥාව කෙටුම්පත් කර තිබෙන්නේ මීට අවුරුදු 13කට ප්‍රථම කෙටුම්පත් කරන ලද කොමිෂන් සභාවක නිර්දේශ අනුවයි.

කොමිෂන් සභාවක් පත් කළ විට එමගින් නිර්දේශ ඉදිරිපත් කරනු ලබන්නේ ඒ කාලයට ඒ අවස්ථාවට අනුකූල වන පරිදි යම් යම් කරුණු හොඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැටියට විමසා බැලුවොයින් පසුවයි. අද තිබෙන දේශපාලන තත්ත්වය ගැනත් අද තිබෙන ආර්ථික තත්ත්වය ගැනත් අද තිබෙන සමාජ තත්ත්වය ගැනත්, ඒ වාගේම අපේ සංස්කෘතියක් ඇති කර ගැනීම පිළිබඳව අද පවත්නාවූ විශාල අභිලාෂය ගැනත් කල්පනා කර බලන විට, මීට අවුරුදු 13කට ප්‍රථම කරන ලද නිර්දේශයන් සියයට සියයක්ම භාර ගන්නට නොහැකි බව අපට පෙනී යනවා.

විහාර දේවාලගම් සහ නින්දගම් පිළිබඳව පවත්නා ප්‍රශ්නය කුමන අන්දමින් විසඳිය යුතුද යන්න විමසා බලන්නට පත් කරන ලද කොමිෂන් සභාවක වාර්තාවක් හැටියටයි, මෙම වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ. එම කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ප්‍රධාන තැන ගත්තේ සර් ඊ. ඒ. ඇල්. විජේවර්ධන මහතායි. අනික් අය ඇස්. ඒ. අයි. ඇළපාත දිසාව, සී. ආර්. ගුණරත්න මහතා, සහ සී. බී. ඇල්ලෙපොල මහතා. ලේකම් වශයෙන් සිටියේ ආර්. ඩබ්ලිව්. තෙන්නකෝන් මහතායි. ඒ කාලයේ හැටියට එම රජයේ ප්‍රතිපත්තිවලට අනුව වග කිවයුතු පිරිසක් විසින් ඉදිරිපත් කරන ලද කොමිෂන් සභා වාර්තාවක් හැටියට අපට මෙය හඳුන්වා දෙන්නට පුළුවනි. එම කොමිෂන් සභාව විහාරගම් දේවාලගම් සහ නින්දගම් යන තුන් කණ්ඩායම ගැනම කල්පනා කර බලා නිර්දේශ ඉදිරිපත් කර තිබෙන බව පෙනෙනවා. එම නිර්දේශවලින් කොටසක් පමණයි, ගරු ඉඩම් ඇමතිතුමා මෙම නින්දගම් පනතට ඇතුළත් කරන්නට උත්සාහ කළේ.

සංක්ෂේප වශයෙන් එම නිර්දේශවල සඳහන් වන්නේ මොනවාද? 113 වන පිටුවේ එය සඳහන් වෙනවා. විහාරගම් දේවාලගම් සහ නින්දගම් යන ශීර්ෂය යටතේ එහි (අ) කොටසේ නිර්දේශ 8ක් සඳහන් වෙනවා. විහාරගම් හා දේවාලගම් යන ශීර්ෂය යටතේ එහි (ආ) කොටසේ නිර්දේශ 33ක් සඳහන් වෙනවා. නින්දගම් යන ශීර්ෂය යටතේ එහි (ඇ) කොටසේ නිර්දේශ 7ක් සඳහන් වෙනවා.

එම නිර්දේශ 48න් නින්දගම් යටතේ කර තිබෙන නිර්දේශවලිනුත් කීපයක් පමණයි, මෙම නින්දගම් පනතට ඇතුළත් කර තිබෙන්නේ. එක එක ශීර්ෂය යටතේ මෙම නිර්දේශ ඉදිරිපත් කර ඇතත්, ඒවා වෙන් වෙන් වශයෙන් ගෙන ක්‍රියාත්මක කිරීම අමාරුයි. එයින් නියම ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ. එම කොමිෂන් සභාවේ අදහස ඒ ශීර්ෂ 3 යටතේම තිබෙන නිර්දේශයන් පරීක්ෂා කොට ඒවා ක්‍රියාත්මක කිරීමයි. එසේ හෙයිනුයි, මෙම ආණ්ඩුව පිහිටුවූ දාම වාගේ රාජාසන කථාවෙන් අර අන්දමේ ගම්භීර ප්‍රතිඥාවක් දුන්නේ. නින්දගම් ක්‍රමය අහෝසි කිරීමෙන් වැඩ වසම් ක්‍රමය අහෝසි කර දමන ගමන්ම විහාර දේවාලගම් පිළිබඳ ප්‍රශ්නය ගැන මහා සංඝයා වහන්සේලාගේ අදහස් විමසා කටයුතු කරන බව සඳහන් කළා. එහෙත් අවුරුදු තුනක් ගියාට පසුව ගරු ඇමතිතුමා ඒ දෙවැනි කොටස ප්‍රතික්ෂේප කර දමා තිබෙනවා. ඊට නිදහසට කරුණක් වශයෙන් 1956 පළමුවැනි සැසි වාර්තාවේ 114 වැනි පිටුවේ 4 වැනි වගන්තියේ ඇති "That services in viharagam and devalagam should be retained—විහාර ගම්වල හා දේවාල ගම්වල සේවාවන් පවත්වාගෙන යා යුතුය" යන්න ගැන සඳහන් කළා. මෙය නිර්දේශ 33කින් එකක් පමණයි. ඉහත කී නිර්දේශය නිසාම විහාර ගම්වලත්, දේවාල ගම්වලත්, ඊට ඒකාබද්ධව තිබෙන නින්දගම්වලත් ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම අමතක කර දමා අතනින් මෙතැනින් කරුණු කීපයක් ඇතුළත් කොට මෙවැනි පනතක් සාදා තිබෙනවා. මෙවැනි පනතකින් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කීවාක් මෙන් මෙම නින්දගම් පනත කිසි කලෙකත් ක්‍රියාත්මක කරන්නට පුළුවන් වන්නේ නැහැ. මෙයින් සිදු වන්නේ ගම්බද ජනතාවගේ දුක් කම්කටොළු තව තවත් අවුලෙන් අවුලට පත්වීම පමණයි. ඒ මිස අබැට මාත්‍රයක් පමණකින්වත් එකම ප්‍රශ්නයක්වත් විසඳෙන්නේ නැහැ. මෙම පනත මේ විධියට සකස් කිරීම ගැන මා පුදුම වෙනවා. අපත් ආණ්ඩු කර පුරුදු උදවියයි. මේ විධියේ අපරීක්ෂකාරී ලෙස කෙටුම්පත් පනතක් ඉදිරිපත් කිරීම පුදුම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

සහගතයි. මේ කොමිෂන් සභා වාර්තාවවත් හරිහැටි කියවා නීති කෙටුම්පත් කරන උදවියට යම් යම් උපදෙස් දුන්නා නම් මේ විධියට මේ පනත කෙටුම්පත් වන්නේ නැහැ. එහෙම නම් මේ පනත මේ විධියට හිනාවට ලක් වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, විජයවර්ධන කොමිෂන් සභාවේ නිර්දේශවල නින්දගම් ඉඩම්වලටත්, විහාර දේවාලගම් ඉඩම් වලටත් බලපාන කරුණු සඳහන් වෙනවා. උදාහරණයක් වශයෙන් 113 පිටුවේ ඇති තුන් වන ඡේදය ඉදිරිපත් කරන්නට පුළුවනි.

"(3) විහාර ඉඩම් පිළිබඳ කොමසාරිස්වරුන්ගේ ඉල්ලීම් පිට පිළියෙල කරන ලද, නිකුත් නොකළ විහාර හිමිකම් පිඹුරුවලට ඇතුළත් නින්දගමක විහාර ගමක හා දේවාල ගමක ආණ්ඩුවේ අයිතිවාසිකම් තිබේ නම්, ඒවා ඉක්මනින් නිරවුල් කිරීම.'

මේ එක රෙකමදාරුවක්. මේ ආණ්ඩුවේ පරමාර්ථය නම් මොකක්දැයි අප දන්නේ නැහැ. කෙසේ වුවත් මේ ඉදිරිපත් කර ඇති අන්දමේ පනතකින් නම් මිනිසුන් බලාපොරොත්තු වන පරමාර්ථ ඉෂ්ට වන්නේ නැහැ. "නින්දගම්" හෙඩිම යටතේ තිබෙන කරුණු ඉදිරිපත් කළාට අර අනෙක් ඒවා ක්‍රියාත්මක නොකර මේ කටයුත්ත සාර්ථක කර ගන්නට බැහැ. අර නිර්දේශවල 4 වන ඡේදය මෙසේයි:

"(4) විහාරගම් දේවාලගම් හා නින්දගම්වල පරවේණි පංගුවලින් වෙනස්ව, පොදුවේ බණ්ඩාර ඉඩම් වශයෙන් සලකනු ලබන ඉඩම් වර්ගයක් තිබේ. එවැනි බණ්ඩාර ඉඩම්, ගමේ ගම් හිමියාට පමණක් අයිති ඉඩම්ය. එපරිද්දෙන්, හැකි ඉක්මණින්, බණ්ඩාර හා පංගු ඉඩම් අතර මායිම් මැන. නියම කළ යුතුය."

මේවා ක්‍රියාත්මක නොකර, මේ නිර්දේශ ඇතුළත් නොකර, නින්දගම් පනතක් හැදීමෙන් කිසිම වැඩක් වන්නේ නැහැ. ඒ වාගේම "නින්දගම්" කියන ශීර්ෂය යටතේ කරුණු 7 ක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ කරුණු 7 න් ඉතාමත්ම වැදගත් කාරණයක් ගැන නින්දගම් පනතේ සඳහන් කර නැහැ. මොකක්ද ඒ වැදගත් කාරණය? 117 වන පිටුවේ 4 වන ඡේදයෙහි මෙසේ සඳහන් වෙනවා:

"(4) විකිණීමෙන් හෝ පැවරීමෙන්, අසම්පූර්ණ කොටස් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශේෂ කොමසාරිස්ට බලය පැවරිය යුතුය."

කැබෙලි ඉඩම් උඩරට තිබෙන විශාල ප්‍රශ්නයක් බව ගරු කථානායකතුමා දන්නවා ඇති. මෙම කැබෙලි ඉඩම් ප්‍රශ්නය නිසා හැම දෙනකුම ඉතාමත්ම අමාරු තත්ත්වයකට මුහුණ පා සිටිනවා. මහජන බැංකුවට ඉඩමක් උකස් කර ණයක් ලබා ගන්නට ගිය විට, එසේ නැත්නම් ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් ණයක් ලබා ගන්නට ගිය විට ඒ උත්සාහය සාර්ථක වන්නේ නැහැ. ගැටළු සහිත ඉඩම් ප්‍රශ්න තිබීම ඊට හේතුවයි. මාරු වෙන පංගු පරවේණි පංගු, ආදි වශයෙන් නොයෙක් විධියට ඉඩම් බෙදී යන නිසා තමයි, මේ කොමිෂන් සභාව ඉතාම සූක්ෂම විධියට කල්පනා කර මේ නිර්දේශය කර තිබෙන්නෙ. ඉඩම් ඇමතිතුමා මේ ප්‍රශ්නය ගැන හොඳ හැටි දන්නවා. එහෙත් ඒ ප්‍රශ්නය විසඳීම සඳහා වචන මාත්‍රයක්වත් මේ පනතේ සඳහන් කර නැහැ.

"ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ අයිතිවාසිකම් නිරවුල් කරන ලද නින්දගම්වල පිහිටි ඉහත සඳහන් වර්ගවලට අයත් ඉඩම් සඳහා ඉදිරිපත් කරන අයිතිවාසිකම් පරීක්ෂා කොට නිරවුල් කිරීම සඳහා විශේෂ කොමසාරිස්වරයකුට බලය ලැබෙන සේ පනතක් සම්මත කිරීම."

ඒක තවත් නිර්දේශයක්. ඒ නිසා මේ නිර්දේශ 3 යටතේ විභාග කර, කල්පනා කර, පනත් කෙටුම්පතක් ඉදිරිපත් නොකළොත්, මේ ආඥා පනතෙන් ප්‍රචාරයට සරිලන විධියේ සේවයක් කරන්නට මේ ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ. සේවයක් කරනවා වෙනුවට සිදු වන්නේ නොයෙකුත් ප්‍රශ්න තව තවත් අවුලෙන් අවුලට පත් වීමයි. ඒ කාරක සභාවට හෝ බලය ලත් කොමසාරිස්වරයාට හිස ඔසවන්නට බැරි තරමට ප්‍රශ්න මතු වෙනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (වී. බී. එම්. හේරත් මයා.) කිව්වා වගේ, මේ සම්බන්ධව පරීක්ෂා කර බලා කටයුතු කරන්නට ඕනෑ. මේ සම්බන්ධයෙන් පළපුරුදුකම් ඇති ඇමතිවරුන් ඉන්නවා. ඉඩම් ඇමතිතුමා වශයෙන් කාලයක් තිස්සේ කටයුතු කළ අගමැතිතුමා ඉන්නවා. රාජ්‍ය ඇමතිතුමත් මේ සම්බන්ධව කරුණු අවබෝධ කර ගෙන තිබෙන නිසා, කාරක සභා අවස්ථාවේදී සලකා බලමුය, කීවා. ඒ වගේම ගරු කර්මාන්ත ඇමතිතුමාටත් මේ සම්බන්ධයෙන් අවබෝධයක් තිබෙනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා බොහොම දක්ෂ ලෙස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙන්වා දුන්නා, කුඹුරු පනතත්, නින්ද ගම් පනතත් කොයි විධියට සට්ටනය වෙන වාද කියා. එකකින් අනික් එකේ තිබෙන ප්‍රාණවත් ගතිය නැති වෙනවා. ඒ නිසා නැවතත් කල්පනා කර මේ නින්දගම් පනත අංග සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, පසුගිය වතාවේ නම් ගරු ඉඩම් ඇමතිතුමා කොහෙත්ම එකඟ වුණේ නැහැ, එතුමාගේ පනත් කෙටුම්පත පිළිබඳව සොයා බලා වැරදි හරි ගැස්වීමට. මේ සභාවේදී එතුමා කීවේ, මා අපේ නීති විශේෂඥයන්ගෙන් විමසා බැලුවාය, මේක මේ විධියට කරගෙන යන්නට පුළුවන්ය කියා ඒ අය කියනවාය, කියායි. හිතුවක්කාර කමටම ක්‍රියා කිරීමට කල්පනා කරන්නෙ නැතිව අද එතුමා ඒ අදහස වෙනස් කර ක්‍රියා කිරීම ගැන මා සතුටු වෙනවා. එහෙත් ඒ වෙනස් කිරීමෙන් සිදු වන්නේ කාරණය තව තවත් අවුලට පත් වීමයි වලපනේ ගරු මන්ත්‍රීතුමා විවේචනය කරන විට ගරු අග මැතිතුමා හිටියේ නැහැ. මේ තියෙන විග්‍රහ යෙන් අපේ අමාරුව තවත් දුරට වැඩි වෙලයි, තියෙන්නෙ.

" 'බදුකරු' යන්න යම් නින්දගම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදුණු විට මේ පනත ආරම්භ වීමේ දිනයට පෙර වැඩවසම් සේවා කාල ආඥා පනතෙහි අර්ථානුකූලව එම ඉඩමෙහි මාරුවෙන පංගුවක මාරු වෙන නිලකාරයකුව සිටි තැනැත්තෙක් ඉන් අදහස් වේ."

වලපනේ ගරු මන්ත්‍රීතුමා කීවා වගේ, එය සම්පූර්ණයෙන්ම පරමාර්ථයට පට හැණියි. මේ අනුව බලකාරයන්ට සිදු වී තිබෙන්නේ වැඩවසම් ලැයිස්තුව සොයා බලා නිලකාරයන් කව්ද, ඒ අයගේ පරම් පරාව කව්ද කියා සොයා බැලීමටයි. එහෙත් දැන් බොහෝ විට උත්සාහ කරන්නේ යම් ඉඩමක කෙනකු පදිංචිව සිට ඒ ඉඩම ගොවිතැන් කරනවා නම්, ඒ ගොවියාට ඉඩම පවරා දෙන්නටයි. මා හිතන පිළි වෙළට මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියත් ඒකයි. එහෙත් මේ පනතෙ තිබෙන අන් දමට බලාපොරොත්තු නැති කෙනකුටයි, අයිතිය පැවරෙන්නෙ. පංගුකාරයා පැත් තකින් ඉන්නවා. සමහරවිට නිලකාරයා වෙනුවට වැඩ කරන තැනැත්තා පැත්ත කින් ඉන්නවා. මේක අයිති වන්නේ නිලකාර යාටයි. ඒ නිසා මේ වැදගත් කාරණය ගැන හොඳ හැටි කල්පනා කර බලා එය විග්‍රහ කිරීමට පමණක් සීමා නොකර, ආඥා පනතටම ඇතුළත් කිරීමට කටයුතු කළොත් ප්‍රයෝජනවත් වන බව මතක් කරන්නට කැමතියි. නින්දගම් පනත් කෙටුම්පතට සම්බන්ධ නොයෙක් කරුණු ඉඩම් ඇමතිතුමා පරීක්ෂා වෙන් කියවා බලා නැති හැඩයි. කෙනකුට හැම එකක් ගැනම මතක තබා ගන්නට බැරි බව මා දන්නවා. එහෙත් නින්දගම් පිළිබඳව කොමිෂන් සභා වාර්තාවක් තිබෙන නිසා අඩු තර මින් එයවත් කියවා බලා, ඒ ඒ කාරණා ගැන සූක්ෂම අන්දමින් සොයා බලා පනත් කෙටුම්පතක් සකස් කරනවා වෙනු වට, බලංගොඩ හා බණ්ඩාරවෙල අතුරු මැතිවරණ ප්‍රචාරක ලිපියක් වශයෙන් කල බලයෙන් සකස් කළ පනත් කෙටුම්පතක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ නිසායි, මේ පටලැවිල්ල ඇති වී තිබෙන්නේ.

නින්දගම් ඉඩම් පිළිබඳව නොයෙකුත් ප්‍රභේද තිබෙනවා. ගබඩාගම්, නින්දගම්, විහාරගම්, දේවාලගම් යනුවෙන් එහි කොටස් 4 ක් තිබෙනවා. රජය විසින් රජ යට යම්කිසි සේවාවක් කරවා ගැනීම පිණිස යම් යම් අයට දුන් ඉඩම් ගබඩාගම් යනුවෙන් හැඳින්වෙනවා. උදාහරණයක් වශයෙන්, රජ මාළිගයේ පැවැත්ම සඳහා වුවමනා කළ නොයෙකුත් ආවතේව තිබුණා. එකී ආවතේව කරවා ගැනීම පිණිස, ඒ සඳහා කිසියම් පිරිසක් ඇඳා ගැනීම සඳහා දුන් ඉඩම් තමයි, "ගබඩා ගම්" කියන්නේ.

රාජ්‍ය තන්ත්‍රය, යුද්ධ තන්ත්‍රය පවත් වාගෙන යෑමට කළ සේවාවන් වෙනුවෙන් යම් යම් අයට දුන් ඉඩම් "නින්දගම්" යනුවෙන් හැඳින්වෙනවා. සමහර විට එය සෙනෙවියකුට, සොල්දාදුවකුට දුන් ඉඩ මක් වන්නට පුළුවනි. ඒ වාගේම, සාහිත්‍ය මය සේවාවන් වෙනුවෙනුත් "නින්ද ගම්" ප්‍රදානය කර තිබෙනවා.

සිංහල රජ කාලයේදී බෞද්ධාගමට අති විශාල තැනක් දුන් නිසා, ගම්වර දී විහාර වල සේවාවන් කරවා ගත්තා. එම විහාරවල නඩත්තුව පිණිස කැපවුණු ඉඩම් "විහර ගම්" යනුවෙන් හැඳින්වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ඒ වාගේම, දේවාල සඳහාත් යම් යම් ඉඩම් කොටස් වෙන් කර දී, ඒවායේ නඩත්තුවට හා සේවාවලට ඒවා කැප කළා. ඒවා "දේවාලගම්" වශයෙන් හැඳින්වෙනවා. මේ අනුව බලන විට, "නින්දගම්" දළ වශයෙන් ප්‍රභේද 4 කට බෙදෙනවා. රාජ්‍ය සේවාවන් වෙනුවෙන් දුන් "ගබඩාගම්," රාජ්‍ය තන්ත්‍රය හා යුද්ධ තන්ත්‍රය පිළිබඳව මෙන්ම සාහිත්‍ය මය සේවාවන් වෙනුවෙනුත් දුන් "නින්ද ගම්," විහාරවල නඩත්තුවට කැප වුණු "විහාරගම්" සහ දේවාල ආදියේ නඩත් තුවට කැප වුණු "දේවාලගම්," ඒ ප්‍රභේද 4 යි.

නින්දගම් පිළිබඳ මේ ප්‍රභේද හතරට ගොඩ-මඩ ඉඩම් හා උයන් වතු යන තුන් කොටසම අයිතියි. පරවේණි පංගු විශේෂ දීමනාවක්. එක්තරා සේවයක් කරවා ගැනීමට හෝ කළ නිසා හෝ සන්නස් මඟින් දුන් ඉඩම් තමයි, "පරවේණි පංගු" වශයෙන් හැඳින්වෙන්නේ. ඒවාට "ප්‍රවේණි පංගු" කියත් කියනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා) දීර්ඝ වශයෙන් විස්තර කළේ ඒවා ගැනයි. පරම්පරාගත "පරවේණි පංගු" විකුණන්ට පුළුවන්ද බැරිද යන සැකය පදනම් කරගෙනයි, එතුමා කථා කළේ.

මුලින්ම නම් ඒ "පරවේණි පංගු" පරම් පරාවෙන් පරම්පරාවට ගියා මිස වෙනත් අයට පවරන්නට කොහෙත්ම පුළු වන්කමක් තිබුණේ නැහැ. කරන සේවාවට යටත් කර පවරන්නට, පසුව හැකියාවක් ලැබුණා. ඉන් පසු සමහරුන් සේවාවට යටත් කර ඒ "පරවේණි පංගු" විකුණා තිබෙනවා. ඒ පිළිබඳ නීති-රීති අප හරියාකාරව දන් නේ නැහැ. එහෙත් "පරවේණි පංගු" විකුණන්ට පුළුවන්ද බැරිද යන්න ගැන මෙතෙක් උසාවිය මඟින් නිදහස් ප්‍රකාශ යක් කර නැහැ. එම නිසා, නින්දගම් පන තට ඒ "පරවේණි පංගු" ඇතුළත් කරන් නට ඉඩම් ඇමතිතුමා තුළ අදහසක් තිබෙ නවා නම් ඒ පිළිබඳ නීති-රීති හරියාකාරව දැනගෙන, නීතිමය අවහිරකම් ඇන නොනඟින විධියට, ඊට බාධක වෙනත් නීති ඇත්නම් ඒවා අහෝසි වන විධියට, මේ පනත් කෙටුම්පතට වගන්ති එක් කරන්නට ඕනෑ. ඒ විධියට කටයුතු නොකළොත්, බොහෝ වෙහෙස මන්සි වී ඉඩම් ලබා දෙන්නට අදහස් කරන අයට ඒවා අහිමි වී එම ඉඩම් අත්පත් කර ගන් නට වෙනත් අයට අවස්ථාව සැලසෙනවා.

ඊළඟට, "මාරු වන පංගු" ගැන බලමු. හරියට අඳකාරයන් වාගේ, "මාරු වන පංගුවල" නිලකාරයන් ඕනෑම අවස්ථාවක වෙනස් කරන්නට පුළුවනි. එක් අවුරුද් දක එක්කෙනකුටත් ඊළඟ අවුරුද්දේ ඔහු අයින් කර වෙනත් කෙනකුටත් දෙන්නට පුළුවනි. මෙහිදීත් නිලකාරයා වෙනස් කරන්නට පංගුකාරයාට බලය තිබෙනවා. "මාරු පංගුව" යනුවෙන් හැඳින්වෙන්නේ එයයි. මෙන්න මේකයි, අද ඉදිරිපත් කර තිබෙන සංශෝධනයෙහි ඇති ගැටලුව. බදු කරු යනුවෙන් හැඳින්වෙන්නේ මාරු පංගු කාරයාලු. එහෙම නම්, මාරුපංගු කාරයා ස්ථිර කෙනකු නොවෙයි. අද එක් කෙනකුත් හෙට තවත් කෙනකුත් අනිද්දා වෙනත් කෙනකුත් වන්නට පුළුවනි. ඒ වාගේම එක්කෙනකු වෙනුවට වෙනත් කෙනකු යොදන්නටත් පුළුවන්කම තිබෙ නවා. මේ අනුව, විශාල ව්‍යාකූල තත්ත්ව යක් මේ සංශෝධනයෙන් ඉදිරිපත් වී තිබෙනවා. මාරු වන පංගුකාරයා බදුකාරයා හැටියට විග්‍රහ කිරීම නිසා නින්දගම් පණතේ ක්‍රියාත්මක භාවය සම්පූර්ණ යෙන්ම නැති වන්නට ඉඩ තිබෙනවා.

සෝල්බරි සාමිගේ කාලයේදී විජයවර්ධන කොමිටිය පත් කරන්නට ප්‍රධාන හේතුව වූයේ විශේෂයෙන්ම උඩරට පළාත් වල තිබුණු ඉඩම් හිඟයයි. නින්දගම් කොමිසම පත් කරන්නට ටික කලකට ඉස්සර උඩරට ගැමි කොමිසම හෙවත් "කැන්ඩියන් පෙසන්ට්රි කොමිෂන්" නමින් තවත් කමිටුවක් පත් කර තිබුණා. විහාර දේවාලගම් හා නින්දගම් නිසා, උඩ රට ගැමියන්ගේ ඉඩම් ප්‍රශ්නය විසඳා ගැනීම ඉතාම අමාරු බව එම කමිටුව මඟින් කරුණු සොයා ගෙන යද්දී පෙනී ගියා. එම ,නිසා, විහාර දේවාලගම් හා නින්දගම් පිළිබඳව කොමිෂන් සභාවක් පත් කොට අවශ්‍ය නිර්දේශයන් ඉදිරිපත් කරන ලෙස ඒ කමිටුව ඉල්ලා සිටියා.

ගරු ඉඩම් ඇමතිතුමා මේ පණත ඉදිරි පත් කරමින් එක්තරා උපහාසාත්මක අන් දමකට කතාව පටන් ගත්තා. එතුමා උඩරට අප්පොලා ගැනත් බණ්ඩාරලා ගැනත් සඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හන් කළා මිස මෙහි ඇත්ත ඇති සැටියෙන් හෙළි වන විධියේ ප්‍රකාශයක් කෙළේ නැහැ. නින්දගම් ක්‍රමය උඩරට අප්පොලාට බණ්ඩාරලාට පමණක් සීමා වුණු දෙයක් නොවෙයි. නින්දගම් යන වචනය පාවිච්චි නොකළත්, පාතරට හාමුලාටත් සිංහල රජ කාලයේදී පමණක් නොව ඉන් පසුවත් නොයෙක් විධියේ තාන්න මාන්න බොහොම ලැබුණා. එම නිසා මේ ප්‍රශ්නයේ දී එක් කොටසක් සම්බන්ධයෙන් උපහාසාත්මකව කතා කිරීම යුතු නැහැ.

1815 න් පසු නින්දගම්වලත් විහාර දේවාලගම්වලත් තිබුණු තත්ත්වය හුඟක් දුරට වෙනස් වුණා. කොයි රටේත් ඉඩම් සාමාන්‍ය ජනතාවට හිමිව තිබුණු බව ඈත අතීතය දෙස බලන විට අපට පෙනී යනවා. එහෙත් රාජ යුගය එළඹුණු විට ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. ලංකාවේ පමණක් නොව ලෝකයේ සෑම තැනම ඒ වෙනස ඇති වුණා. ලංකාවෙහිත් ඒ යුගය වන විට, "ඉඩම් සියල්ලම මට අයිතිය" යි රජතුමා කිව්වා. ඒ අනුව විහාර දේවාලවලට ඉඩම් පවරා දුන් රජතුමා රජයේ පාලන තන්ත්‍රයට වුවමනා විධියට නින්දගම් පවරා දී එතුමාට අවශ්‍ය සේවාවන් ලබා ගත්තා. 1954 වන විට පළ වී තිබුණු වාර්තා අනුව ලංකාවේ නින්දගම් 511 කුත් විහාරගම් 546 කුත් දේවාලගම් 517 කුත් තිබුණා. මෙයින් නින්දගම් හෙවත් ජනතාවට තිබුණු ගම් අමුණු 12,337 යි; විහාරගම් අමුණු 9,653 යි; දේවාලගම් අමුණු 12,730 යි. ඉතාම වැඩි කොටස දෙවියන්ටත්, ඊළඟට මිනිසුන්ටත්, ඊළඟ බුදුන්ටත් දී තිබෙන බව මෙයින් පැහැදිලි වෙනවා. මෙය ඒ කාලයේ අපේ සමාජ තත්ත්වය එක්තරා විධියකින් පිළිබිඹු වන කරුණක්.

සිංහල රජ යුගයට පස්සෙ ඉංග්‍රීසි රජ යුගය ආවා. එසේ පැමිණීමෙන් පස්සෙ මොකද වුණේ? 1815 ට පස්සෙ එම ඉඩකඩම්වල සම්පූර්ණ අයිතිය රජුන්ට බව කියා සිටිමින් ඒවා තමන්ට ඕනෑ හැටියට පරිහරණය කළා.

වාසනාවකට වාගේ 1815 ගිවිසුමේ 5 වන වගන්තියේ වැදගත් කොන්දේසියක් ඇතුළත්ව තිබුණා. එම කොන්දේසිය නම්:

"The religion of Boodho, professed by the chiefs and inhabitants of these provinces, is declared inviolable, and its rites, Ministers and places of worship are to be maintained and protected."

බුද්ධාගම හා සිද්ධස්ථාන ආරක්ෂා කර ගැනීමේ පරමාර්ථයෙන් සකස් කරන ලද මෙම වගන්තිය නිසා විහාර දේවාල සතු ඉඩම් එම ආගමික ආයතනවලටම සතු වුණා. එම අයිතිය හුඟක් දුරට ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන්න හැකි වුණා. එය එක්තරා විධියකට සන්තෝෂයට කාරණයක්.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

1818 ආඥාවෙන් එය වෙනස් වුණේ නැද්ද?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඊට පසුව වෙනසක් වුණා. 1818 ජනවාරි 21 වනදා බ්‍රවුන්රිග් ආණ්ඩුකාරතුමා මේ වගන්තිය පැහැදිලි කර ආඥාවක් නිකුත් කළා. 1817 පැවති ඔක්තෝබර් කැරැල්ලෙන් පස්සෙ ප්‍රකාශයක් කළා, විහාර හා දේවාලගම් කිසිම බද්දකට යටත් කරන්නෙ නැත කියා. මෙම බෞද්ධ විහාර හා දේවාල ආරක්ෂා කිරීමේ වගන්තිය කඩ කරවන්න අබෞද්ධ සංවිධානවලින් විශාල ප්‍රයත්නයක් ඒ කාලයේදී දැරුවා. ඒ කෙසේ වුණත්, සිංහල රජකාලයේදී එම විහාර දේවාලවලට පවරා දුන් ඉඩකඩම් ඒ අන්දමට පවත්වාගෙන යාමට අවහිරයක් වුණේ නැහැ. විශේෂයෙන්ම අබෞද්ධ නොයෙකුත් සංවිධාන එවකට තිබුණු ඉංග්‍රීසි ආණ්ඩුවට බල කළා, විහාර දේවාලවලට පවරා ඇති ඉඩකඩම් ඒ අන්දමින්ම පවත්වාගෙන යන්න ඉඩ දෙන්න එපාය කියා. මා සන්තෝෂයෙන් කියන්න ඕනෑ, 1815දී ඇති කර ගන්නා ලද ගිවිසුමේ 5 වන වගන්තිය පිළිබඳව එකල කවර අන්දමේ බලපෑමක් ඇති වුණත්, එවකට [illegible] ඇන්ඩර්සන් ආණ්ඩුකාරතුමා

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
3053

[ඉලංගරත්න මයා.]
කෙළින්ම කියා සිටියා, එබඳු බලපෑම්වලට යටත් වෙන්න බැරි බව.

එතුමා විසින් ලියන ලද එම ලිපියේ කොටසක් මා කියවන්නම්:

"To afford this protection is the bounden duty of all Governments to all subjects. But it is here in respect to Buddhist persuasion, a duty expressed as a condition in the Treaty, by virtue of which we took possession of the country."

එහි අර්ථය, "මේ ආරක්ෂාව සෑම මිනිසකුටම සෑම ආණ්ඩුවක්ම දීම යුතුකමක්. එහෙත් ලංකාව අප භාරගත් කොන්දේසි අනුව බුඩාගමට විශේෂ තැනක් දීමට බැඳී සිටිමු."

මින් පසුවත් තව තවත් බලපෑම් ඇති වුණ නිසා 1852 දෙසැම්බර් 4 වනදා යටත් විජිත ලේකම් සර් ජෝන් පාකිංටන් ඒ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කළා, එනම්:

"That no representations from other portions of the community will induce Her Majesty's Government to permit any withdrawal of the protection or any infringement of the immunities guaranteed to the Buddhist religion by the Convention of 1815."

"1815 ගිවිසුමේ සඳහන් පරිදි බුඩාගමට විශෙෂ ආරක්ෂාව දීමට විරුද්ධව අබෞඩ කණ්ඩායම්වල ඉල්ලීම්වලින් බිසවගේ රජය පොළඹවා ගත නොහැකිය." එහි අර්ථය ඒකයි. මේ අන්දමට, එවකට මේ රට පාලනය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු 1815 අත්සන් කරන ලද ගිවිසුමේ 5 වන වගන්තියට සැලකිල්ලක් දැක්වීම නිසා අපේ විහාර දේවාල ඉඩම් මේ තත්ත්වයෙන්වත් ගෙන යන්න පුළුවන්කම ලැබුණා.

ගරු කථානායකතුමනි, ඊට පසුව ඇති වුණ සිඹීන් ගැන යමක් සඳහන් කරන්න කැමතියි. ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභා වාර්තාවෙන්, ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට කර ඇති නිර්දේශයන්ගෙන් මේ කාරණා වඩාත් පැහැදිළි වෙනවා. මා හිතන හැටියට අපට ඉඩම් ප්‍රශ්නය ගැන මනා අවබෝධයක් ඇති කර ගැනීමට මේ කාරණා ඉතා වැදගත් වෙනවා.

"The capture of the Kandyan Kingdom also resulted in the adoption of a new land policy which ended the mass expropriation of lands other than paddy fields. The British Raj assumed possession of all forests and chenas by a series of draconian edicts. Among them are Ordinance No. 12 of 1840, to make provision for the prevention of encroachment on Crown lands. Section 7 states that 'all forest waste, unoccupied, or uncultivated land shall be presumed to be the property of the Crown until the contrary thereof be proved, and all chenas and other lands which can be only cultivated after intervals of several years shall, if the same be situate within the districts formerly comprised in the Kandyan provinces (wherein no thombo registers have been heretofore established), be deemed to belong to the Crown and not to be the property of any private person claiming the same against the Crown, except upon proof only by such person."

ඔබතුමාට වැටහෙනවා ඇති, විහාර දෙවාල ඉඩම්වලට අත ගසන්නේ නැත කියා මොන තරම් ප්‍රඥප්ති තිබුණත්, ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කර සම්පූර්ණයෙන්ම ඒ කොන්දේසි කඩන්නට උත්සාහ කර තිබෙන බව.

"Another measure that followed was the Temple Lands Registration Ordinance, No. 10 of 1856. This diminished the rights of the temples by the Crown succeeding to ownership of large extents of forest and waste lands as temples could not pay half the survey fees in order to prepare plans which were to be deposited with the Register of Temple Lands."

1856 අංක 10 ආඥපනත අනුව සියලුම දේවාල හා විහාර වලට සිද්ධ වුණා තමන්ගේ ඉඩම් පිළිබඳව ප්ලෑන් සකස් කර ඉදිරිපත් කිරීමට. එහෙම කළොත් පමණය, ඒ අයට එම ඉඩම් හිමි වන්නේ කියන එක එහි සඳහන් වී තිබෙනවා. එතෙන්දි—

"The Lands Resumption Ordinance, No. 4 of 1887 enabled the Government Agent to resume possession of lands alienated by the Crown which had been abandoned."

ආණ්ඩුව විසින් යම් කිසි කෙනකුට දී තිබෙන ඉඩම් හරියාකාර පාවිච්චි කරන්නේ නැත්නම් ඒවා වහාම ආපසු ගන්න විධියට තවත් ආඥාපනතක් 1844 අංක 4 පනත නමින් ඉදිරිපත් කළා.

"The Definition of Boundaries Ordinance, No. 1 of 1884, enabled the Government to demand the production of deeds and documents of any person claiming lands and to make him pay the cost of survey."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යම් කිසි කෙනකු ඉඩම තමන්ගේය කියා ඔප්පු කරන්නට නම්, ඒ අය විසින් ප්ලෑන් සකස් කර ඉල්ලීමක් කරන්න ඕනෑ. එසේ නොකරනවා නම් ඒ අයට එහි අයිතියක් නැහැ.

"Even the paddy owners were caught in the net which was cast wide, for the Grain Tax Ordinance of 1878 made it obligatory on them to pay a tax based on income, a levy which resulted in the sale of lands belonging to persons who were unable to meet it."

1878 ධාන්‍ය ආඥාපනත ඉදිරිපත් කළාට පසු එක්තරා බද්දක් ගෙවීමට සියලු දෙනාටම සිද්ධ වුණා. අර කොන්දේසිය අනුව නම්—1815 ගිවිසුමේ 5 වෙනි කොන්දේසිය අනුව නම්—විහාර දේවාල ඉඩම්වලින් මොනම බද්දක්වත් අය කර ගත යුතු නැහැ. එහෙත් ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කර සෑම ඉඩමක්ම ඒ යටතට ගැනීමට ඒ අයට පුළුවන්කම ලැබුණා.

"An analysis of several land laws passed till the Land Development Ordinance, No. 19 of 1935, which marks the beginning of a new era, shows that the intention was to enhance the rights of the Crown and not to guarantee the possessions of the subject."

පෞද්ගලික ඉඩම් අයිතිකාරයන්ට ඒවා නිරවුල් කර ගැනීමට අපහසු වන පරිදිත් පුළුවන් තරම් ඉඩම් රජයට ගත හැකි පරිදිත් 1935 අංක 19 ආඥාපනත ඉදිරිපත් කර බලය ගත්තා.

"The aim of the British Government was to make available cheap land for exploitation in the interests of the British planter."

මේ සියල්ලම කෙළේ මොකටද? බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ඉඩම්කාරයින්ට, වතුකාරයින්ට ඉඩම් ලබා දීමටයි.

කථානායකතුමනි, මේ ඉතිහාසය ඉතා වැදගත් ඉතිහාසයක්. තවමත් ගරු ඉඩම් ඇමතිතුමා වැනි උදවිය බොහොම උපහාසාත්මක ලීලාවෙන් තමයි මේ නින්දගම් ගැන, ඒ වාගේම ලංකාවේ පැරණි ඉතිහාසය ගැන, කථා කරන්නේ. මේ සියල්ලටම හේතුව 1817 ඇතිවූ කැරල්ලයි. 1815 දී, ගරු කෘෂිකර්ම ඇමතිතුමා එහෙම ඔලන්දක්කාරයන්ට, ලන්දේසීන්ට, පෘතුගීසිකාරයින්ට සම්පූර්ණයෙන්ම හිස නමා සිටි කාලයේදී ඒ කඳුකර ප්‍රදේශවල සිංහලයින් වීරෝදාර සටනක් ගෙන ගියා. ඒ සටන ගෙන ගොස් බැරිම තැන, 1815 දී, ඒ කොන්දේසි අනුව රට භාර දුන්නා. 1815 ගිවිසුමේ 5 වන වගන්තියේ වැදගත් කොන්දේසියක් තිබුණා. තවමත්, ජාතික හැඟීම් උඩ, ස්වාධීනත්වයක් ලබා ගන්නට උද්ඝෝෂණයක්වත් කරන්නට පුළුවන්කම තිබෙන්නේ ඒ කොන්දේසි නිසයි. පසුව, 1815 දී ඇති කර ගත් ඒ ගිවිසුම කඩ වන ආකාරයට ආණ්ඩුව ක්‍රියා කළ නිසා 1817 දී කැරල්ලක් ඇති වුණා. මහ ජනතාව ඒ වැඩ පිළිවෙළට විරුද්ධව නැඟී සිටියා. විශේෂයෙන්ම මධ්‍යම පළාතෙත්, ඌව පළාතේත් ජනතාව නැඟී සිටියා. බියට පත් බ්‍රිතාන්‍යයන් නොයෙක් ආකාරයේ දඬුවම් පමුණුවමින් ඒ කැරැල්ල සම්පූර්ණයෙන්ම මැඩපැවැත්වීමට කටයුතු කළා. කැරැල්ල මැඩපැවැත්වූවාට පසුවත් නොයෙක් නොයෙක් දඬුවම් පැමිණවූවා. "Scorched earth policy" කියා එකක් තිබුණු බව තමුන්නාන්සේ දන්නවා. යම් රටක් තව රටක් පරාජය කළාම ඒ පරාජය ලැබූ රට ජයග්‍රාහකයින් විසින් සම්පූර්ණයෙන් විනාශ කරන්නට පටන් ගන්නවා. එවැනි දෙයක් මෙතැනත් සිදු වුණා. මේ ගැමි කොමිෂන් සභා වාර්තාවෙන්ම කොටසක් කියවා මා ඒ බව තව දුරටත් පැහැදිලි කරන්නට සතුටුයි. මේ නින්දගම් විහාර දේවාලගම් ඉඩම් පිළිබඳව පුරාණ කාලයේ සිටම මොන විධියේ තත්ත්වයක් තිබුණාද කියා මේවායින් තේරෙනවා:

The following account of the British campaign is given by one historian:

"Wherever they went they carried away or destroyed all cattle and stores of grain or provisions that they found; villages were wiped out, houses were burnt down, crops devastated, fields permanently ruined by damaging the irrigation system, friut trees cut down and livestock killed so as to starve and terrorise the inhabitants into submission. When reinforcements arrived from India, the system was expanded. Numerous posts were created and small detachments scoured the country covering every portion of it and authorized to burn, ravage and destroy, and to put to death all who may be in possession or found with arms in their hands till the last embers of rebellion were stamped out. ..........At the same time the wives, families and property of the rebel chiefs

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

were sequestered to enforce their submission—a policy reminiscent of Sri Wickrema Raja Sinha. When an influential rebel was captured, he was sentenced to death, but the execution was postponed for a period with the published promise of reprieve on condition his relatives submitted before it lapsed—a very efficacious and dubious method. No attempt was made adequately to distinguish the property and persons of the innocent from those of the guilty. Even mere suspects received short shrift from the troops."

ඒ විධියට තමයි ඒ කැරැල්ල මැඩපැවත්වූයේ. අද බොහොම ශිෂ්ට වර්ගයක්ය කියා කථා කරන මේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ඒ කාලයේදී අපේ ලංකා වාසීන්ට සංග්‍රහ කළේ එහෙමයි. රට සෑම තැනම ධන ශූන්‍ය කිරීමේ ව්‍යාපාරයක් පටන් ගත්තා. ඉඩකඩම්, පැල්පත් ගිනි තැබුවා. හොඳට ඇඟපත තිබුණු උදවිය මරා දැමුවා. ඒ විධියට ක්‍රියා කරන අතරම තවත් පළිගැනීමේ ක්‍රියා මාර්ගයක් වශයෙන් තමයි නොයෙක් නොයෙක් නීතිරීති, ඉදිරිපත් කර ආණ්ඩුවට ඉඩම් ගත්තේ. එහෙම ගත් ඉඩම්වලට මොකක්ද කළේ ? අක්කරය සිලිමට දෙකට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ටම වික්කා. යුරෝපීයයන්ට ඉඩම් ගැනීම තහනම්ය කියා නීතියක් 1832 වන තෙක් තිබුණා. නමුත් ඒ නීතියත් පසුව ඉවත් කළා. ඉවත් කර 1832 සිට පුළුවන් තරම් උඩරට ප්‍රදේශවල ඉඩම් ආණ්ඩුවට ගන්නට කටයුතු කළා. නින්දගම්, විහාර දේවාලගම් ඉඩම් පවා ඒ ආකාරයට ගත්තා. අසුවල් දවස වන විට යම් ඉඩමක් වගා කර නොතිබුණා නම් එය රාජසන්තක කරනවාය කියා එකවරම නීතියක් පනවනවා, තවත් දවසක අසුවල් දවසේ සිට වගා කර තිබෙන කුඹුරුවලින් මෙපමණ ප්‍රමාණයක් රාජසන්තක කරනවාය කියා නීතියක් පනවනවා. ඔන්න ඔය විධියේ නොයෙකුත් නරක නීති රීති උඩ ඉඩම් අරගෙන අක්කරය සිලිමට දෙකට බ්‍රිතාන්‍යයන්ට වික්කා. ඒ ආකාරයට ලංකාවේ ඉතාමත්ම සාරවත් ඉඩම් ටික බ්‍රිතාන්‍යයන් සතු කර තිබෙනවා. ඒ සම්බන්ධව මෙන්න මෙහෙම සඳහන් වී තිබෙනවා :

"As a result of Governor Maitland's removal in 1812 of the prohibition against Europeans acquiring lands outside Colombo, a few plantations of coffee, cotton, sugar, indigo and opium were started by Europeans in the maritime provinces. With the fall of the Kandyan Kingdom, it was discovered that the wet zone areas of that kingdom were ideal for the growing of coffee. In 1833 one George Bird acquired land at Sinhapitiya, near Gampola, and planted it in coffee."

මේ විධියට විග්‍රහ කර තිබෙනවා. කොයි තරම්දුරට එය කරගෙන ගියාද කියා මෙහි සඳහන් වෙනවා.

"...The peak figure was reached in 1841 when 78,685 acres were sold. Some of the speculators who bought lands left the lands they purchased uncultivated. In 1845 there were no less than 37,966 acres under coffee as compared with 4,000 in 1836. In 1848 the coffee extents went up to 60,000 acres comprising 367 plantations."

මේ විධියට ඉඩම් අත්පත් කර ගත්තේ ලාංකිකයින් නොවෙයි, විදේශිකයින්. ඒ පරිච්ඡේදයේ අන්තිමට මෙහෙම කියනවා :

"Most of the land legislation during the early British times tended to impoverish the village and to strengthen the hands of speculators in land. The old Kandyan law which gave the seller of any land and his descendants the right to repurchase the land at any time was abolished by proclamation in 1821. These new land laws made village lands alienable; the partitioning of land was made easy; the abolition of rajakariya lossened the bonds which held together the village unit. All these combined to impoverish the villager and destroy the economy of villages and the co-operative social life of inhabitants."

ලංකාවේ ඇති වී තිබුණේ මෙන්න මේ විධියේ තත්ත්වයක්. ඒ නිසා මේක ඉතාම සුළු කොට සලකා අපහාසාත්මක මුඛයෙන් ගරු ඉඩම් ඇමතිතුමා මේ ගැන සඳහන් කිරීම අප කාටත් කනස්සල්ලට කරුණක්. මා කලින් සඳහන් කළා වගේ 1840 දී පැන වූ රජයේ ඉඩම් අල්ලා ගැනීමට විරුද්ධ පනත, 1856 දී පැනවූ විහාර දේවාල ඉඩම් ලියාපදිංචි කිරීමේ ආඥාපනත, 1887 දී පැන වූ "ද ලෑන්ඩ් රිඩෙම්ෂන්" කියන ආඥා පනත, 1884 දී පැනවූ "ද ඩෙfෆිනිෂන් ඔfප් බවුන්ඩරීස්" කියන ආඥාපනත, 1878 දී පැනවූ "ග්‍රේන් ටැක්ස්" කියන ආඥාපනත 1897 දී පැනවූ මුඩුබිම් පනත ආදී ඒවායින් තමයි දුප්පත් අයගේ ඉඩම් ආණ්ඩුවට අරගෙන පළිගැනීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට විදේශිකයින්ට ඉඩම් දුන්නේ. එම නිසා අපේ ඉඩම් ඇමතිතුමා මේ නින්දගම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පනතින් බලාපොරොත්තු වන්නේ මේ කියන ප්‍රශ්න විසඳන්නටද ? වලපනේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) ඒවා ගැන දීර්ඝ වශයෙන් විස්තර කළ නිසා මා ඒ ගැන සඳහන් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් කරුණු එකක් දෙකක් පමණක් ඔබතුමාට පෙන්වා දෙන්නට බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත අනුව සම්පූර්ණ බර දමා තිබෙන්නේ ඉල්ලුම්කාරයා උඩයි. මා හිතන අන්දමට මේ කොමිෂන් සභාවේ නිර්දේශ හරියාකාර කියවනවා නම්, ඒ බර පුළුවන් තරම් ආණ්ඩුව පිට පටවන්නට හදා තිබෙන බව පෙනෙනවා. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හදා කොමසාරිස්වරුන්ට හා නිලධාරීන්ට බලය දී ඒ අය ඉල්ලුම්කරුවන් ළඟට ගොස් ඒ පෝරම පුරවා ඒ ප්‍රශ්නය නිරාකරණය කර ගන්නයි නිර්දේශවල තිබෙන්නේ. මෙහි තිබෙන විධියට සම්පූර්ණයෙන්ම බර පැටවෙන්නේ නින්දගම්වලට හිමිකම් ඉදිරිපත් කරන උදවිය උඩයි. ඒ බව මෙහි 2 වැනි කොටස බැලුවොත් පෙනී යනවා ඇති.

"නින්දගම් ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් ප්‍රදානයක් සඳහා වූ ඉල්ලීම් සහ එබඳු ඉල්ලීම් මණ්ඩලය වෙත යොමු කිරීම"

යන ශීර්ෂය යටතේ තිබෙන කොටසේ ඒ බව සඳහන් වෙනවා. මේ ඉඩම්වලට හිමිකම් කියන්නන්—දරන්නන් නැත්නම් පංගුකාරයන්, මාරු පංගුකාරයන්, බදුකාරයන් යනාදි මොන වචනවලින් හඳුන්වනු ලැබුවත්—පෝර්ම පුරවා ඒ මගින් තමන් අයිතිකාරයන් බව ඔප්පු කරන්නට ඕනෑ. මේ ඉඩම්වල පදිංචිකාරයින් කොයි විධියේ අයදැයි තමුන්නාන්සේ දන්නවා. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ බර ඒ උදවිය උඩ පැටෙව්වොත් නොයෙක් විධියේ දූෂණ රාශියකට මුහුණ පාන්නට සිද්ධ වෙනවා. නියමිත පෝර්ම හරියාකාර පුරවන්නට බැරිකම නිසාත්, ඒවා පිරවීමෙන් පසු යවන්නේ කොහාටදැයි නියම වශයෙන් කියන්නට නොදන්නා නිසාත් නොයෙකුත් කරදරවලට මුහුණ දෙන්නට සිදු වෙනවා. බොහෝ විට බොරු පෝර්ම පුරවන්නට සිදු වීමත් දැන් සිද්ධවන

තිබෙනවා. තමන් වෙනුවෙන් නියම කර තිබෙන සලාකය කොතෙක්දැයි දැනගන්නටත් දැන් ගැසට් නිවේදන බලන්නටයි සිදු වී තිබෙන්නේ. ඒ විධියට හැම එකක් සම්බන්ධයෙන්ම බලන්නට පුළුවන් කමක් නැහැ. ඒ නිසා සිදු වන්නේ කුමක්ද ? අයථා සිද්ධවීම්වලට එයින් ඉඩ ලැබෙන්නට පුළුවනි. ඒ නිසා මේ වගකීම සම්පූර්ණයෙන්ම ඉල්ලුම්කරුවන් උඩම තබන්නට වටින්නේ නැහැ. නිර්දේශවලින් ඉදිරිපත් කර තිබෙන අන්දමටයි කරන්නට ඕනෑ. කොමසාරිස්වරයකු පත් කර, නිර්දේශවල අදහස සම්බන්ධයෙන් ඇති සම්පූර්ණ වගකීම කොමසාරිස්වරයාට පවරන ලෙස නිර්දේශවලින් කියා තිබෙනවා. එහෙත් මෙයින් අදහස් කරන්නේ ඒ වගකීම සම්පූර්ණයෙන්ම ඉල්ලුම්කාරයා උඩට පැවරීමටයි. එයින් ඇති වන ප්‍රතිඵලය ගැන කල්පනා කරන්නට ඕනෑ. පුළුවන් තරම්, ඉඩම් සම්බන්ධයෙන් නඩු කියන්නට වෙනවා. කොමසාරිස්වරයා හමු වී නොයෙක් විට කරුණු ඉදිරිපත් කරන්නටත් ඒ අයට සිදු වෙනවා. දිස්ත්‍රික් උසාවියට යන්නටත් සිදු වෙනවා. එසේත් නැත්නම් ඇපැල් ගන්නට සිද්ධ වෙනවා. ඒ නිසා ඉල්ලුම්කාරයන්ට පහසු වන අන්දමට ආණ්ඩුව මගින් යම්කිසි සංවිධානයක් ඇති කර පළාතෙන් පළාතට ගොස් වැඩ කටයුතු කර දියහැකි අන්දමේ සංචාරක දෙපාර්තමේන්තුවක් ඇති කර ඒ මගින් මේ වැඩ කොටස කෙරෙන්නට ඕනෑ.

ඉඩම් මණ්ඩල ගැනත් වචනයක් කියන්නට ඕනෑ. මෙවැනි ප්‍රශ්නවලදී අප බලාපොරොත්තු වන්නේ ඉතාම වගකිව යුතු මධ්‍යස්ථ පුද්ගලයන්ගෙන් යුක්ත මණ්ඩල ඇති කරනු ලැබේය කියායි. මේ ආණ්ඩුවේ ක්‍රියා පටිපාටිය පිළිබඳව ගත වූ තුන් අවුරුද්දක තරම් වූ කාල සීමාවේ අත්හදා බැලීම්වල ප්‍රතිඵල අනුව අපට හෝ ජනතාවට හෝ ඒ සම්බන්ධයෙන් නම් කිසිම විධියකින් සන්තෝෂ වන්නට බැහැ. ඒ කාරණය මධ්‍යස්ථ අන්දමින් කෙරෙනු ඇතැයි අපට විශ්වාස කරන්නට පුළුවන්කමක් නැහැ. මේ ගරු සභාව තුළ සාම මණ්ඩල සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්නට සිදු වූ කරුණු ගැන ඔබතුමා දන්නවා; ගෙවල් කුලී පාලක



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

මණ්ඩල ගැනත් ඔබතුමා දන්නවා. සාම මණ්ඩල, ගෙවල් කුලී පාලක මණ්ඩල, ඔය ආදි මහජනයාගේ මණ්ඩල ගැන ඔබතුමා හොඳාකාර දන්නවා. සංස්ථාවල බෝඩ් වලට දේශපාලන වශයෙන් තමන්ගේ උදවිය පත් කරනු ලැබීම ගැන යමක් කියන්නේ නැහැ. විශේෂයෙන්ම අධ්‍යක්‍ෂවරුන්, සභාපතිවරුන් වශයෙන් තමන්ගේ උදවිය, තමන්ට පක්‍ෂපාත උදවිය පත් කර ගැනීම සම්බන්ධයෙන් යමක් කියන්නේ නැහැ. එය කවුරුන් විසින් වුවත් කර ගෙන ආ දෙයක්. ඒ නිසා කවර ආණ්ඩුවක් ආවත් දේශපාලන හිතවතුන් අධ්‍යක්ෂවරුන් හැටියට පත් කර ගැනීම ගැන අප විරුද්ධ නැහැ. එසේ කරන්නට හේතු තිබෙනවාය කියන්නට පුළුවනි. එහෙත් සාම මණ්ඩල පිළිබඳව තිබිය යුතු තත්ත්වය එයද? සාම මණ්ඩලවලට දේශපාලන මුහුණුවරකින් පත්වීම් දෙන්නට ගියොත් නීතිය හරියාකාර ක්‍රියාත්මක කරන්නට බැහැ. ඒ නිසා එවැනි වැඩ පිළිවෙළක් ඇති කළොත් ඒ ගැන විශ්වාසයක් තබා කටයුතු කරන්නට බැහැ. මණ්ඩල පත් කිරීමේ බලය ගරු ඇමතිතුමාට පැවරිය යුතු නැහැ. සීනි මණ්ඩලය ගැන අප දන්නවා. එක විනාඩියක්වත් මත් පැනක් නැතුව බැරි ලෙඩෙකුට එය දීලා ලෙඩා මැරී ගියා. වගකිවයුතු තැන් උසුලන්නට පුළුවන් අයට ඒවා දුන්නොත් පමණයි ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි සහ මණ්ඩල කෙරෙහිත් මහජනයා තුළ විශ්වාසයක් ඇති වන්නේ. ඒ නිසා ඉල්ලීමක් කරන්නට කැමතියි. ගරු ඇමතිතුමාට තිබෙන බලතල එතුමා මතම පටවන්නේ නැතිව නිල බලයෙන්, ඒ වාගේම ඡන්ද බලයෙන්, ඒ ඒ තැන්වලට ඒ ඒ මණ්ඩලවලට පුද්ගලයන් පත් කරන්නට අවශ්‍ය නීති සම්පාදනය කරනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

මගේ කථාව මීට වඩා දික් කරන්නට අදහස් කරන්නේ නැහැ. වලපනේ ගරු මන්ත්‍රීතුමා සමග මාත් සියේට සියයක්ම එකඟ වෙනවා. මෙයින් වැඩක් වන්නේ නැහැ. කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කටයුත්තකට, එයින් අඩක්වත් ක්‍රියාත්මක කිරීමට මෙය සෑහෙන්නේ නැහැ. විශේෂයෙන්ම අදසංශෝධන විග්‍රහය නිසා මුලින් තිබුණු සාර්ථක භාවයත් සම්පූර්ණයෙන්ම අහෝසිවෙලා යනවා. ඒ නිසා ඇමතිකමිටුවක් පත් කරල නැවත වරක් මේ ගැන කල්පනා කරල, කොමිෂන් සභාවේ නිර්දේශයන් ගැන තවත් සාකච්ඡා කරල ප්‍රශ්නය විසඳන්ට පුළුවන් අන්දමේ පනතක් ඉදිරිපත් කරන ලෙස ආරාධනය කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනව.

අ. භා. 6.25

**ආර්. ජේ. ජී. ද මැල් මයා** (දෙවිනුවර)
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)

ගරු කථානායකතුමනි, නින්දගම් ඉඩම් පනත් කෙටුම්පත පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්ට ඉඩ ලැබී තිබෙන මේ අවස්ථාව ඉතා ප්‍රීති ජනක අවස්ථාවක්ව තිබෙනව. ඉඩම් අයිතිය, ඉඩම් භුක්තිය පිළිබඳ නීති සමාජවාදී අදහස් අනුව ප්‍රතිසංස්කරණය වෙනව නම් විරුද්ධ පාර්ශ්වයේ අපි ඊට එකඟ වෙනවා මිස කවදාවත් ඊට විරුද්ධ වෙන්නෙ නැහැ. එහෙත් මේ දැනට ඉදිරිපත් කර තිබෙන ඉඩම් භුක්තිය පිළිබඳ නීතියේ නොයෙක් අඩුපාඩුකම් රාශියක් තිබෙන නිසා ඒවා මේ ගරු සභාවට පෙන්වා දීම අපේ යුතුකමක් යයි මා සලකනවා. මේ නින්දගම් ඉඩම් පනතේ පරමාර්ථය දක්වා තිබෙන්නෙ මෙහෙමයි:

"නින්දගම් ඉඩම් දරන්නන් හා ඒවායෙහි බදු කරුවන් විසින් ඒවායෙහි අයිතිකරුවන් වෙත කළ යුතු සේවා නැති කිරීම සඳහාත්, ඒ ඉඩම් දරන්නන් හා බදුකරුවන් ඒ ඉඩම්වල නියම අයිති කරුවන් කිරීම සඳහාත්, ඒ ඉඩම් දරන්නන් හා බදුකරුවන් ඒවායෙහි නියම අයිතිකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහාත් මීට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාත් සැපයුණු පනතකි."

එහෙත් මේ පනතෙ වගන්තියක් වගන්තියක් පාසා අපි හොඳින් පරීක්ෂා කර බැලුවොත් අපට පෙනී යනවා, මේ සඳහන් කර තිබෙන පරමාර්ථයන් දැන් ඉදිරිපත් කර තිබෙන පනත මගින් නම් කිසිසේත්ම ඉෂ්ට කර ගන්ට බැරි බව. නින්දගම්වල ඉතිහාසය පිළිබඳව දීර්ඝ විස්තරයක් කරන්ට මම මේ අවස්ථාවෙදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අදහස් කරන්නෙ නැහැ. එහෙත් මේ පනතේ විශේෂයෙන්ම අර්ථ නිරූපණ යේ—" interpretation " නැත්නම් " definition "—තිබෙන අඩුපාඩුකම් නිසා ඉතා කෙටි වශයෙන් හෝ නින්දගම් පිළිබඳ ඉතිහාසය මේ ගරු සභාව හමුවේ තැබීම උචිත යයි මා විශ්වාස කරනවා. " නින්දගම් ඉඩම " යන වචන මේ පනතේ අර්ථ නිරූපණය කර තිබෙන්නේ මෙහෙමයි:

" නින්දගම් ඉඩම " යන්නෙන් මෙම පනත ආරම්භ වීමේ දිනයට පෙර, නින්දගම් ඉඩමක කැබෙල්ලක් හෝ ඉඩමක් සඳහා සහ එය දරන්නා විසින් සේවා කරන මෙන් ඉල්ලීමට හෝ ඒ සේවා වලට හිලව් වශයෙන් යම් මුදලක් ඔහුගෙන් ඉල්ලීමට හා ලැබීමට එහි අයිතිකරු හිමිකම් ඇති ව සිටි නින්දගමක යම් ඉඩමක් හෝ එහි යම් කැබෙල්ලක් හෝ කොටසක් අදහස් වේ ;

ගරු කථානායකතුමනි, මේ පනතේ තිබෙන ලොකුම අඩුපාඩුව තමයි, " නින්දගම් ඉඩම " කියන වචනයේ නියම අර්ථය පැහැදිලි වශයෙන්, පිරිසිදු වශයෙන් තේරුම් ගැනීමට පුළුවන්වන ආකාරයට පනතේ අර්ථ නිරූපණයේ යොදා නොමැතිවීම. නින්දගම් පනත් කෙටුම්පත කියා එකක් ඉදිරිපත් කර තිබෙන නමුත් අඩු වශයෙන් " නින්දගම් " කියන වචනයේ තේරුමවත් පැහැදිලි වශයෙන් ඒ පනතේ අර්ථ නිරූපණයේ සඳහන් වෙලා නැහැ. " නින්දගම් ඉඩම " කියන අර්ථ නිරූපණය කියෙව්වම ගරු ඇමතිතුමාට වැටහෙන්නෙ මොකක්දැයි ඉඩම් ඇමතිතුමාගෙන් මා අහන්ට කැමතියි. මේ අවස්ථාවේ ඉඩම් ඇමතිතුමා සභාවේ නැහැ. මේ පනත් කෙටුම්පතේ සිංහල පරිවර්තනයේ අර්ථ නිරූපණයේ සඳහන් " නින්දගම් ඉඩම " යන්නෙන් අදහස් කරන්නේ මොකක්දැයි මට නම් තේරෙන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, නින්දගම්වල ඉතිහාසය ගැන කල්පනා කරන විට අපට පටන් ගන්ට සිද්ධ වෙන්නෙ ඉන්දියාවේ ආරිය සමාජය පිහිටුවූ කාලයේ සිටයි. ඉන්දියාවේ ආර්‍ය සමාජය පිහිටුවන ලද කාලයේ පටන් පැවති ඉඩම් පිළිබඳ තත්ත්වය ගැන වචන සවලපයක් කතා කරන්නට මා කැමතියි. ඉන්දියාවේ ආර්ය සමාජය පිහිටුවන අවස්ථාවේදී තිබුණු වේද පොත්වලිනුත් කෞටිල්‍ය ආර්ථ ශාස්ත්‍ර පොත්වලිනුත් අපට පෙනී යනවා. මෙම ඉඩම් සමූහ වශයෙන් ගමට අයත්ව තිබුණු බව. ඊළඟට පාලන තන්ත්‍රය ක්‍රම ක්‍රමයෙන් දියුණුවට පත් වුණු අවස්ථාවේදී, ඒ කියන්නේ නියම සැලැස්මක් අනුව පාලන තන්ත්‍රය හැඩගැසුණු අවස්ථාවේදී, රජදරුවන්ට ඉඩම් සියල්ලම හිමි වුණා. අනතුරුව එම රජදරුවන්ට හිමි වුණු ඉඩම් නොයෙකුත් සේවාවන් කළ උදවියට, ඒ කියන්නේ යුද හමුදා සේවාවෙහි නිරත වූවන්ට වේවා සාමාන්‍ය ජීවිතයට අයත් වෙන වෙනත් සේවාවන්හි නිරත වූවන්ට වේවා, පරිත්‍යාග කරන්නට යෙදුණා. පළමුවෙන් සම්පූර්ණ ඉඩම් පරිත්‍යාග කරන්නට යෙදුණා. ගම් පරිත්‍යාග කරන්නට යෙදුණා. ඒ වාගේම ක්‍රමක්‍රමයෙන් ගම්වලින් ලැබෙන සේවාවන් සහ නිෂ්පාදන පරිත්‍යාග වුණා. එවැනි පිළිවෙලකටයි, මේ නින්දගම් ක්‍රමය ඇති වුණේ.

නින්දගම් යන්නෙහි අර්ථ නිරූපණය නොයෙකුත් පොත්පත්වල සඳහන් වී තිබෙනවා. කොල්බෲක් කැමරන් වාර්තාවේ ඒ පිළිබඳව ඉතා පැහැදිලි අර්ථ නිරූපණයක් පෙනෙනවා. එම වාර්තාවෙන් මෙම පනතට කෙළින්ම ඉංග්‍රීසි වචන දෙකක් ඇවිත් තිබෙනවා. එනම් Holder සහ Tenant යනුයි. මෙම වචන දෙක අපේ සිංහල පරිසරයට ගැළපෙන වචන දෙකක් නොවෙයි. Holder නමැති වචන යත් Tenant නමැති වචනයත් කෙළින්ම අර කෝල්බෲක් කැමරන් වාර්තාවෙන් ඇවිත් තිබෙනවාය යන්නයි, මගේ අදහස.

ඩොයිලිතුමාත් නින්දගම් පිළිබඳව හොඳ අර්ථ නිරූපණයක් දී තිබෙනවා. එම අර්ථ නිරූපණය තමුන්නාන්සේගේ අවධානයට යොමු කිරීම පිණිස එතුමාගේ පොතකින් කොටසක් ගෙන හැර දක්වන්නට මා කැමතියි. නින්දගම් යන්න එතුමා හඳුන්වන්නේ මෙසේයි :

" A nindagama for the time being is the entire property of the grantee or temporary chief ; if definitely granted by the King with sannasa it becomes paraveni. "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

තව තැනෙක මෙසේ සඳහන් වෙනවා :

" This peculiar system of service tenure which prevailed in the Kandyan Province dates its origin from the time when there was no trade and very little money in circulation in the country and came into being as an expedient of political and social or domestic economy and convenience. "

මෙහි විශේෂ කොටස මෙයයි :

"....came into being as an expedient of political and social or domestic economy and convenience. "

මෙයින් පසුවත් මේ රටේ ඉඩම් සම්බන්ධව ලියන ලද පොත්පත්වලින් පවා නින්දගම පිළිබඳව අර්ථ නිරූපණය කර තිබෙනවා. කොඩ්රිංටන්ගේ පොතේත් හේලිගේ උඩරට නීති ශාස්ත්‍රය පිළිබඳ පොතේත් ඒ පිළිබඳ පැහැදිලි විස්තරයක් කර තිබෙනවා. ඒවා පිළිබඳව කල්පනා කර බලන විට, මෙහි එම අර්ථ නිරූපණය නොපැහැදිලිවා පමණක් නොව පිරිසිදු නැති බවද තමුන්නාන්සේ ඉදිරියෙහි ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. ඉදිරිපත් කොට ඇති පනතෙහි " නින්දගම් ඉඩම " යන්නට අර්ථ දී ඇත්තේ මෙසේයි :

" නින්දගම් ඉඩම " යන්නෙන් මෙම පනත ආරම්භ වීමේ දිනයට පෙර, නින්දගම් ඉඩමක කැබෙල්ලක් හෝ ඉඩමක් සඳහා සහ එය දරන්නා විසින් සේවා කරන මෙන් ඉල්ලීමට හෝ ඒ සේවා වලට හිලව් වශයෙන් යම් මුදලක් ඔහුගෙන් ඉල්ලීමට හෝ ලැබීමට එහි අයිතිකරු හිමිකම් ඇතිව සිටි නින්දගමක යම් ඉඩමක් හෝ එහි කැබෙල්ලක් හෝ කොටසක් අදහස් වේ.

මේ කිසි තේරුමක් නැති අර්ථ නිරූපනයක්, මේ අවස්ථාවේදී මෙම පනතේ 3 වන වගන්තියට මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා. එය මේ පනතේ ඇති ඉතාමත්ම වැදගත් වගන්තියයි. මුළු පනතම සකස් කර තිබෙන්නේ මේ 3 වන වගන්තිය ක්‍රියාත්මක කිරීම සඳහායි.

3. යම් නින්දගම් ඉඩමක් දරන්නකු හෝ එහි සෑම බදුකරුවකුම එහි අයිතිකරු වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අපට පේන හැටියට මේ වගන්තිය ක්‍රියාත්මක කිරීම මේ පනතේ අදහසයි.

ගරු කථානායකතුමනි, හදිසියේ ව්‍යවස්ථා සම්පාදනය කිරීමෙන් රටකට, සමාජයකට ඇති වන හානිය ගැන විරුද්ධ පාර්ශ්වය නොයෙක් විට ආණ්ඩුවේ අවධානය යොමු කර තිබෙනවා. ව්‍යවස්ථා සම්පාදනය එක්තරා විද්‍යාවක්, එය නියම සැලැස්මක් අනුව කරන්නට වුවමනායි. හදිසියේ ව්‍යවස්ථා සම්පාදනය කිරීමෙන් ඒවා පැහැදිලි නැති වනවා පමණක් නොව ඒවා ක්‍රියාත්මක කරන්නට ගිය අවසථාවේ දී නොයෙකුත් දුෂ්කරතා ඇති වෙනවා.

ගරු කථානායකතුමනි, වර්තමාන කර්මාන්ත ඇමතිවරයා එදා කෘෂිකර්ම හා ආහාර ඇමතිවරයා වශයෙන් සිටියදී 1958 අවුරුද්දේ ඉදිරිපත් කොට සම්මත කරවා ගන්නා ලද කුඹුරු පනත ගැන මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමතියි. ඇත්තෙන්ම ඒ ඇමතිතුමා කුඹුරු පනත ඉදිරිපත් කෙළේ විශාල බලාපොරොත්තුවක් ඇතිවයි. කුඹුරු පනත නිසා අද ගොවියාට විශාල සෙතක් සැලසෙතැයි මුළු ජනතාවම එදා බලාපොරොත්තු වුනා. එහෙත් ඒ පනතේ තිබුණු අඩුපාඩුකම් නිසා එහි පරමාර්ථ ඉෂ්ට කර ගන්නට අපහසු වුණා. ඊට පසුව කුඹුරු පනත සඳහා සංශෝධන පනත් හතරක් ඉදිරිපත් කරන ලද නමුත් අද වනතුරුත් ඒ කුඹුරු පනත නියම පිළිවෙළට මේ රටේ ක්‍රියාත්මක වන්නේ නැහැ. අදත් එදා මෙන්ම ඉඩම් හිමියන් විසින් අද ගොවියන් අස් කරනු ලැබූ විට ඔවුන්ට උසාවි යන්නට සිදු වී තිබෙනවා. නොයෙකුත් අවසථාවලදී උසාවිවලිනුත් අද ගොවියන්ට සහනයක් ලබා ගන්නට බැරි තත්වයක් ඇති වී තිබෙන්නේ පනතෙහි අඩුපාඩුකම් රාශියක් ඇති නිසයි. එදා ඉදිරිපත් කරන ලද කුඹුරු පනතේත් අඩුපාඩුකම් තිබෙනවා නම් මේ හදිසියේ ඉදිරිපත් කරන නින්දගම් පනතේ අඩුපාඩුකම් කොතරම් තිබිය හැකිද? ඇත්තෙන්ම මෙහි අඩුපාඩුකම් රාශියක් තිබෙන බව තමුන්නාන්සේ ඉදිරියේ ප්‍රකාශ කරන්නට ඕනෑ. නියම ක්‍රමයක් අනුව ව්‍යවස්ථා සම්පාදනය කරන්නට ඕනෑ. ව්‍යවස්ථා සම්පාදනය සම්බන්ධයෙන් හදිසියේ ක්‍රියා කරන්නට යෑමෙන් නොයෙකුත් අඩුපාඩුකම් ඇති වන බව අපට පෙනී ගොස් තිබෙනවා. නොයෙකුත් අවස්ථාවල දී හදිසියේ නොයෙකුත් රෙගු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලාසි, නොයෙකුත් නියෝග ඉදිරිපත් කර නවා. හදිසියේ ඉදිරිපත් කොට සම්මත කර ගන්නා රෙගුලාසි, නියෝග ක්‍රියාත්මක කරන්නට ගිය විට විශාල අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වෙනවා. අනෙක් සංයුක්ත මණ්ඩල පිහිටු වන්නාක් මෙන් නින්දගම් සඳහාත් හදිසියේ සංයුක්ත මණ්ඩලයක් පිහිටුවනවා ඇති. ඉතින් ඇත්තෙන්ම මේ රටේ දැන් ඇත්තේ රෙගුලාසි පාලනයක් ; එහෙම නැත්නම් නියෝග පාලනයක්. ඒ මිස පාර්ලිමේන්තු පාලනයක් නොවෙයි. නැත්නම් සංස්ථා පාලනයක්. අපට බැහැ, මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් හැටියට අපේ අයිතිවාසිකම්—ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්—රෙගුලාසිවලටවත්, නියෝගවලටවත්, සංස්ථාවලටවත් පාලනය කිරීමට ඉඩ දෙන්නට. මා මීට පෙරත් කීවා වගේ, මෙවැනි පනතක් ගැන බොහොම හොඳ අවබෝධයක් දී තිබෙනවා, එංගලන්තයේ අග්‍ර විනිශ්චයකාරයකු හැටියට වැඩ කළ ලෝඩ් හෙවිට් තමාගේ "නිව් ඩෙස්පොටිස්ම්" කියන පොතෙන්. හදිසි පනත්, හදිසි රෙගුලාසි, ඉදිරිපත් කළ විට සමාජයටත්, රටටත් වන හානිය ඒ පොතේ විස්තර වශයෙන් සඳහන් කර තිබෙනවා.

මා හිතන පිළිවෙළට මේකත් හදිසියේ ඉදිරිපත් කරන්නට හේතුවක් තිබුණා. ඒකට විශේෂ හේතුවක් තිබුණා. එක්තරා අවස්ථාවක මේක හදිසියෙන් ඉදිරිපත් කළේ පොළොවේ සිට අහසට දමා ගසන කිලොටොන් සියයක පරමාණු බෝම්බයක් වගේ බලංගොඩ අතුරු මැතිවරණ කාලයේදීයි. හැබැයි, ඒ ඉදිරිපත් කළ කිලොටොන් සියයේ පරමාණු බෝම්බය පුස් වෙඩිල්ලක් වුණා. ඒක ගැහුවෙ බලන්ගොඩටයි, වැදුනේ පැල්මඩුල්ලටයි. අනේ අර අනික් තැන ඉන්න අසරණ කුමාරිහාමිගෙ අත පිච්චුනා, ඒකෙන්. ඒ කුමාරිහාමිගෙ අතෙයි, බෝම්බය පිපුරුණේ. අපට කණගාටුයි, ඒ කුමාරිහාමි ගැන. හොඳින් කල්පනා කර නියම සැලැස්මක් ඇතිව, නියම අර්ථ නිරූපණයක් ඇතිව පනත් ඉදිරිපත් කරනවා නම් මෙවැනි සිද්ධීන් ඇති වන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, මේ නින්දගම් පනත ගැන කථා කරනවිට 1954 දී නිකුත් කරන ලද නින්දගම් කොමිෂන් සභාවේ වාර්තාව ගැනත් අපට සඳහන් කරන්නට සිදු වෙනවා. ඊ. ඒ. එල්. විජේවර්ධන විනිශ්චයකාරතුමාගේ සභාපතිත්වයෙන් පත් කරන ලද නින්දගම් පිළිබඳ කොමිෂන් සභාව මුළු රටෙන්ම සාක්ෂි ලබා ගෙන ඉතා වැදගත් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාවේ වැදගත් කොටස් කීපයක් තිබෙනවා. විශේෂයෙන්ම මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නට කැමතියි ඒ වාර්තාවේ 54 වැනි පිටුවට. ඒ වාර්තාවේ 54 වැනි පිටුවේ, ඒ මහත්වරු මෙහෙම කියා තිබෙනවා :

"The evidence adduced before us makes it very clear that, in nindagam, services have well nigh fallen into complete desuetude."

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

May I remind the hon. Member that the hon. Member for Walapane (Mr. T. B. M. Herath) has quoted chunks from that report including that portion? Kindly do not repeat the same argument.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

I did not know that he has already quoted this particular section.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Please try to avoid repetition.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

He quoted the whole book.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

I am sorry; I did not know that he had quoted the whole of this book.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

එදා නින්දගම් කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සාක්ෂි කරුවන්ගෙන් එක නියෝජිත පිරිසක් ගැන පමණක් මා මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. විරුද්ධ පාර්ශ්වයේ නායිකාවගේ පියා වන බාන්ස් රත්වත්ත දිසාව, එදා නියෝජිත පිරිසක් සමග ඇවිත් මේ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන්නා. රත්වත්ත දිසාව ඒ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් "නින්දගම් අහෝසි කරන්න, නින්දගම්වලට අදාළ සේවාවන් අහෝසි කර ඒවායේ නිලකාරයන්ටත් බදුකාරයන්ටත් ඒ නින්දගම්වල සම්පූර්ණ අයිතිය දෙන්න" යැයි කී බව මේ ගරු සභාව ඉදිරියේ මා සඳහන් කරන්නේ ඉතා සන්තෝෂයෙන්.

එම කොමිෂන් සභා වාර්තාවේ එක් කොටසකට මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්නට මා අදහස් කරනවා. ඒ කොටසේ සඳහන් වන්නේ නින්දගම් හිමියන්—ඉංග්‍රීසියෙන් කියනවා නම් "nindalords"—සමහරකු ඉදිරිපත් කළ තර්කයි. අපට උදව් කළ අය නොව එක්සත් ජාතික පක්ෂයට සහයෝගය දුන් අයයි, එවැනි තර්ක ඉදිරිපත් කර තිබෙන්නේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
කවුද?

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
නියෝජිත පිරිස් කීපයක්. ඇලපාත දිසාව එයින් කෙනෙක්.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
කෑම් ඇලපාත?

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
ඇලපාත මහත්මයා එක්සත් ජාතික පක්ෂයෙන් මන්ත්‍රීවරයෙකුයි මා කියන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයට සහයෝගය දුන්නා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
සහයෝගය දුන්නේ නැහැ.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
සහයෝගය දුන්නේ නැතැයි අගමැතිතුමා කියනවා නම් මා පිළිගන්නවා. හැබැයි, ඒ අයගේ සාක්ෂි මේ ගරු සභාව ඉදිරියේ කියවන්නට මා අදහස් කරනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
අනික් ටික අස් කර කියවන්න.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
ඒ අය ඡන්දය දුන්නේ කාටදැයි කියන්නට අපට පුළුවන්කමක් නැහැ. අපට ලැබී තිබෙන ආරංචිවල හැටියට නම් ඒ අය සහයෝගය දී තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයටයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
සහයෝගය දෙන්න ඇතැයි හිතුවා?

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
ඒ කොහොම වුණත්, ඒ අය ඉදිරිපත් කළ සාක්ෂි මේ ගරු සභාව ඉදිරියේ කියවන්නම්:

"Certain nindalords, on their side, claimed that the service obligation of nilakarayas was something that had been earned for them by their ancestors for

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the maintenance of their prestige and authority, in addition to being the means of securing an appreciable income at that time. They claimed that the loss of services would amount, in theory at least, to a loss of income and would be definitely damaging to the social prestige and position which was theirs by right of hereditary succession to their ancestors."

කථානායකතුමනි, මේ පනත් කෙටුම් පතේ අර්ථ නිරූපණයේ තවත් අඩුපාඩු කම් රාශියක් තිබෙනවා. "නින්දගම" සම්බන්ධ අර්ථ නිරූපණයේ තිබෙන අඩු පාඩුකම් මා පෙන්වා දුන්නා. ඒ වාගේම, මේ "නින්දගම" කියන වචනයට "මුත් තෙට්ටු ඉඩම්", "පරවේණි පංගු", "මාරු වන පංගු" ආදියත් අයත් වෙනවාද යන්න මේ අර්ථ නිරූපණයේ සඳහන් වී නැහැ. ඒ හැරෙන්නට, මේ "නින්දගම් වලට" "බණ්ඩාරගමට" අයත් වෙනවාද නැද්ද කියාත් අර්ථ නිරූපණයේ සඳහන් වී නැහැ.

මේ "බණ්ඩාරගම්" පිළිබඳව දැන් ඇති වේගෙන යන තත්ත්වය අප දන්නවා. එදා රජයෙන් ලැබුණු ඉඩම්, "නින්දගම්", වෙනත් ඒවාට සීමා කළ "රජයේ කැලෑ" ආදිය පවා "බණ්ඩාරගම්" යනුවෙන් සම හරුන් අල්ලාගෙන ඉන්නවා. ඒ "බණ්ඩාරගම්වලට" සිදු වන්නේ කුමක් දැයි මේ පනත් කෙටුම්පතේ සඳහන් වී නැහැ. එම නිසා, තම පිළිතුරු කථාවෙන් හෝ කාරක සභා අවස්ථාවේදී හෝ ඒ "බණ්ඩාරගම්" පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කරන ලෙස ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සබරගමු ප්‍රදේශයේ "බණ්ඩාර ගම්"—ඒවා සේරම ඇත්ත වශයෙන් "බණ්ඩාරගම්ද" කියා අප දන්නේ නැහැ—ඉඩම් අක්කර 80,000 ක් තරම එක පුද්ගලයකුට අයත් බවට අපට ආරංචි ලැබී තිබෙනවා. අක්කර අසූදහස් ගණන් විශාල බණ්ඩාර ඉඩම්වලින් කොටස් විකුණා ගෙන යන බවට ආරංචියි. නින්දගම් පනත මෙහෙන් ඉදිරිපත් කරන විට අර හෙන් ඉඩම් කොටස් විකුණාගෙන යනවා. ඒක හරියට කර්මාන්ත හා ධීවර ඇමතිතුමා එදා කුඹුරු පනත ඉදිරිපත් කළ අවස්ථාවේදී ඉඩම් හිමියන් අඳේ ගොවියන් කුඹුරුවලින් පන්නා ඇමුවා වගෙයි. දැන් බණ්ඩාර ඉඩම් කොටස් කර විකුණා ගෙන යනවා. මෙවැනි පනත් ඉදිරිපත් කරන විට ඕවා ගැනත් සෝදිසියෙන් ඉන්න ඕනෑ නොවේද? මොනවටද මෙවැනි පනත් ඉදිරිපත් කරන්නෙ හරියාකාර ක්‍රියාත්මක කරන්න බැරි නම්? මොකටද පනත් ඉදිරිපත් කරන්නෙ බණ්ඩාර ඉඩමුත් ඊට ඇතුළත් කරන්නෙ නැති නම්? මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි ප්‍රකාශයක් අප බලාපොරොත්තු වෙනවා. තමුන්නාන්සෙ බණ්ඩාර ඉඩම් සම්බන්ධයෙන් පියවරක් නොගෙන නිශ්ශබ්දව සිටිනවාදැයි දැන ගන්න කැමතියි. බණ්ඩාර ඉඩම්වල මුවාවෙන් තමුන්නාන්සේලා කාවද මේ පනතින් බේරා ගන්න හදන්නෙ?

ඊළඟට වචනවල අර්ථ නිරූපණය ගැනත් යමක් කියන්න ඕනෑ. ඇතැම් වචනවලට දී ඇති අර්ථය ගැන අපට පැහැදිලි වැටහීමක් නම් ඇති වෙන්නෙ නැහැ. බදුකරු කියන්නෙ කාටද කියා පැහැදිලිව තේරුම් කර දී නැහැ. මෙහි බදුකරු වශයෙන් දී ඇති අර්ථය මෙයයි:

> "'බදුකරු' යන්න නින්දගම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදුණු විට, ඒ ඉඩමේ යම් කැබෙල්ලක හෝ කොටසක පුළු බදු කරුවෙක් ඉන් අදහස් කෙරේ".

මෙම බදුකරු කියන වචනය කෙලින්ම ඉංග්‍රීසියෙනුයි, "ටෙනන්ට්" කියන වචනයෙනුයි, ගෙන තිබෙන්නෙ. නමුත් මෙය "ටෙනන්ට් ඇට් විල්" ද නැතිනම් "ටෙනන්ට් ඉන් පර්පෙචුයිටි" ද කියා විස්තර කර නැහැ; අර්ථය නිරූපණය කර නැහැ. බදුකරු කීවාම කව්ද, මොන කොටස් ද ඔහුට අයිති වන්නෙ, කියන අර්ථ නිරූපණයක් මෙහි කර නැහැ. එම නිසා මෙබඳු දේවල් ගැන පැහැදිලි ලෙස අර්ථ නිරූපණය කරනවා නම් වඩා හොඳ බව කියන්න කැමතියි.

ඒ අතරම අප දන්නවා යුරෝපයෙ ඉංග්‍රීසි ජාතිකයින්ගෙ ස්ටර්ලිං සමාගම් සහ ලංකාවෙ රුපී සමාගම් මගින් ලංකාවේ සබරගමු ප්‍රදේශයෙ නින්දගම් ඉඩම් රාශිය කම තේ සහ රබර් වවා තිබෙන බව. මා හිතන හැටියට, දොලොස්වල වත්ත, නිවිතිගල වත්ත රාසගල වත්ත, යනාදිය හපුගස්තැන්න වත්තේ කොටස්. ඒ වාගේම මාතලේ ප්‍රදේශයේ කෑගල්ල ප්‍රදේශයේ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

දෙනියාය ප්‍රදේශයේ, ඌව ප්‍රදේශයේ, ඇතැම් නින්දගම් ඉඩම්වල කොකෝවා ආදී වගාවන් කර තිබෙනවා. මෙම ඉඩම්වල එම සමාගම් මගින් වගාකර ඇත්තෙ බදු කරුවන් නැතිනම් ලෙසීස් හැටියටයි. එහෙම නම් තේ, රබර්, කොකෝවා, ආදී වගාවන් කළ මෙම කොම්පැනිවලට මොනවා වෙනවාද, බදුකරුවන් වශයෙන් ඒ අයගේ තත්ත්වය මොකක්ද කියා කිසි වක් සඳහන් වී නැහැ. එම නිසා මෙබඳු කාරණා ගැන පැහැදිලි ප්‍රකාශයක් කරනවා ඇතැයි මා බලාපොරොත්තු වන අතර, එසේ කරන මෙන් ගරු ඉඩම් ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. මෙම පනත යටතේ අපේ රටේ ලාංකිකයන් සතු ඉඩම් කෙලින්ම විදේශික කොම්පැනිවලට බදුකරුවන් හැටියට අයිති වෙනවාද කියා පැහැදිලි කර දෙනවා නම් හොඳයි. මෙහි සුළු බදුකරුවාද ලොකු බදු කරුවාද කියා වෙනසක් දැක්වෙන්නෙ නැහැ. ලොකු බදුකරුවා කව්ද, මොන අයිතිවාසිකම් ඔහුට ලැබෙනවාද කියා සපිර වශයෙන් මෙම පනතින් පෙනෙන්නෙ නැහැ. එහෙම නම් මෙම නින්දගම් ඉඩම් වල විශාල වශයෙන් තේ රබර් සහ කොකෝවා වගා කළ කොම්පැනිවලට එම ඉඩම්වල අයිතිවාසිකම කෙළින්ම ලැබේවිද කියා ස්ථිර ප්‍රකාශයක් කිරීම ගරු ඇමති තුමාගේ යුතුකමක් බව මෙහිදී මතක් කර දෙන්න කැමතියි.

ඊළඟට දරන්නා නැතිනම් "හෝල්ඩර්" කියන වචනයට දී ඇති අර්ථයත් අපට තේරෙන්නෙ නැහැ. මෙහිදීත් ස්ථිර බදු කරුවා "ටෙනන්ට් ඉන් පර්පෙචුයිටි" කියා කිසිම අර්ථයක් පැහැදිලිකර දී නැහැ. මෙම වචනය කෙළින්ම සැසි වාර්තාවකින් හෝ කෝල්බෘක් කැමරන් වාර්තාවෙන් ගෙන තිබෙනවා. සිංහල භාවිතය අනුව වෙනත් වචනයක් යෙදීම සුදුසුය කියා තමුන්නාන් සේට පෙන්නා දෙන්න කැමතියි. එම නිසා, බදුකරු, දරන්නා, යන වචනවල පැහැදිලි අර්ථ නිරූපණයක් ගරු ඇමති තුමා කරනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Has not the hon. Member got a copy of the proposed amendments with regard to the definition of "holder", "nindagama land" and "tenant"?

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

No, Sir, I have not got any amendments. I am reading from the Interpretation Clause in this Bill.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

At the commencement of proceedings today the Hon. Minister mentioned the amendments and then gave a copy, I think, to the Opposition Whip. If the hon. Member is continuing his speech tomorrow, he can go through those amendments.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

I should be thankful to the Hon. Minister if he has proposed amendments to this Bill because, as the Bill stands, it is a most absurd and ridiculous Bill.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

We discussed that on the last occasion, and the Hon. Minister informed the House today of the proposed amendments. Of course, he cannot move the amendments now.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

I shall be happy if the Hon. Minister has already taken steps to define those words because without proper definitions this Bill means nothing.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I brought this to the notice of the hon. Member because he did not appear to be aware of the fact that the Hon. Minister had mentioned certain amendments he would move.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

Thank you, Sir.

තමුන්නාන්සේට ස්තුතිවන්ත වන අතර, ගරු ඉඩම් ඇමතිතුමා අද අලුත් අර්ථ නිරූපණයක් නොහොත් අලුත් සංශෝධනයක් ඉදිරිපත් කර තිබීම ගැන මම සන්තෝෂ වෙනවා. අලුතෙන් ඉදිරිපත් කරන ලද ඒ සංශෝධන කියවා තේරුම් ගෙන තර්ක කිරීමට වෙලාවක් තිබුණේ නැහැ. හෙට කථා කරන විට මෙම අලුත් අර්ථ නිරූපණය ගැන කථා කිරීමට මා අදහස් කරනවා.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

හෙටත් කථා කරන්නද අදහස ?

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

ගරු මුදල් ඇමතිතුමනි, මෙය බොහොම ලොකු ප්‍රශ්නයක්. මේ ගැන බොහොම කථා කරන්න තිබෙනවා. ඒ මොකද ? ඔය ස්ටර්ලිං සමාගම් මගින් දැන් වගා කර තිබෙන තේ රබර් කොකෝ වගා ඇතුළත් නින්ද ඉඩම්වල ස්ථිර අයිතිය නොහොත් හිමිකම එතුමන්ලාට පවරා දීම ගැන විරුද්ධ පක්ෂයේ අපි සාමාන්‍ය වශයෙන් සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ඒ නිසා ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රකාශයක් කර අප තුළ තිබෙන සැකය දුරු කරන ලෙස ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Is the hon. Member coming to a new point ? In that case the Adjournment might be moved now.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

Yes, Sir.

**එකල් හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත් සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1968 මාර්තු 9 වන සෙනසුරාදා පවත්වනු ලැබේ.**

அப்பொழுது பி.ப. 7.00 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது. 1968, மாச் 9, சனிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Saturday, 9th March 1968.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී :**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු සී. පී. ද සිල්වා].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக" [கௌரவ சீ. பி. டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed.*

"That the House do now adjourn".—[*The Hon. C. P. de Silva*].

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I wish to mention to the House that six hon. Members have submitted names and wish to speak on the Adjournment. I can give only 20 minutes to hon. Members to raise any questions because there must be time for reply. I would, therefore, request hon. Members to be as brief as possible.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Mr. Speaker, I have been given notice of certain very important matters and I want about 15 minutes to deal with them.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

May I know which hon. Members have given notice to the Hon. Prime Minister that they will be raising questions ?

අ. භා. 7

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

Sir, I have given notice of a question to be raised with the Hon. Prime Minister.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Mr. Speaker, I want sufficient time to reply because these matters are too important not to be replied to fully.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Is it agreed that at 7.15 p.m. we allow the Hon. Prime Minister to reply ?

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

Aye !

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

කථානායකතුමනි, මගේ ප්‍රශ්නය ඇසීමට මිනිත්තු භාගයකට වඩා ගත වන්නේ නැහැ. මගේ ප්‍රශ්නයේ පළමු වැනි කොටස මේකයි.

Will the Hon. Prime Minister confirm or deny that a high-ranking officer of the Sinha Regiment in Kandy, Derrick Nugawela, was sent secretly to South Vietnam for three months by the American Embassy ?

දෙවැනි කොටස :

In view of the fact that even such a pro-American government like that of India has been compelled to ask the Asia Foundation to leave India because of its connections with the notorious American Central Intelligence Agency, will the Hon. Prime Minister consider taking similar action against the Asia Foundation in Ceylon which is engaged in subversive activities in Ceylon ?

**ද මෑල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

කථානායකතුමනි, කච්චතිව් දූපත සම්බන්ධයෙන් උද්ගත වී ඇති ප්‍රශ්නය සම්බන්ධව ගරු අගමැතිතුමාගෙන් පැහැදිලි ප්‍රකාශයක් අපි බලාපොරොත්තු වෙනවා. කච්චතිව් දූපතේ මිනිසුන් වාසය කරන්නේ නැති නමුත්, යටත් විජිත යුගයේ සිට එම දූපත ලංකාවට අයිති දූපතක් හැටියට අපි කවුරුත් සලකනවා. මා හිතන හැටියට ඉන්දියානු ආණ්ඩුවත් එය පිළිගත්තා. එහෙත් දැන්, ලෝක් සභාවත් මදුරාසි පාර්ලිමේන්තුවේ සම්යුක්ත සමාජවාදී පක්ෂයත්, ජනසන් පක්ෂයත්, එමෙන්ම ඉන්දියානු ජාතික සංගමයේ කොටස් ස්වල්පයකුත් විසින් ඉදිරිපත් කරන ලද තර්ක අනුව කච්චතිව් ද්වීපය ලංකාවට අයිතිද ඉන්දියාවට අයිතිද යන ප්‍රශ්නය උද්ගත වී තිබෙනවා. මේ ප්‍රශ්නය සම්බන්ධව ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරවන අතරම ඊට සම්බන්ධ තවත් වැදගත් කරුණක් එතුමා වෙත මා ඉදිරිපත් කරනවා.

ඉන්දියානු කැබිනට් මණ්ඩලයේ ඉතාම වැදගත් ඇමතිවරයකු වන උත්පත්ති පාලනය හා ජනගහන ප්‍රශ්න පිළිබඳ ආචාර්ය ශ්‍රීපති චන්ද්‍රසේකර නවදිල්ලියේ ඉතා වැදගත් සම්මේලනයකදී, අපගේ සැලකිල්ලට භාජන විය යුතු ප්‍රකාශයක් කර තිබෙනවා. ඉන්දියාවේ ජනගහනය වර්ෂයකට එක් කෝටි තිස් ලක්ෂයකින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැඩි වන බවත්, මේ ශත වර්ෂය අන්තිම වන්නට පෙර එය කෝටි සියයක් පමණ වන බවත් කී ආචාර්ය චන්ද්‍රසේකර, ඒ විධියට වැඩි වන ජනගහනයට ඉන්න හිටින්න තැනක් නැති නිසාත්, කන්න දෙන්න ඉන්දියාවට පුළුවන්කමක් නැති නිසාත්, ඔවුන් පුළුවන් තරම් පිටරටවලට යන්නට ඕනෑයි කියා තිබෙනවා. Emigrate as fast as you can. That is the only advice I can give you. බුරුමය දුන් ඉන්දියානුන්ට විරුද්ධව යුද්ධ හමුදාව පාවිච්චි කරන නිසා ඔවුන්ට බුරුමයට යන්නට බැහැ; ඉන්දුනීසියාවට යන්නට බැහැ; මැලේසියාවට යන්නට බැහැ; නැගෙනහිර අප්‍රිකාවේ කෙන්යා, උගන්ඩා, ටැන්සේනියා ආදී රටවලට යන්නට බැහැ; දකුණු අප්‍රිකාව ඔවුන් පිළිගන්නේ නැහැ. ඔවුන්ට ගලාගෙන එන්නට තිබෙන්නේ ලංකාව පමණයි. මෙවැනි තත්ත්වයක් තිබෙන අතරම ඉන්දියාණ්ඩුවේ වැදගත් ඇමතිවරයකු අර විධියේ ප්‍රකාශයක් කිරීමත්, මේ පැත්තෙන් කච්චතිව් ද්වීපය අල්ලා ගන්නට ඉන්දියාව මාන බැලීමත් නිසා, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා විශේෂ අවධානය යොමු කොට අපට පැහැදිලි ප්‍රකාශයක් කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

අ. භා. 7.3

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නට මා බලාපොරොත්තු වෙනවා. විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 11 දෙනකු අස් කරන ලද බව අද ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබුණා. මීට කලින් උප කුලපතීන් වහන්සේ ශිෂ්‍යයන් 65 දෙනකු අස් කළා. ඊට පසු, උප කුලපතීන් වහන්සේ විසින්ම පත් කරන ලද කාරක සභාවක—එම විශ්ව විද්‍යාලයේ සනාතන සභාවේම සාමාජිකයන්ගෙන් යුත් කාරක සභාවක—මාර්ගයෙන් මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 11 දෙනා දෙව්ට දමා තිබෙනවා. තවත් ශිෂ්‍යයන් 10 දෙනකුගේ වැඩ තහනම් කර තිබෙනවා.

විශ්ව විද්‍යාලයට මොන විධියේ ස්වාධීනත්වයක් තිබුණත් එය නඩත්තු වන්නේ මේ රටේ මහජන මුදල්වලිනුයි. මුදල් දෙන්නේ මේ ගරු සභාවයි. මේ රටේ දුප්පත් දෙමවුපියන් ඔවුන්ගේ දරුවන් විශ්ව විද්‍යාලයට එවන්නේ බොහොම අමාරුවෙන්. විශ්ව විද්‍යාලයේ අවුරුදු දෙක තුන ඉගෙන ගෙන උපාධිය ගන්නට ඔන්න මෙන්න කියා සිටි සමහර ශිෂ්‍ය ශිෂ්‍යාවන් අස් කර දමා තිබෙනවා. මේ රටේ තත්ත්වය මේක නම් මේ ගැන මෙම ගරු සභාවේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. විභාගවලට පෙනී සිට ලක්ෂ ගණනකින් තේරී, දුප්පත් දෙමවුපියන්ගේ වියදමෙන් විශ්ව විද්‍යාලයට පැමිණ උපාධිය ලබා ගන්නට අවුරුදු ගණනාවක් තිස්සේ මහන්සි වුණු දරුවන් පොඩි වරදක් කළ නිසා, එසේ නැත්නම් වර්ජනය කළ නිසා, එසේ නැත්නම් වර්ජනය කරන්නට කෙනකුට කිව්වාය යන චෝදනාවක් නිසා, මේ විධියට හිතුමතේ විශ්ව විද්‍යාලයෙන් එළියට දැමීමේ ප්‍රතිපත්තියක් තිබෙනවා නම් අප ඊට විරුද්ධ විය යුතුයි. කොළඹ විශ්ව විද්‍යාලයේ වර්ජනය මාස තුන හතරක් තිස්සේ ගෙන ගියා. එහෙත් එහි එක්කෙනකුවත් දෙව්ට දමා නැහැ. විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ උප කුලපතීන් වහන්සේ ඒකාධිපතියකු වශයෙන් කටයුතු කරන බවයි මට පේන්නේ.

විශ්ව විද්‍යාලයේ සේවකයන් ස්ට්‍රයික් කරතොත් තමනුත් ඊට අනුබල දෙන බවත්, තමනුත් ස්ට්‍රයික් කරන බවත්, උප කුලපතීන් වහන්සේ කියා තිබෙනවා යයි මට දැනගන්නට ලැබුණා. ශිෂ්‍යයන්ගේ ස්ට්‍රයික්වලට අනුබල දෙන්නට උන්වහන්සේට බැරිවූ. එහෙම නම්, දැන් කරන්නට තිබෙන්නේ එහි ගුරුවරුන්ගේ ස්ට්‍රයික් එකක් ඇති කිරීමයි. එවිට උප කුලපතීන් වහන්සේත් ස්ට්‍රයික් කරයි.

විශ්ව විද්‍යාලයෙන් එළියට දමා තිබෙන්නේ මොන විධියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ද යන බව නිදර්ශනයක් දෙකක් මගින් මම තමුන්නාන්සේට පෙන්වා දෙන්නම්. ඩී. එස්. රණවක—බී. ඒ. උපාධිය අරගෙන එම්. ඒ. උපාධියට සූදානම් වන කෙනෙක්. එල්. බී. කෝරලේගෙදර—බී. ඒ. උපාධියට පෙනී සිටීමට සුදුස්සෙක් : මේ අවුරුද්දේ විභාගය ගන්න හිටියා. ඩී. සෙනෙවිරත්න මේ අවුරුද්දේ විභාගය ගන්න සිටි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම
[වී. බී. එම්. හේරත් මයා.]

ශිෂ්‍යයෙක්. කේ. ඩී. පෙරේරා—බී. ඒ. උපාධියට සූදානම් වෙමින් සිටි ශිෂ්‍යයෙක්. මොහු බොහෝ දුෂ්කරතා මධ්‍යයේ ගම් බදින් විශ්ව විද්‍යාලයට පැමිණි කෙනෙක්. රුලපනාව—ගෞරව උපාධියකට සූදානම් වෙමින් සිටි ශිෂ්‍යයෙක්. නීතා කාරියවසම් මෙනෙවිය—දෙවැනි අවුරුද්දේ ශිෂ්‍යාවක්. මහජන බැංකුවෙන් ණය මුදලක් ලබා ගෙන බොහොම අමාරුවෙන් විශ්ව විද්‍යාල යට පැමිණ ඉගෙනීම ලැබූ ශිෂ්‍යාවක්. මේ විධියට ඩී. එස්. රණවක, එල්. බී. කෝරලේගෙදර, ඩී. සෙනෙවිරත්න, කේ. ඩී. පෙරේරා ආදීන් ඇතුළු ශිෂ්‍ය ශිෂ්‍යාවන් 11 දෙනෙකු අස් කරන්නට තීරණය කර තිබෙනවා. 65 දෙනෙකු කලින් අස් කර තිබෙනවා. දැනට තවත් දස දෙනෙකුගේ පන්ති තහනම් කර තිබෙනවා. ඒ අයත් අස් කිරීමේ නියෝගය හෙට අනිද්දා එන් නට බැරි නැහැ. රුවන් සේනාධීර, ගොඩ මුනේ, එස්. සියඹලාගස්තැන්න, මංගලිකා ඩයස්, ප්‍රීතිමාලී, ධම්මිකා ලියනගේ, වික්ටර් ද මෙල්, ප්‍රභාත් මානවසිංහ, ඇන්ඩ්රූ, ඔගස්ටින් පෙරේරා යන මේ උද වියගේ පන්ති තහනම් කර තිබෙනවා. හැට පහයි, හැත්තෑ හයයි, අසූ හයයි. එක පහරින් අසූ හයයි. මේ රටේ උච්චස්ථාන යට යන්නට ලැස්තිවී සිටින අපේ උග තුන්ට සුළු කාරණයක් නිසා මේ ආකාර යට සංග්‍රහ කිරීම යුක්තිසහගතද ? මේ ස්වාමීන් වහන්සේ ඒ අයට එනන්ටය කියා කිව්වාලු. ඒ කීම ඇසුවේ නැත කියා මෙවැනි පියවරක් අරගෙන තිබෙනවා. මේ තරම් ඒකාධිපති අදහස් දරමින් විශ්ව විද්‍යාලයේ අපේ දරුවන්ට ගසන මේ පහර ගැන අපේ ප්‍රබල විරෝධය පළ කරන අතරම වහාම මේ ගැන විභාගයක් පවත්වා මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඔවුන්ගේ අධ්‍යාපනය කරගෙන යන්නට ඉඩ සලස් වන මෙන් මා ගරු අධ්‍යාපන ඇමතිතුමා ගෙන් ඉල්ලීමක් කරනවා. එහෙම නැත් නම් විද්‍යෝදය විශ්ව විද්‍යාලයට දෙන මුදල් ආධාරවලට සම්පූර්ණයෙන්ම විරුද්ධ වන්නට සිදු වන බවත් අපට මේ ගරු සභාවේදී ලොකු සටනක් කරන්නට සිදු වන බවත් මා අවසාන වශයෙන් මතක් කරනවා.

කල් තැබීම

අ. භා. 7.6

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලි මේන්තු ලේකම්තුමාගෙන් ඇසිය යුතු ප්‍රශ්නයක් තිබෙනවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. Premadasa)

මට පිළිතුරු දෙන්නටත් කාලය ලැබෙන් නට ඕනෑ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ප්‍රශ්නය මේකයි. මාතලේ, කන්දපල්ල කෝරළේ ගම් කාර්ය සභාවේ මැතිවරණය සඳහා එක් වරක් නාම යෝජනා පත්‍ර භාර ගත්තා. නාම යෝජනා පත්‍ර භාර අරගෙන මැතිවරණය කල් දැමුවා. ඊට පසු මේ මාසයේ පළමුවැනිදා නැවතත් නිලධාරීන් ගොස් මැතිවරණය සඳහා ඒ ගම් කාර්ය සභාවේ කොට්ඨාශවලට තරඟ කරන අය ගෙන් ඇප මුදල් එහෙම ලබා ගත්තා. 5 වැනිදා ඒ අනුව නාම යෝජනා පත්‍ර භාර ගෙන ප්‍රසිද්ධ කළා. නමුත් තවත් ගැසට් නිවේදනයකින් දැන් දෙවන වරටත් ඒ මැතිවරණය පැවැත්වීම නවත්වා තිබෙ නවා. ඉතින් දෙවන වරටත් මේ මැතිවර ණය පැවැත්වීම නවත්වන්නට හේතුව කුමක්ද කියා මා දැනගන්නට සතුටුයි. මේ පිළිවෙළට කටයුතු කරගෙන යන විට අපේ මිනිසුන් මේක ඒ අයගේ අයිතිවාසිකම් උදුරා ගැනීමක්ය කියා කල්පනා කරනවා. ඇත්ත වශයෙන් මේ ක්‍රියා මාර්ගය ප්‍රජා තන්ත්‍රවාදයට සම්පූර්ණයෙන්ම විරුද්ධය කියා ඒ අය කල්පනා කරනවා. යම් හේතු වක් උඩ වරක් මැතිවරණය කල් දැමුවත් දිගින් දිගටම මේ පිළිවෙළට කටයුතු කර ගෙන යෑම යුක්තිසහගත නැහැ නේද?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මාතර ගරු මන්ත්‍රීතුමා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මා ප්‍රශ්නයක් අසන්නට බලාපොරොත්තු වුණා. නමුත් එතුමා මට කිව්වා, ලෑස්ති නැත, හෙට ප්‍රශ්නය ඉදිරිපත් කරන්නටය කියා. ඒ අනුව මා හෙට ඒ ප්‍රශ්නය අසන්නට බලාපොරොත්තු වෙනවා.

අ. භා. 7.8

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ (ටී. බී. තෙන්නකෝන් මයා.) ප්‍රශ්නය ගැන මට කල් තබා දැනුම්දීම ගැන මා සතුටුවෙනවා. මක්නිසා ද? කල් තබා දැනුම්දීම නිසා මට ඒ ප්‍රශ්නය පිළිබඳ සියළු කරුණු සොයා ගන්නට පුළුවන් වුණා. ඒ ගම් කාර්‍ය්‍ය සභාවේ මැතිවරණය දෙවරක් කල් දැමුවාය කියා දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඒක ඇත්තක්. පළමුවන වාරයේ මේ මැතිවරණය කල් දමන්නට හේතුව කුමක් ද? පළාත් පාලන ආයතනවල කාලසීමාව අවුරුදු හතර දක්වා දීර්ඝ කළ යුතුය කියා මේ ගරු සභාව විසින් පනතක් සම්මත කරන්නට යෙදුණා. ඒ පනත මේ ගරු සභාව සාකච්ඡා කරන අවස්ථාවේදී තමයි පළමුවන වරට ඒ මැතිවරණය කල් දැමුවේ. ඊට පසු මේ මෑතකදී නැවතත් ඒ මැතිවරණය කල් දැමුවාය කියා දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා කියා සිටියා. ඒ කල් දැමීම ප්‍රජාතන්ත්‍ර විරෝධිය කියා එතුමා කියනවා නම් මා කියනවා එතුමාත් ඒ ක්‍රියාවට හවුල්කරුවකුය කියා. මා එසේ කියන්නේ කරුණු ඇතිවයි. මා අමාත්‍යාංශයට ගිහින් මේ කාරණය පිළිබඳ ලිපි ගොනු පෙරළා බැලුවා. මීළඟ මැතිවරණය පවත්වන්නට මත්තෙන් මේ ගම් කාර්‍ය්‍ය සභාව දෙකට කඩා ඒ කොට්ඨාශ සකස් කරන්නටය කියා දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ විශේෂ ඉල්ලීම් තුනක්ම තිබෙන බව මට ඒ අවස්ථාවේදී පෙනී ගියා. එතුමාට දැන් ඒ ඉල්ලීම් ගැන මතක පහවී දැන් ටිකක් කල්පනාව අවුල් වී තිබෙනවා නම් මා පුදුම වන්නේ නැහැ. මක්නිසා ද? මේ සිංහල පමණක් ප්‍රශ්නය ගැන විරුද්ධ පාර්ශ්වයේ ලොකු අරගලයක් තිබෙනවා. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී කල්පනා කරමින් සිටින්නේ නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමාගේ පැත්ත ගන්නවාද එහෙම නැත් නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පැත්ත ගන්නවාද යන්න ගැනයි. එවැනි මානසික විප්ලවයකට මුහුණ දී සිටින අවස්ථාවක මෑතකදී එතුමා එවූ ලියුම් ගැන මතක අඩු නම් මා ඒ ලියුම් තුනම මේ ගරු සභාව ඉදිරිපිට තබන්නට සූදානම්.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

කල් දමන්නය කියා මා කිව්වේ නැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ලියා තිබෙන එක කියවන්නම්.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

මැතිවරණය තිබෙන නිසා එය කරන්න බැරිය කියා මට පිළිතුරකුත් එවා තිබෙනවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මේ ලියුමේ තිබෙන්නේ "ලබන මැතිවරණයට පෙර බෙදා වෙන් කරන ලෙස මෙයින් දන්වමි" කියලයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ලියුමේ දිනය කියන්න.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

1967 අප්‍රේල් 18. එදා කියනවා මීළඟ මැතිවරණයට කලින්, කියා. ඒ මන්ත්‍රීතුමා කී නිසාම එය කළෙත් නොවෙයි. එතුමා කීවාටම කරන්නේ නැහැ. පළාත් පාලන සහකාර කොමසාරිස්ගෙනුත් කරුණු විමසා බැලුවා. දිසාපතිතුමාගෙනුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

කරුණු විමසා බැලුවා. ඒ දෙදෙනාමත් මේ මන්ත්‍රීතුමා කියන අදහස අනුමත කළා. මේ ගම්සභාව දෙකට කඩා මැතිවරණයක් තැබීම මීට වඩා ප්‍රජාතන්ත්‍රවාදියි කියා ඒ අයත් කිව්වා. මේ පියවර ගත්තේ ඒ අනුවයි. තමන් ලියන ලියුම්වල පිටපත් ළඟ තබා ගැනීමට දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) කල්පනා කරනවා නම් හුඟක් හොඳයි කියා මා හිතනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

මට උත්තරයකුත් එවා තිබෙනවා මැතිවරණය නිසා මගේ ඉල්ලීම ඉටු කරන්න බැරිය කියලා.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ගරු කථානායකතුමනි, වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කී කරුණ ගැන මට දැනට කියන්නට පුළුවන් මෙපමණයි. එනම් විනයානුකූල පරීක්ෂණයකින් පසුව ඒ ශිෂ්‍යයන් 11 දෙනා විශ්ව විද්‍යාලයෙන් නෙරපා තිබෙනවා. විශ්ව විද්‍යාලයේ උප කුලපති ස්වාමීන් වහන්සේගෙන් විස්තර ලබා ගෙන හෙට මීට වඩා යමක් කියන්නට පුළුවන් වේවි.

අ. භා. 7.12

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

The hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) asked two questions. The first one was:

"Will the Hon. the Prime Minister confirm or deny that a high-ranking officer of the Sinha Regiment in Kandy, Derrick Nugawela, was sent secretly to South Vietnam for three months by the American Embassy?"

As far as that question is concerned, I am now in no position to confirm or deny whether a high-ranking officer, Mr. Derrick Nugawela, visited South Vietnam. I shall make inquiries into this.

I would state, however, that Mr. Derrick Nugawela is a member of the Volunteer Force and not a regular army officer. A member of the volunteer services when not under mobilization orders is a private citizen and like any other private citizen is free to travel anywhere so long as he has a valid passport.

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)
*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*
(Dr. N. M. Perera—Yatiyantota)

But is he serving in the armed services, is he in the Volunteer Force?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

He is a volunteer.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

But he has certain obligations here. You can call him back to the force again as a volunteer.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

When volunteers are called up they are mobilized. Recently when the strike was on they were mobilized.

Volunteers who are not mobilized are private citizens in private jobs in various places.

Now, for instance, the hon. Member goes frequently to various parts of China. I have no right to meddle in his travels and I do not intend to. So I have no right to meddle in the travels of Mr. Derrick Nugawela. So long as he has a passport to go to that place, he is free to go.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

But he continues to be a volunteer in the force.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

I think the hon. Member is under a misconception as regards the persons who are volunteers. People who are working in the Fort offices, that is in mercantile offices and commercial firms, are the volunteers. There is a Volunteer Force in the Regular Army. That is quite different. The volunteer forces come into action only when they are mobilized and on rare occasions they are mobilized.

The other question was:

"In view of that fact that even such a pro-American Government like that of India has been compelled to ask the Asia Foundation to leave India because of its connections with the notorious American Central Intelligence Agency, will the Hon. the Prime Minister consider taking similar action against Asia Foundation in Ceylon which is engaged in subversive activities in Ceylon?"

Now about that, all I can say is that I have seen a news report that India has terminated the work of Asia Foundation in that country. I have no official confirmation of the news report. The Government of Ceylon follows its own policies and is not conditioned by decisions made by other Governments. I am not aware that Asia Foundation in Ceylon is engaged in subversive activities. As the hon. Member will realize, we can follow our own policies. If India does something, we need not follow suit, or, if China does something, we need not follow suit. We follow our own policies.

So much for the two questions.

Then there is, of course, the rather more important question raised by the hon. Member for Devinuwara (Mr. de Mel) about Kachchativu. I do not know the relevance of this population explosion he refers to—Kachchativu as a means of satisfying a population explosion.

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

As a stepping stone.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

It is a ten-mile step.

However, on that matter I wish to make the following statement.

Hon. Members would have seen the references in the news during these last few days to the question of Kachchativu and I am sure the House would like to have the views of the Government.

Kachchativu is a small Island some ten miles from the Island of Delft. It is uninhabited except at the time of an annual Catholic religious festival held in March when pilgrims from Ceylon traditionally visited the place. Pilgrims from India are also known to participate in the same festival. Our position has always been that we have exercised effective control over this Island, and our claim is well founded in terms of historical records. The Government of India has expressed a different view, and when this matter was raised in the Indian Parliament last week the Hon. Prime Minister of India suggested that the question of Kachchativu might be discussed between representatives of the two countries.

During our meeting in Colombo last September the Prime Minister of India and I agreed that senior

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

officials of the two countries should meet once a year alternatively in Colombo and New Delhi to review the progress of Indo-Ceylon relations in all fields and exchange views on matters of common interest. I have agreed to a proposal by the Prime Minister of India that any issues regarding Kachchativu be included within the scope of these discussions.

This House will, I think, agree that where there are differences of opinion between countries the only approach—I should say the civilized approach—is to discuss these differences and arrive at an understanding. I have every reason to believe that all the differences there are can be amicably settled.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.18 ට 1968 මාර්තු 9 වන සෙනසුරාදා අ. භා 2 වන තෙක් කල් ගියේ ය.

அதன்படி சபை பி. ப. 7.18 க்கு 1968 மார்ச் 9 சனிக்கிழமை பி. ப. 2 மணி வரை ஒத்திவைக்கப் பெற்றது.

*Adjourned accordingly at 7.18 P.M., until 2 P.M. on Saturday, 9th March 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org